# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

## 8 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

ඉස්ලාම්

8 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | කථිකාචාර්ය, ජේ.එම්. ජෙසාර් මහතා<br>ව්‍යාපෘති ප්‍රධානි |
| **විෂය කමිටුව** | : | **ආචාර්ය එම්. ඒ. එම්. ෂුක්රි**<br>අධ්‍යක්ෂ, ජාමියා නලීමියා,<br>බේරුවල.<br>**අශ්ශේක් ඒ. සී. අගාර් මොහොමඩ්**<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජමියා නලීමියා,<br>බේරුවල<br>**මවුලවි, ඒ. එල්. එම්. අලියාර්**<br>නියෝජිත සමස්ත ලංකා ජමියතුල් උලමා සභාව<br>පීඨාධිපති අරාබි හා ඉස්ලාම් අධ්‍යයන පීඨය<br>අග්නිදිග විශ්වවිද්‍යාලය.<br>**මවුලවි, එම්. එන්. ඉජිලාන්**<br>විශ්‍රාමලත් ගුරු, ප්‍රධාන ඉමාම්, කොළඹ මහ පල්ලිය,<br>කොළඹ. |
| **ලේඛක මණ්ඩලය** | : | **අශ්ශේක් ජේ. එම්. ජෙසාර්**<br>ජාතික අධ්‍යාපන ආයතනය.<br>**එම්. එච්. එම්. නාලිර්**<br>විශ්‍රාමලත් ගුරු.<br>**අශ්ශේක් එම්. එස්. එම්. බුහාරි**<br>ගුරු උපදේශක, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය.<br>**අශ්ශේක් එම්. එම්. පස්ලුර් රහ්මාන්**<br>උපගුරු, අලිගාර් මුස්ලිම් මහා විද්‍යාලය, කල්-එළිය.<br>**අශ්ශේක් එස්. ඒ. එම්. රිස්වි**<br>උපගුරු, අල්-හුදා මුස්ලිම් මහා විද්‍යාලය, රිදීගම.<br>**අශ්ශේක් එම්. එෆ්. එම්. පාහිම්**<br>ගුරු උපදේශක, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාප කාර්යාලය<br>**අශ්ශේක් එම්. එස්. එම්. අනස්**<br>උපගුරු, අලුත්ගම්වීදිය ජාතික පාසල, දර්ගා නගරය.<br>**එම්. එම්. මුබර්රම්**<br>උපගුරු බාබුස් සලාම් මුස්ලිම් විද්‍යාලය, නාඹුලුව. |
| **සෝදුපත් කියවීම** | : | **එස්.ඒ.සී.එම්. කරාමත්** |
| **පරිගණක වදන් සැකසුම** | : | **මංගලිකා විජේරත්න**<br>කළමනාකරණ සහකාර 1<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ඉස්ලාම් ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට සුදුසු වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මඟපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථයක් ලැබුව ද එය ප්‍රමාණවත් නො වේ. සාර්ථක අධ්‍යාපන ක්‍රමයක දී හිස මෙන් ම හදවත හා අත ද පෝෂණය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු ද සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ. ඒ සඳහා

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media)
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව
- ගුරු මාර්ගෝපදේශය සමඟ ඇති සංයුක්ත තැටියේ ඇතුළත් තොරතුරු
- අදාළ කරගත හැකි වෙනත් සම්පත්

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්යය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නො හැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව ඇගයීම් සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කරන්නට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂයභාර ගුරුභවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**අශ්ශේක් ජේ.එම්. ජෙසාර්,**
**කථිකාචාර්ය**

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

# විෂය නිර්දේශය

## 1.0 විෂය හැඳින්වීම

ශරීරය, දැනුම, ආත්මය යන ත්‍රිවිධ අංශයෙන් මානවයා යුක්ත ය. ඔහු පරිපූර්ණත්වය ලබා ගැනීමට නම් මේවා මනා සංකලනයකින් තම ජීවිතයට උකහාගත යුතුයි.

වර්තමාන ලෝකය විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමෙන් පුපුරා යන තත්වයක පවතී. නමුත්, මානව ජීවිතය අධ්‍යාත්මික හරයන් නොසලකා හැරීම නිසා ආත්මය පරිහානියට පත්වෙමින් තිබේ. මෙම ආත්මීය බිඳ වැටීම හරහා කනස්සල්ල, මානසික පීඩනය ඇති වී තිබේ. මින් මතුව ඇති හානිදායක තත්වය නම් මිනිස් ජීවිතය නොවටිනා භාණ්ඩයක් බවට පත්වීමයි. බුද්ධිය පසෙක තබා හැඟීම්වලට යටත්වීම නිසා ප්‍රචණ්ඩත්වය, අනෙකා නොසලකා හැරීම්, ආදිය සිදුවෙමින් පවතී. මෙම තත්වයෙන් මානවයා මුදවා ගැනීම සඳහා අධ්‍යාත්මික දැනුමෙහි අවශ්‍යතාවය පිළිබඳව විද්වතුන් හා අධ්‍යාපනඥයින් අවධාරණය කරමින් සිටී. මෙම අවශ්‍යතාවය පූර්ණය කිරීමෙහි වගකීම ආගමික විෂයයන් වෙත භාර කර තිබේ.

මෙම තත්වය තුළ අප රටේ මිනිසුන්ගේ පුද්ගලික, පවුල්, සමූහ ජීවිතය ගොඩනැගීම සඳහා ආගම් හා ඊට අදාළ දැ සම්බන්ධයෙන් අවධානය යොමුවෙමින් පවතී.

වේගයෙන් වෙනස්වෙමින් පවතින ලොවෙහි ගිලිහීයමින් පවතින මානව වටිනාකම් රැක ගැනීම සඳහා ආගමික දැනුම හා අධ්‍යාත්මික පුහුණුව ලබාදීමේ හදිසි අවශ්‍යතාවය මතුව ඇත. මේ අනුව, ඉස්ලාම් විෂයයෙහි විෂය නිර්දේශය ශිෂ්‍යයාගේ දැනුම, හැකියාව, කුසලතාව, ආකල්ප වර්ධනය කර එම ලබා ගන්නා දැනුම තම ජීවිතයට උකහාගන්නා ආකාරයට සකස් විය යුතුය යැයි අපේක්ෂිත ය.

ඉස්ලාමය ස්ථිරය. කාලයට අනුව වෙනස් නොවන්නකි. කෙසේවුවත් ෂරීයාවේ අවශ්‍යතාවය හා එහි වටිනාකම ශිෂ්‍ය හදවත් තුළ ස්ථාපිත කිරීමෙන් යහපත් වෙනසක් අපේක්ෂා කළ හැකියි. මෙම අපේක්ෂාව සඵල කරගැනීමේ ආකාරයෙන් මෙම විෂය නිර්දේශය සැකසී ඇත.

එහෙයින්, ඉතා උසස් අරමුණක් අපේක්ෂාවෙන් සකසා ඇති මෙම නව විෂය නිර්දේශය අප ගුරුවරුන් ඉතා ඕනෑකමින් අධ්‍යයනය කර ඉගැන්වීම්වල නිරතවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2. ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහය හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා  වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන්  සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන  සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණදීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## 2.2 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව :** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය :** ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් ඉගෙනීම.

   **ජෛව පරිසරය :** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා ඉගෙනීම.

   **භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

   ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## 3.0 විෂයයේ අරමුණු

(1) **අර්කානුල් ඊමාන්**

ඊමානයට අදාළ කරුණු අවබෝධ කරගෙන ඒ අනුව ජීවිතය සකසා ගැනීම.

(2) **අර්කානුල් ඉස්ලාම්**

ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම, ඒවා ඉටු කරන ආකාරය වටහාගෙන ඒ අනුව කටයුතු කිරීම.

(3) **අල්අහ්ලාක් වත්තස්කියා**

ඉස්ලාමය පවසන්නාවූ ආචාර ධර්මයන් වටහාගෙන තම ජීවිතය මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර අන් අයට ආදර්ශමවත් වීම.

(4) **අල්කුර්ආන් වස්සුන්නා**

ඉස්ලාමීය මූලාශ්‍ර වටහාගෙන ඒවායේ උපදේශයන් තම ජීවිතයට අදාළ කර ගැනීම.

(5) **අස්සීරාහ් වත්තාරීඛ්**

නබි (සල්) තුමාගේ ද කුලෆාඋර් රාෂිදීන්වරුන්ගේ ද ජීවන ක්‍රමය වටහාගෙන හා ලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා ඔවුන්ගේ ජාතික දායකත්වය සවිස්තරාත්මකව දැනගෙන අන් අයට ද කියාදීම.

(6) **අල්මුආමලාත්**

ආර්ථිකය සම්බන්ධ ඉස්ලාමීය මඟපෙන්වීම ද පවුල් ජීවිතය සම්බන්ධ ඉස්ලාමීය අදහස් ද අවබෝධ කරගෙන ඒවා තම ජීවිතයට අදාළ කර ගැනීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 1.0<br>ඊමානයේ විවිධ අංශ දැන එම පදනමින් තම ජීවිතය සකස් කර ගනියි. | අල්ලාහ් ආදර කරුණාව ඇති අයකු බව ද, උදව් පැතීමට සුදුසු අයකු බව ද අල්කුර්ආනය හා සුන්නාහ් ආධාරයෙන් අවබෝධ කර ගෙනහැර දක්වයි. | • ඊමාන් කළ යුතු දෑ (තව්හිද්, රිසාලත්, මාආද්)<br>• අල්ලාහ් කරුණාවන්තයි. | • අල්ලාහ් ආදර කරුණාව ඇති අයකු යන්න සාධක සමග ඉදිරිපත් කරයි.<br>• අල්ලාහ්ගෙන් පමණක් උදව් පැතිය යුතු යැයි පිළිගෙන ඒ අනුව හැසිරෙයි.<br>• අල්ලාහ් කරුණාවන්තයා යන්න ඔහුගේ මැවුම් උදාහරණ වශයෙන් දක්වමින් පැහැදිලි කරයි.<br>• අල්ලාහ්ගෙන් උදව් පතන ආකාරය ගෙනහැර දක්වමින් ක්‍රියාත්මක වෙයි. | 02 |
| | අලකුර්ආනය අවසාන ආගම බව ආධාර සහිතව පහදා දෙන අතර එහි සුවිශේෂ ලක්ෂණ දැන එහි උපදේශයන් අනුගමනය කරයි. | • අල්කුර්ආනය අවසන් ආගම | • අල්කුර්ආනය අවසන් ආගම යන්නට සාධක ඉදිරිපත් කරයි.<br>• අල්කුර්ආනයේ සුවිශේෂතා අවබොධ කර ඒ අනුව ක්‍රියා කරයි.<br>• අල්කුර්ආනයේ වැදගත් උපදේශයන් සමහරක් විස්තර කරයි.<br>• අල්කුර්ආනය හැම දාටම ගැලපෙන්නේ ය යන්න ඔප්පු කර පෙන්වයි. | 02 |
| | නබිවරුන්ගේ සහ රසූල්වරුන් ගේ ලක්ෂණ හා කාර්යයන් දැන වටහා ගෙන පවසයි. | • නබිවරුන් හා රසූල්වරුන් ඔවුන්ගේ ලක්ෂණ<br>• ඔවුන්ගේ යුතුකම් | • නබිවරුන්ගේ සහ රසූල්වරුන්ගේ මගපෙන්වීම සමාජයට අවශ්‍ය යන්න ගෙන හැද දක්වයි.<br>• ඔවුන්ගේ සුවිශේෂ ලක්ෂන කියා දක්වයි.<br>• ඔවුන්ගේ කාර්ය භාරයන් ලැයිස්තු ගත කරයි.<br>• ඔවුන්ගේ කාර්යයන් සහ ලක්ෂණ අතර සම්බන්ධතාවය පහදා දෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 2.0 ඉස්ලාමයේ මූලික යුතුකම් සුවිශේෂ ලක්ෂණ ඒවා ඉටු කරන ආකාර ගැන අවබෝධ කරගෙන ක්‍රියාත්මක කරයි. | **2.1**<br>ෆර්ල් වූ හා සුන්නත් වූ උසුරුම් දැන ඒවා සලාතයේ පරායනය කරයි. | • ෆර්ල් වූ හා සුන්නත් වූ උසුරුම් | • සලාතයේ ෆර්ල්වූ ද සුන්නත් වූ උසුරුම් කෙරෙන බව පෙන්වා දෙයි.<br>• සලාතයේ සුන්නත් වූ උසුරුම් ලැයිස්තු ගත කරයි.<br>• සුන්නත් වු උසුරුම්වල තේරුම වනපොත් කර කියයි.<br>• සලාතයේ දී ඒවා අඛණ්ඩව උසුරයි. | 02 |
| | 2.2<br>ෆර්ල් වූ හා සුන්නත් වූ සලාත හඳුනාගෙන ඒවා අනුගමනය කර හැසිරෙයි. | • සලාතයේ වර්ග | • සලාතයේ ෆර්ල්වූ ද සුන්නත් වූ සලාත් කොටස් දෙකක් ඇති බව උදාහරණ මගින් පෙන්වා දෙයි.<br>• ෆර්ල් වූ සලාත වගුවක වෙනම දක්වයි.<br>• ෆර්ල් වු සලාතය මෙන්ම සුන්නත් වූ සලාතය අඛණ්ඩව ඉටුකර දක්වයි.<br>• සලාතය අල්ලාහ් වෙත ළඟාවීමට ඇති මාර්ගයක් යන්න ගෙන හැර දක්වයි. | 02 |
| | 2.3<br>සලාතයේ ලෞකික හා අධ්‍යාත්මක ප්‍රයෝජන වටහා ගෙන ක්‍රමවත්ව ඉටු කරයි | • සලාතයේ ලෞකික හා අධ්‍යාත්මික ප්‍රයෝජන | • සලාතයෙන් අධ්‍යාත්මක ප්‍රයෝජන අත්වන බව ගෙන හැර දක්වයි.<br>• සලාතයෙන් ලැබෙන මෙලොව ප්‍රයෝජන ගැන ලැයිස්තු ගත කරයි.<br>• සලාතය ක්‍රමවත්ව ඉටු කරයි.<br>• සලාතයේ ප්‍රයෝජන ගෙන හැර දක්වා කතාවක් පවත්වයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | **2.4**<br>සජදාගැන දැන අදාළ අවස්ථාවල ඉටු කරයි**.** | • සජදා<br>- සහ්වු<br>- තිලාවත්<br>- සුක්ර් | • සලාතයෙහි ෆර්ල් වූ සජදා තිබෙන්නාක් මෙන් සලාතය තුළ හා සලාතයේ පිටත ද සුන්නත් වූ සජදා ද ඇති බව පෙන්වා දෙයි.<br>• සුන්නත් වූ සජදා නම්කර විස්තර කරයි.<br>• සුන්නත් වූ සජදා ඉටුකරන අවස්ථා ගෙන හැර දක්වයි.<br>• අදාළ අවස්ථාවල සුන්නත් වූ සජදා ඉටු කරන ආකාරය ආදර්ශණය කරයි. | 02 |
| | 2.5<br>රමළාන් මාසයේ සුවිශේෂතා ගැන දැන අනුගමනය කරයි. | • රමළාන් මාසයේ සුවිශේෂතා | • අනික් මාසවලට වඩා රමළාන් මාසය වැදගත් වීමට හේතු ගෙනහැර දක්වයි.<br>• හදීස් ඉදිරිපත් කර රමළානයේ සුවිශේෂතා ගෙන හැර දක්වයි.<br>• රමළානයේ ගෞරවය රැකෙන සේ කටයුතු කරයි.<br>• රමළානයේ සුවිශේෂ ක්‍රියා කැමැත්තෙන් ඉටු කරයි. | 02 |
| | 2.6<br>සකාත් සදකා පිළිබඳ අවබෝධය ලැබ අනුගමනය කරයි. | • සකාත් හා සදකා | • සකාත් සහ සදකා අතර වෙනස්කම් ගෙන හැර දක්වයි.<br>• සකාතයේ සුවිශේෂ ලක්ෂණ ගෙන හැර දක්වයි.<br>• සකාතයේ සුවිශේෂතා වටහා දෙයි.<br>• සකාත් යුතුකමක් නොවන විට සදකාව ඉටු කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | **2.7**<br>දුආ යැදීමෙහි වැදගත්කම දැන එය අනුගමනය කරයි. | • දුආ යැදීමෙහි වැදගත්කම | • දුආ යන්න අර්ථ කථනය කර දක්වයි.<br>• දුආ යැදිමේ සුවිශේෂතා ඉදිරිපත් කරයි.<br>• දුආ යදින ආකාරය කීමෙන් ද කිරිමෙන් ද ආද්ර්ශණය කරයි.<br>• දුආ යැදීමේ ප්‍රයෝජන දැන සුවිශේෂ හා පොදුදුආ වනපොත් කර තම ප්‍රාර්ථනාවල එකතු කර ගනියි. | 02 |
| 3.0<br>ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන, ඒවයේ වැදගත්කම වටහාගෙන පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද, අනුගමනය කර ආදර්ශමත්ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි. | 3.1<br>ආගමික විද්වතුන්ට ගෞරව දක්වයි | • ආගමික විද්වතුන්ට ගෞරව දක්වීම | • ආගමික විද්වතුන් සුවිශේෂව හඳුන්වයි.<br>• ආගමික උගතුන්ගේ වැදගත්කම ගෙන හැර දක්වයි.<br>• ආගමික්විද්වතුන්ට ගෞරවාන්තිකව සලකයි.<br>• ආගමික විද්වතුන්ගේ සමාජීය වැදගත්කම පහදා දෙයි. | 02 |
| | 3.2<br>දුර්ගුණවලින් වැළකී කටයුතු කරයි. | • දුර්ගුණවලින් වැළකීම | • දුර්ගුණ යන්න අර්ථකථනය කරයි.<br>• දුර්ගුණ ලැයිස්තු ගත කර දක්වයි.<br>• දුර්ගුණවලින් වැළකී කටයුතු කරයි.<br>• දුර්ගුණ නිසා පුද්ගලික ජීවිතයේ හා පොදු ජීවිතයේ ඇතිවන බලපෑම් ලියා දක්වයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 3.3<br>දරුවන් සමග සුහදව හැසිරෙයි. | • දරුවන් සමග සුහදව හැසිරීම. | • දරුවන්ගේ ගුණාංග ලැයිස්තු ගත කරන්න.<br>• දරුවන් සමග කරුණාවෙන් හැසිරෙන ආකාරය කියා දෙන්න.<br>• නබි සල් තුමා දරුවන් සමග හැසිරුණු ආකාරය ගෙන හැර දක්වයි.<br>• දරුවන්ට කරුණාව දැක්වීමට අදාළ හේතු විස්තර කර දක්වයි. | 02 |
| | 3.4<br>අනාථයන් හා වැන්දඹුවන්ට උදව් කරයි. | • අනාථයන් හා වැන්දඹුවන්ට උදව් කිරීම | • සමාජයේ දක්නට ලැබෙන දුබලයන් හඳුනා ගනියි.<br>• අනාථයන් වැන්දඹුවන් යන අය අර්ථකථනය කරයි.<br>• අනාථයන් හා වැන්දඹුවන්ගේ දුර්වලතා සොයා බලා අවශ්‍යතා ඉටුකරයි | 02 |
| | 3.5<br>පාපයන්ගෙන් වැළකී කටයුතු කරයි. | • පාපයන්ගෙන් වැළකී සිටීම. | • පව හෝ අකුසල යන්න අර්ථකථනය කරයි.<br>• පව් ලැයිස්තුවක් සකස් කරයි.<br>• පව් පිළිබඳ ඉස්ලාමීය අදහස ඉදිරිපත් කරයි.<br>• පාපී ක්‍රියා නිසා පවුල්වල ඇති වන බලපෑම් ලියා දක්වයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | **3.6**<br>සියල්ලන්ම විශ්වාසයෙන් හා අවංකත්වයෙන් යුක්තව ක්‍රියා කරයි. | • විශ්වාසයෙන් හා අවංකත්වයෙන් ක්‍රියා කිරීම | • අවංකත්වය සහ විශ්වාසය යන්න අර්ථකථනය කරයි.<br>• පවුල් හා සමාජ ජීවිතයේ දී අවංකත්වය සහ විශ්වාසිභාවයේ වැදගත්කම ගෙන හැර දක්වයි.<br>• අවංකත්වයෙන් හා විශ්වාසයෙන් යුක්තව ජීවත් විය යුතුය යන්නට සාධක ඉදිරිපත් කරයි.<br>• විශ්වාසය හා අවංකත්වය අඩුවන විට සමාජයේ ඇතිවන බලපෑම පැහැදිලි කරයි. | 02 |
| 4.0<br>ඉස්ලාමයේ මූලාශ්‍ර ගැන පැහැදිලි අවබෝධයක් ලැබ ඒ අනුව තම ජීවිතය සකස් කර ගනියි. | 4.1<br>අල්කුර්ආනය පාරායනය කිරීමේ වැදගත්කම ගැන දැන දිනපතා එය නිවැරදිව පාරායනය කරයි. | • තිලාවතුල් කුර්ආන්නයේ වැදගත්කම | • තිලාවතුල්කුර්ආන් යන්න පැහැදිලි කරයි.<br>• තිලාවතුල් කුර්ආනයේ පිළිවෙළ දැන පාරායනය කරයි.<br>• තිලාවතුල්කුර්ආන්හි අධ්‍යාත්මක හා ලෞකික ප්‍රයෝජන ලැයිස්තු ගත කරයි.<br>• අල්කුර්ආනයේ තමා දන්නා කොටස් අන් අයට උගන්වයි. | 02 |
| | 4.2<br>අල්කුර්ආනය කුඩා සුරාවන් නිවැරදිව පාරායනය කර තේරුම වටහා ගෙන හැසිරෙයි. | • සූරා අල් මාඋෟන් | • සූරා අල් මාඋෟන් හි පද අර්ථය කියවයි.<br>• ආගම සහ කියාමා දිනය බොරු කරන්නා ගැන දැන අන් අයට ද කියයි.<br>• මිනිසුන් සමග යහමින් කටයුතු කරන ආකාරය ගැන දැන අන් අයට ද ගෙන හැර දක්වයි.<br>• සූරා මා උෟන් හි තේරුම දැන පාරායනය කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 4.3<br>අල්හදීසුල් කුද්සි, අල් හදීසුල් නබවි යන්නට උදාහරණ ඉදිරිපත් කරයි. | • අල්හදීසුල් කුද්සි, අල් හදීසුල් නබවි | • හදීස් වර්ග දෙක වෙන්කොට පැහැදිලි කරයි.<br>• හදීස් කුද්සි සඳහා උදාහරණ දක්වයි.<br>• හදීස් නබවි සමහරක් වනපොත් කර අන් අයට ද පවසයි.<br>• තමන් උගත් හදීස්වල තේරුම දැන ඒවා ක්‍රියාවට නංවයි. | 02 |
| | 4.4<br>මව්ලූද බිහිවීමට අදාළ හේතු දැන ඒවා භාවිතයෙන් වැළකී කටයුතු කරයි. | • මව්ලූද බිහිවීමට අදාළ හේතු | • මව්ලූද යනනෙහි අදහස ඉදිරිපත් කරයි.<br>• මව්ලූදබිහිවීමට හේතු ගෙන හැර දක්වයි.<br>• මව්ලූද හදීස් සඳහා උදාහරණ කියා දක්වයි.<br>• ඒවයේ නරක ආනිසංශ ගෙනහැර දක්වා ඒවා ගැන සාකච්ඡා කිරීමෙහි හා ඇසීම සම්බන්ධයෙන් පරිස්සමින් කටයුතු කරයි. | 02 |
| | | | | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 5.0<br>නබිවරුන්, සහාබාවරුන්, පෙරසිටි යහගැත්තැන් ආදින්ගේ ජීවන ක්‍රමය උගෙන ඔවුන්ගේ ආදර්ශය අනුව ජීවත් වෙති. | **5.1**<br>නබිවරුන්ගේ ආදර්ශයන් අවබෝධ කොටගෙන පවසයි. | • මුහම්මද් (සල්) තුමා<br>- නුබුවුවත්<br>- මිහ්රාජ් | • මුහම්මද් (සල්) තුමාගේ ජීවිතයේ සිදු වූ වැදගත් සිද්ධීන් සමහරක් ගැන ගෙන හැර දක්වයි.<br>• එතුමන්ට නුබුව්වතය ලැබුණු ආකාරය ගැන පවසයි.<br>• මිහ්රාජ් සිද්ධිය විස්තර කර කියයි | 02 |
| | 5.2.1<br>උම්මහාතුල් මුඃමිනින්වරුන්ගේ ද සහබාවරුන්ගේ ද ජීවිත කතාව ඉගෙන පූර්වාදර්ශ වශයෙන් සළකා ක්‍රියා කරයි. | • උම්මහාතුල් මුඃමිනින්වරු<br>- ෂව්දා රළි,<br>- ජුවරියා රළි,<br>- ෂෆියියා රළ | • උම්මහාතුල් මුඃමිනින්වරුන් වන ෂව්දා රළි, ජුවරියා රළි, ෂෆියියා රළි ආදින්ගේ ජීවිත රටාව විස්තර කරයි.<br>• ඔවුන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා ගෙන හැර දක්වයි.<br>• ඔවුන්ගේ පූර්වාදර්ශයන් අනුගමනය කරයි. | 02 |
| | 5.2.2<br>උම්මහාතුල් මුඃමිනින්වරුන්ගේ ද සහාබාවරුන්ගේ ද ජීවිත කතාව ඉගෙන පූර්වාදර්ශ වශයෙන් සළකා ක්‍රියා කරයි. | • සහාබාවරුන්<br>(ඉබ්නු අබ්බාස්රළි<br>ඉබ්නු උමර් (රළි), ඉබ්නු සුබයිර් (රළි), ඉබ්නු මස්ඌත් (රළි) | • උබාතලා යනුවෙන් හඳුන්වනු ලබන ඉබ්නු අබ්බාස්රළි ඉබ්නු උමර් (රළි), ඉබ්නු සුබයිර් (රළි), ඉබ්නු මස්ඌත් (රළි) ආදීන්ගේ ජීවිත කතාව ගෙන හැර දක්වයි.<br>• ඔවුන්ගේ පෞද්ගලිකත්වය පහදා දෙයි.<br>• ඔවුන්ගේ පූර්වාදර්ශ අනුගමනය කරයි. | 02 |
| | 5.3<br>ඉබ්රාහිම් (අලයි) තුමාගේ ජීවිතය පූර්වාදර්ශය වශයෙන් වටහා ගෙන ජීවිතය සකස් කර ගනියි. | • ඉබ්රාහිම් (අලයි) තුමාගේ ජීවිතය | • නබි ඉබ්රාහිම් (අලයි) තුමා හඳුන්වා දෙයි.<br>• එතුමා සතුව පැවැති සුවිශේෂ ගුණාංග පෙන්වා දෙයි.<br>• එතුමාට සහ නබි සල් තුමාට අතර පැවැති සම්බන්ධය මක්කම සමග අතර පැවැති සම්බන්ධය ගෙන හැර දක්වයි.<br>• එතුමන්ගේ දහ්වා කටයුතුවල දී විඳි වේදනාව සහ මුහුණ දුන් ප්‍රශ්න ගැන දැන එතුමන්ගේ පූර්වාදර්ශය අනුගමනය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 6.0<br>ඉපැයීම පිළිබඳ ඉස්ලාමීය ඉගැන්වීම් සහ පවුල් ජීවිතය පිළිබඳ ඉස්ලාමීය අදහස අවබෝධ කරගෙන ඒවා තම ජීවිතයේ පිළිවෙළින් අනුගමනය කරයි. | 6.1<br>අජ්නබි, මහ්රම් පිළිබඳ සීමාවන් අනුගමනය කර කටයුතු කරයි. | • අජ්නබි, මහ්රම් පිළිබඳ සීමාවන් | • අජ්නබි මහ්රම් යන්නෙහි තේරුම පැහැදිලි කරයි.<br>• සමාජයේඅජ්නබි මහ්රම් අතර වෙනස ඇතිවන්නේ කෙසේ ද යන්න පහදාදෙයි.<br>• අජ්න බිහා මහ්රම් යන අයගේ ලැයිස්තුවක් සකස් කරයි.<br>• විවාහ කර ගැනීම වුලූහ්බිදීම වැනි අවස්ථාවල දී ඉස්ලාමීය සාරධර්ම සාධක සමග පවසයි. | 02 |
| 7.0<br>එක් එක් කරුණ සම්බන්ධයෙන් ඉස්ලාමයට සුවිශේෂ වූ දෘෂ්ටියක් ඇති බව වටහා ගෙන ඒ අනුව සියල්ල දෙස බලා ගවේෂණය කරයි. | 7.1<br>සමාජ සේවා කටයුතුවලට සහභාගි වීමේ වැදගත්කම වටහාගෙන ඒ අනුව ඒවාට දායකවෙයි. | • සමාජ සේවා කටයුතුවලට සහභාගි වීම | • සමාජ සේවා කටයුතු යන්න වටහා දෙයි.<br>• සමාජසේවා කටයුතුවල වැදගත්කම පෙන්වා දෙයි.<br>• සමාජ සේවා කටයුතු සිදුකිරීමේ අවශ්‍යතාවයී. අවධාරණය කර කතා කරයි. | 02 |
| | 7.2<br>පොදු දේපළ සුරක්ෂිතව රකියි. | • පොදු දේපළ සුරැකීම | • පොදු දේපළක් යන්න අර්ථකථනය කරයි.<br>• පොදු දේපළ වර්ග කර දක්වයි.<br>• පොදු දේපළ සුරැකීම සැමගේම යුතුකමක් බව පිළිගනියි. | |

## 1.7 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

අධ්‍යාපනයේ දී ආගම විෂය මූලික ස්ථානයක් උසුලයි. මෙම විෂය ශිෂ්‍යයා ඉමහත් කැමැත්තක් දක්වන ආකාරයට ද විෂය කරුණු සිත තුළ තැන්පත් කිරීමට ද ඉගෙන ගත් දෑ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ආකාරයේ දැනුමක් ලබා දීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සමත්විය යුතුයි. එමඟින් ශිෂ්‍යයාගේ අධ්‍යාත්මය, චින්තනමය, සන්නිවේදන, සමාජ හැකියා වර්ධනය කළ යුතු ය.

ආගමික විෂයය ඉගැන්වීම තුළින් කරුණු මතක තබා ගැනීම හෝ දැනුම පමණක් ලබාදී විභාගය සමත් කිරීම ප්‍රමාණවත් නොවේ. එම දැනුම ශිෂ්‍යයා තුළ පැහැදිලි වෙනසක් ඇති කළ යුතුය . ඒ සඳහා අවශ්‍යය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය දැන සිටීම ගුරුවරයාගේ වගකීම වේ.

මෙහිදී වයස, අත්දැකීම්, පරිසරය, කැපවීම ආදිය ගැන සැලකිලිමත්වීම අගනේය

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය ශිෂ්‍යයා මූලික කරගෙන සිදුවිය යුතු බව අවධාරණය කර තිබේ. මෙම ක්‍රමවේදය තුළින් ශිෂ්‍යයාගේ දක්ෂතා හා හැකියා වර්ධනය කළ යුතුයි. මෙහිදී ගුරුවරයා තම ශිෂ්‍යයාගේ රුචි-අරුචිකම්, දක්ෂතා දුර්වලතා ආදිය තේරුම් ගෙන අවශ්‍යය අවස්ථාවල ප්‍රශංසාද අවවාදයන් ද ලබා දිය යුතු ය.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද කීපයක්

- සාකච්ඡා
- කණ්ඩායම් ක්‍රියාකාරකම්
- සහභාගීත්ව ක්‍රමය
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
- තොරතුරු රැස් කිරීමේ ක්‍රමය
- කථාවක් ආශ්‍රයෙන් පැහැදිලි කිරීමේ ක්‍රමය (බුද්ධි කලම්බන ක්‍රමය)
- චින්තනය අවදි කිරීමේ ක්‍රමය
- දේශන ක්‍රමවේදය

මෙම ක්‍රමයන්ට අනුකූලව පාඩමට හා අවස්ථාවට ගැලපෙන ආකාරයෙන් තෝරා ගැනීම් කළ හැකි ය.

ශිෂ්‍යයාට ඉගෙනුම් උපකරණ වශයෙන් ඉස්ලාමීය සඟරා, පුවත්පත්, ආශ්‍රිත ග්‍රන්ථ, චිත්‍ර ආදිය භාවිත කළ හැකි ය. තවද විෂය රසවත්ව ඉගැන්වීම සඳහා අන්තර්ජාලය ආදිය ද භාවිත කළ හැකි ය.

තවද පාසලේ පැවැත්වෙන ආගමික, සංස්කෘතික වැඩසටහන් ආදියෙහි වඩාත් සුදුසු ඒවාට සිසුන් යොමු කළ හැකි ය.

සිසුන් ඉස්ලාම් විෂය කැමැත්තෙන් ඉගෙන එහි ආදර්ශයන්ට අනුව ජීවත්වෙමින් යහපත් පුරවැසියෙකුවීමේ කාර්යභාරය ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය මඟින් ගුරුවරුන් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1.8 පාසල් ප්‍රතිපත්තිය හා වැඩපිළිවෙල

අප රටේ අධ්‍යාපන ක්‍රමවේදය දැනුම පුළුල් කිරීම හැකියාව වර්ධනය කිරීම ආකල්ප වර්ධනය කිරීම අරමුණු කරගනිමින් නිර්මාණය වී ඇත

ඉස්ලාමය ජීවන ක්‍රමයක් වන හෙයින් ඒ අනුව පාසල් පරිසරය තුළ ආකල්පමය වෙනස්කම් නිවැරදිව ක්‍රියා කිරීමේ දැනුම හා ඒ සඳහා පුහුණුව ලබා දිය යුතු යැයි අපේක්ෂිතය. ඒ සඳහා පහත දැක්වෙන ක්‍රම අනුගමනය කළ හැකිය

- ආගමික ආචාරධර්මයන් ඉස්මතු වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන චාරිකා ආදිය මගින් ආගමික හා සංස්කෘතික වටිනාකම්වලින් යුත් දෑ නැරඹීමට යෑම.
- නව වසරේ පළමු මස වන මුහර්රම් මස පිළිගැනීම, රමලාන් මස පිළිගැනීම මීලා-දුන්නබි උත්සවය ආදිය නිමිති කොට සිසු දක්ෂතා මතුවන වැඩසටහන් නිර්මාණය කිරීම.
- නිර්මාණශීලී හැකියාවන් සහිත සිසුන්ගේ එම හැකියාවන් ඔප් නැංවීම සඳහා සමිති පැවැත්වීම හා ඔවුන්ගේ දායකත්වය උපරිමයෙන් ලබා ගැනීම.
- පාසල් පරිසරය පිරිසිදුව තබා ගැනීම අලංකාර කිරීම නඩත්තු කිරීම ආදිය සඳහා ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් යෙදවීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් දිනයන් ඉස්ලාමීය දෘෂ්ටිකෝණයට අනුව සැමරීමට කටයුතු කිරීම.
- ඉස්ලාමයේ භාවිතයන් යථාර්ථවාදීව පැහැදිලි කිරීම හා ඒ අනුව කටයුතු කිරීමට පෙළඹවීම.

මෙම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා පාසලේ විදුහල්පති ගුරුවරු සිසුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහාය දිය යුතුය. එමෙන්ම මේ සඳහා අවශ්‍යය භෞතික හා මානව සම්පත් තිබීමද වැදගත් ය.

තවද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සාර්ථක කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා දේශන හා වැඩමුළු ගුරුවරුන් වෙනුවෙන් සංවිධානය කිරීමෙන් උසස් ප්‍රතිඵල අත්කර ගත හැකි ය.

එමෙන්ම ඉස්ලාම් විෂයය වෙනුවෙන් වෙන්වී ඇති කාල පරිච්ඡේද ප්‍රමාණය සැලකිල්ලට ගෙන ශිෂ්‍යයාට උපරිම ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට ගුරුවරයා පාඩම සකසා ගත යුතු ය. මෙම විෂයය වෙනුවෙන් ඉස්ලාම් විෂයය පුහුණු ගුරුවරු ඉස්ලාමීය ෂරීආ අධ්‍යාපන ආයතන මගින් සුදුසුකම්ලත් අය හෝ ඉස්ලාම් සංස්කෘතිය තම උපාධිය වෙනුවෙන් එක් විෂයයක් ලෙස හැදෑරූ උපාධිධාරීන් තෝරා ගැනීමෙන් වඩා ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගත හැකි ය.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම මඟින් ඉස්ලාමීය දැනුම, පැහැදිලි චින්තනය, ආචාර ධාර්මිකව ජීවත්වීම හා අවංක ගුණගරුක බවින් යුත් සමාජ ජීවියෙක් බිහි කිරීමට අපේක්ෂිත ය.

## 1.9. ඇගයීම හා තක්සේරු කිරීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාදාමයන් මඟින් ශිෂයයාගේ විෂය දැනුම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය වශයෙන් ඇගයීම හා තක්සේරුකරණය යොදා ගැනේ මෙය සෑම ඒකකයක් අවසානයේදී ම සිදු කළ යුතු එක් ක්‍රියාදාමයකි

ඉස්ලාම් පාඩම මඟින් ශිෂ්‍යයාගේ හැසිරීමේ, ආගමික වතාවත්වල නිරතවීමේ, සමාජය සමඟ හැසිරෙන ආකාරයේ සිදුව ඇති වෙනස්වීම් අගයනු ලැබේ. මෙය පංති කාමරය තුළ හා ඉන් පරිබාහිරව සාධන මට්ටමට ළඟා වී ඇත්දැයි විධිමත් හෝ අවිධිමත් ආකාරයෙන් ඇගයීමට ලක් කළ හැකි ය.

පාඩම ඇරඹීමට පෙර ඇගයීමක් සිදුකිරීමෙන් දුර්වල සිසුන් හඳුනාගෙන ඒ සඳහා විශේෂ ඉගැන්වීම් ක්‍රමයක් වහාම ආරම්භ කිරීමෙන් ප්‍රතිඵල අත්කර ගත හැකි ය. ඇගයීම් උපකරණය එකම අයුරින් භාවිතා නොවනු ඇත. පාඩම සම්බන්ධ ඇගයීම් ඉගෙනුම්-ඉගැනුම් ක්‍රියාවලිය මාස අවසානයේ, වාර අවසානයේ වර්ෂාවසනයේ වාචික හෝ ලිඛිත එසේ නොමැති වුවහොත් ක්‍රියාකාරකම් වශයෙන් සිදු කළ හැක. මේ සඳහා සුදුසු ආකාරයට නියැදි හා ක්‍රමවේදයන් පූර්වයයෙන්ම සකසා තිබීම අත්‍යාවශ්‍යයයි

මීට අමතරව සූරා,  හදීස්, දුආ ආදිය නිවැරදිව උච්ඡාරණය කරන්නේ ද කට පාඩම් කරන්නේ ද ඒවා පාරායණය කළ යුතු අවස්ථාවල පාරායණය කරන්නේ ද? යන්නද ඇගයීමට ලක් කළ යුතු ය. මේ සඳහා අවශ්‍ය ඇගයීම් උපකරණ සැකසීමට ගුරුවරයාට හැකිවිය යුතුය.

ඉස්ලාම් විෂයයෙහි ආකල්ප සම්බන්ධ ඇගයීම් කිරීම අවශ්‍ය ය. විෂය නිර්දේශයට ඇතුළත් අල්-කුර්ආන් සූරාවන්, අවස්ථානෝචිත දුආ ප්‍රාර්ථනාවන් ඇගයීමට ලක් කිරීමේදී අරාබි අක්ෂරයන් උච්ඡාරණය කරන ආකාරය, වනපොත් කර තිබීම ආදිය නිරීක්ෂණය කළ යුතුය

කෙසේ වුවද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඇගයුම් හා තක්සේරුකරණය ඉතා වැදගත් ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක බව මනින මිනුම් දණ්ඩ එය වනු ඇත.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0 : ඊමානයේ විවිධ අංශ දැන එම පදනමින් තම ජීවිතය සකස්කර ගනියි.**

**නිපුණතා මට්ටම 1.1 : අල්ලාහ් ආදර කරුණාව ඇති අයකු බව ද, උදව් පැතීමට සුදුසු අයකු බව ද අල්කුර්ආනය හා සුන්නාහ් ආධාරයෙන් අවබෝධ කර ගෙනහැර දක්වයි.**

**කාලච්ඡේද** : 2

**ඉගෙනුම් ප්‍රතිඵල** :

- අල්ලාහ් ආදර කරුණාව ඇති අයකු යන්න සාධක සමග ඉදිරිපත් කරයි.
- අල්ලාහ්ගෙන් පමණක් උදව් පැතිය යුතු යැයි පිළිගෙන ඒ අනුව හැසිරෙයි.
- අල්ලාහ් කරුණාවන්තයා යන්න ඔහුගේ මැවුම් උදාහරණ වශයෙන් දක්වමින් පැහැදිලි කරයි.
- අල්ලාහ්ගෙන් උදව් පතන ආකාරය ගෙනහැර දක්වමින් ක්‍රියාත්මක වෙයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස් :**

**පියවර 1** :

- සූරාහ් අල් කහ්ෆ් හි 32 සිට 44 තෙක් ඇති වාක්‍යවල සඳහන්වන යහළුවන් දෙදෙනකුගේ සිද්ධිය කතාවක් වශයෙන් කියා එයින් ලැබෙන ආදර්ශයන් එකක් හෝ දෙකක් සිසුන් ලවා කිරීමට සැලැස්වූ පසු පාඩම අරඹන්න.
- මෙම දුවාවෙහි අදහස සලාතය සමග ද ජීවිතය සමග ද සම්බන්ධකර පහදා දෙන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- ඊමාන්හි ප්‍රධාන අන්තර්ගතය තව්හීද්, රිසාලත්, මආද් යනාදියයි.
- තව්හීද් මැවුම්කරුවා ගැනත්, රිසාලත් මගපෙන්වීම ගැනත්, මආද් ජීවිතයේ ඵලයන් ගැනත් පහදා දෙන්නේ ය.
- ජීවිතයේ ජය පරාජය තීරණය කරන්නේ විශ්වාසයයි.
- නිවැරදි විශ්වාසයන් පදනමින් ජීවිතය සකස් කර ගන්නේ නම් මිනිසා පරාජයට පත්වන්නේ නැත.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මගපෙන්වන්න.

- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරි පත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද, අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු  අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- සැඟවුණු දේ විශ්වාස කිරිම ඊමානය වන්නේ ය.
- සෑම මිනිසෙකුම සැඟවුණු කරුණු පිළිබඳව තමා සතු විශ්වාසය මත තම ජීවිතය සකස් කර ගන්නේ ය.
- සැඟවුණු කරුණු පිළිබඳව ඇතිවන සියලු ප්‍රශ්නවලටම පැහැදිලි  පිළිතුරු ඉස්ලාම් සපයන්නේ ය.
- අල්ලාහ්ගේ නම්(අස්මා), ලක්ෂණ (සිෆාත්), ලැබීම (කද්ර්) ආදිය ගැන තව්හීදය පැහැදිලි  කරයි.
- මිනිසා ඍජු මාර්ගයේ ජීවත් වීම සඳහා අල්ලාහ්ගේ මගපෙන්වීම ගැනත්, එසේ මගපෙන්වීම සඳහා යවන ලද නබිවරු රසූල්වරු ගැනත් රිසාලත් යන මාතෘකාව පැහැදිලි  කරයි.
- මිනිසා මෙලොව ජීවිතයේ දේව මගපෙන්වීම පිළිගැනීම සහ ප්‍රතික්ෂේප කිරිම මආද් යන මාතෘකාව පැහැදිලි කරයි.
- මැවුම්කරුවා වන අල්ලාහ් ගැනද ඔහුව නැමදිය යුත්තේ කෙසේ ද යන්නත් නිවැරදිව දැන ගත හැක්කෙ රිසාලතය මගින් පමණි.
- දේව මගපෙන්වීම පිළිගෙන ඒ අනුව ජීවත් වන මිනිසාට මතු ජීවිතයේ දී සුපසන් වූ ස්වර්ගය තෑගි වශයෙන් ලබන්නේ ය.
- "ඊමාන් කොට යහක්‍රියාවල යෙදෙන්නන් ට නිතර ජල ධාරා ගලායන ස්වර්ගය ඇත යැයි ශුභාරංචිය පවසන්න (2:25).
- දේව මගපෙන්වීම ප්‍රතික්ෂේප කර සිය චිත්ත ආශාව අනුව ජීවත් වූ අයට වේදනාව ගෙන දෙන නිරය තෑගි වශයෙන් ලැබෙන්නේ ය.
- "පව් කළ අය යන ස්ථානය නිරය වන්නේ ය. ඔවුන් එයින් මිදෙන්නට වෑයම් කරන සෑම අවස්ථාවකම නැවැතත් එහිම දමනු ලබන්නෝ ය. තවද, ඔබ අසත්‍ය බව පැවැසූ නිරයේ ගින්න රස විඳින්න'' යැයි ඔවුනට කියනු ලබෙන්නේය.''

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1:** **විශ්වාසය ජීවිතය යන ආකාරයෙන් ඊමාන්හි අන්තර්ගතය විශ්වාස කරන්නා සහ විශ්වාස නොකරන්නා යන දෙදෙනාගේ ජීවිතය කෙසේ වෙනස් වී පවති ද යන්න පැහැදිලි කරන්න.**

**කණ්ඩායම2:** **අල්ලාහ්ගේ කරුණාව හා සම්බන්ධ ඔහුගේ නම් හා ලක්ෂණ ඒවායේ තේරුම් සමග සොයා දැන ලියන්න.**

**කණ්ඩායම 3:** **සුමර් යන පරිච්ඡේදයේ 71,72 වා වාක්‍ය සොයා බලා ඒවායේ තේරුම ලියූ පසු කාෆිර්වරු නිරයට ගෙන යන කාර්යය යන්න ලියා දක්වන්න.**

**කණ්ඩායම 4:** **සුමර් යන පරිච්ඡේදයේ 73,74 වා වාක්‍ය සොයා බලා ඒවායේ තේරුම ලියූ පසු මූඃමින් වරු ස්වර්ගයට කැඳවා ගෙන යන ක්‍රියාව කුමක් ද කියා ලියා දක්වන්න.**

**නිවසේ පරිසරයෙන්:**

**අල්ලාහ් කෙරෙහි පවතින විශ්වාසය හේතුවෙන් තම කළ කිසියම් යහ ක්‍රියාව මතක් කර එය විස්තරාතමකව ලියගෙන එන ලෙස දන්වන්න.**

**නිපුණතාව 1.0 : ඊමානයේ විවිධ අංශ දැන එම පදනමින් තම ජීවිතය සකස්කර ගනියි**

**නිපුණතා මට්ටම 1.2: අලකුර්ආනය අවසාන ආගම බව ආධාර සහිතව පහදා දෙන අතර එහි සුවිශේෂ ලක්ෂණ දැන එහි උපදේශයන් අනුගමනය කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **අල්කුර්ආනය අවසන් ආගම යන්නට සාධක ඉදිරිපත් කරයි.**
- **අල්කුර්ආනයේ සුවිශේෂතා අවබොධ කර ඒ අනුව ක්‍රියා කරයි.**
- **අල්කුර්ආනයේ වැදගත් උපදේශයන් සමහරක් විස්තර කරයි.**
- **අල්කුර්ආනය හැම දාටම ගැලපෙන්නේ ය යන්න ඔප්පු කර පෙන්වයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- පහත සඳහන් අවස්ථාව හැඟීම්බරව සිසුන්ට ඉදිරිපත්කර ඔවුන් තුළ බුද්ධි කළම්බනයක් ඇති කරන්න.

  "නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමා තම වයෝවෘද්ධ හැදූ මව වන උම්මු අයිමන් තුමියගේ සුව දුක් විචාරීම සඳහා යන අයකු වූහ. නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමාගේ වෆාතයෙන් පසුව එතුමියගේ සුව දුක් විචාරීම සඳහා එතුමිය හමුවීමට ගිය උමර් (රළි) තුමා සහ අබුබක්කර් රළි දෙස බලා එතුමිය ඉකි ගසා අඩන්නට වූවා ය. නබි තුමාගේ වියෝව නිසා ඇය අඩන බව සිතූ සහබාවරු දෙදෙනා ඇය සනසන්නට වූහ. එවිට උම්මු අයිමන් තුමිය මා අඬන්නේ නබිතුමාගේ වියෝව නිසා නොව එතුමාගේ වියෝව සමග වහී පහළවීම නැවතුන නිසා මම අඩන්න වූයේ මියි කීවා ය. මෙය කණ වැකුන සහාබාවරුන්ගේ දෑස් ද කඳුළින් බර විය.

  මේ සිද්ධිය පවසා අල්කුර්ආනය අල්ලාහ්ගේ අවසාන වහී යන්න සිසුන්ට අවධාණය කරන්න.

- පහත සඳහන් කරුණු කේන්ද්‍රගත කොට සාකච්ඡා පවත්වන්න.
- මිනිසුන් යහමග යැවීම සඳහා අල්ලාහ් කලින් කලට ආගම් පහළ කළේ ය.
- එසේ පහළ කළ ආගම් පෙළේ අවසානය ඉස්ලාම් වන්නේ ය.
- අල්කුර්ආනය අවසාන ආගම යන්නට සාධක රැසකි.
- අල්කුර්ආනය අවසාන ආගම යැයි විශ්වාසයෙන් යුක්තව ක්‍රියා කිරීම ඊමානයේ අංගයකි.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතු කිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- මිනිසා යහමග යැවීමට අල්ලාහ් සෑම කාලයේ ම ඒ ඒ සමාජයට ගැලපෙන ආගම් සහ සුහුෆු පහළ කර ඇත.
- මෙසේ පහළ කරන ලද ආගම් අතර ආගම් හතරක නම් අල්කුර්ආනයේ දැක්වේ.
- පහළ කරනු ලබන ආගම් ඒව පහළ කරන ලද කාලයේ ජිවත්වූ ජනතාවගේ දැනුම ජීවන ක්‍රමය ආදිය අදාළවන සේ ඔවුන්ට මග පෙන්වීය.
- අල්ලාහ් පහළ කළ සියළු ආගම්වලම විශ්වාසය හා සම්බන්ධ කරුණු පොදු ඒවා වූ අතර ක්‍රියාකාරකම් වලට අදාළ කරුණු(ෂරිආ) කාලය හා පරිසරයට අදාළ වනසේ වෙනස් ව ද පැවැතිණි.
- අල්ලාහ් පහළ කළ ආගම් අතර අවසාන ආගම අල්කුර්ආනය වන්නේ ය.
- අල්කුර්ආනය අවසාන ආගම යන්නට සාධක රැසකි.
- අල්කුර්ආනය මුළු මිනිස් සමාජයටම පොදුවේ පහළ කරනු ලැබීම.
- මිනිස් ජීවිතයට අවශ්‍ය සියල්ල අල්කුර්ආනයේ අඩංගුව තිබීම.
- අල්කුර්ආනයේ දේශනා සියලු ජනතාවටම පිළිගත හැකි පරිදි මධ්‍යස්ත ස්වභාවයෙන් යුක්ත වීම.
- අල්කුර්ආනයේ ආශ්චර්යමත් බව දැනුම හා සම්බන්ධ එකක් වීම.
- පහත සඳහන් අල්කර්ආන් වාක්‍ය අල්කුර්ආනය අවසාන ආගම යන්න සහතික කරන්නේ ය.
- "අපය අල්කුර්ආනය පහළ කළේ අපය අල්කුර්ආනය ආරක්ෂා කරන්නේ" අන් ආගම්වලට මෙවැනි සහතිකයක් දී නොමැත.

- අද ඔබගේ ආගම ඔබට මම සම්පූර්ණ කළෙමි. මගේ දායදය ද සම්පූර්ණ කළෙමි. ඉස්ලාමය ඔබගේ ආගම බව පිළිගත්තෙමි. (5:3) සියලු නබිවරුනටම දේශනා කළ ඉස්ලාම් අවසාන ආගම වන ඉස්ලාම් අල්කුර්ආනය මගින් පරිපූර්ණ කෙරෙන්නේ ය යන්නය මෙයින් අදහස් කරයි.

- තවද මීට පෙර පහළ කරන ලද ආගමික ග්‍රන්ථ මෙමගින් සත්‍ය කෙරෙන්නේය. තවද ජනතාවට යහමග පෙන්වීම සඳහා මෙයට පෙර තව්රාතය සහ ඉන්ජීලය ඔහු පහළ කර ඇත. සත්‍යය හා අසත්‍යය වෙන්කර දක්වන මෙම ෆුර්කානය ද ඔහු පහළ කර ඇත." (3:3)

- අල්කුර්ආනය පහළ කරනු ලැබ මෙතෙක් ශත වර්ෂ 15ක්ම ගතවී ඇතත් තවත් ආගමක් පහළ කරනු ලැබීමට සාධකයක් තවම ලැබී නැත.

- අල්කුර්ආනයේ අන්තර්ගතය මෙසේ වර්ග කළ හැකි ය.

  1. විශ්වාසය හා සම්බන්ධ කරුණු
  2. වන්දනා මාන
  3. නීතිරීති
  4. ආචාර ධර්ම
  5. අත්දැකීම් ලබාදෙන ඉතිහාසයන්

- අල්කුර්ආනය සෑම කාලයටම සුදුසුය යන්නට සාධක රැසකි.
- අල්කුර්ආනයේ අදහස් කාලයෙන් පරණ නොවන ඒව වීම.
- අල්කුර්ආනය පවසන විද්‍යාත්මක සත්‍යයන් කාලයෙන් සැබෑ කෙරෙන්නේ ය.
- අල්කුර්ආනයේ නීති සෑම මිනිසකු විසින්ම පිළිගත හැකි තත්වයක පවතින්නේය.
- අල්කුර්ආනය මුළුමනින්ම මධ්‍යස්ථ ස්වභාවයෙන් යුක්තය.
- එහි දේශනා මිනිස් ජීවිතයේ සියලු අංශයන්ටම මග පෙන්වන්නේ ය.
- අල්කුර්ආනයේ අදහස්වල කිසිම පරිකල්පනාවක් මිශ්‍රව නොමැත.
- අල්කුර්ආනය අවසාන ආගම වශයෙන් එයකෙරෙහි අපගේ යුතුකම් බොහෝය.
- එය උසුරිය යුතු ය.
- අවබෝධ කරගන්නට වෑයම්කළ යුතු ය.
- එහි දේශනාවන්ට අනුව පිවත් විය යුතු ය.
- අන් අය එය කෙරෙහි කැඳවිය යුතු ය.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනිම් ඵල ඇගැයිම සඳහා සදුසු ඇගයීම් නිර්ණයක සකස් කරගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1:** **අල්කුර්ආනය අවසාන ආගම යන්නට සාධක අල්කුර්ආන් වාක්‍ය තුනක් තර්කානුකූල සාධක සොයා ලියන්න.**

**කණ්ඩායම2:** **අල්කුර්ආනය හැම දාටම ගැලපෙන්නකි යන්නට උදාහරණ තුනක් දක්වා ඔප්පු කරන්න.**

**කණ්ඩායම 3:** **අල්කුර්ආනයේ අන්තර්ගතයන් පහක් සඳහන්කර එක එකට උදාහරණයක් බැගින් සොයා ලියන්න.**

**කණ්ඩායම 4:** **අල්කුර්ආනය කෙරෙහි අපට ඇති වගකීම් කෙටියෙන් පැහැදිලි කරන්න.**

**නිවසේ පරිසරයෙන්:** **දෙමව්පියන්ගේ මගපෙන්වීම යටතේ අල්කුර්ආනය අඛණ්ඩව උසුරිමට යොමු කරන්න.**

**නිපුණතාව 1.0 : ඊමානයේ විවිධ අංශ දැන එම පදනමින් තම ජීවිතය සකස්කර ගනියි.**

**නිපුණතා මට්ටම 1.3 : නබිවරුන්ගේ සහ රසූල්වරුන්ගේ ලක්ෂණ හා කාර්යයන් දැන වටහා ගෙන පවසයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **නබිවරුන්ගේ සහ රසූල්වරුන්ගේ මගපෙන්වීම සමාජයට අවශ්‍ය යන්න ගෙන හැද දක්වයි.**
- **ඔවුන්ගේ සුවිශේෂ ලක්ෂණ කියා දක්වයි.**
- **ඔවුන්ගේ කාර්ය භාරයන් ලැයිස්තු ගත කරයි.**
- **ඔවුන්ගේ කාර්යයන් සහ ලක්ෂණ අතර සම්බන්ධතාව පහදා දෙයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- පහත සඳහන් ඡේදය සිසුවකු ලවා කියවීමට සළස්වන්න.

ස්වර්ගයේ සතුටින් හා සැනසිල්ලෙන් සිටි ආදම් අලයිහිවසල්ලම් හා හව්වා අලයිහිවසල්ලම් යන දෙදෙනා ෂයිතාන්ගේ පෙළඹවීම නිසා අල්ලාහ්ගේ අණ නොතකා කටයුතු කිරීම ගැන බෙහෙවින් චිත්ත වේදනාවට පත්ව බැගෑපත්ව සමාව ඉල්ලා සිටියහ. ඔවුන්ගේ පව්වලට සමාව දුන් අල්ලාහ් "මෙහි සිට මනුලොවට යන්න. එහිදී ඔබ ජීවත්විය යුතු ආකාරය ගැන මගේ මගපෙන්වීම් ඔබ වෙත පැමිණෙන්නේ ය. කවුරුන් එය පිළි ගන්නේ ද ඔහුට බිය වීමට කරුණක් හෝ පසුතැවිලිවීමට කරුණක් හෝ නොමැත. කවුරුන් එය ප්‍රතික්ෂේප කරන්නේ ද ඔහුට නිත්‍ය වශයෙන් නිරයේ රැඳීමට සිදුවන්නේ ය'' යැයි කීය. ඡේදය කියවීමෙන් පසුව පහත ප්‍රශ්න අසා සිසුන් තුළ බුද්ධි කළම්බනයක් ඇති කර සාකච්ඡා කරන්න.

1. අල්ලාහ් තම මගපෙන්වීම මිනිස් සමාජයට ලබා දුන්නේ කෙසේ ද?
2. අප ස්වර්ගයට යැමට කුමක් කළ යුතු ද ?

- පහත සඳහන් කරුණු කේන්ද්‍රගත කොට සාකච්ඡා පවත්වන්න.
- නබිවරු සහ රසූල්වරු මිනිසුන් අතරින් අල්ලාහ් විසින් තෝරා ගනු ලැබූ අය වෙති.
- නබිවරු සහ රසූල්වරු අතර සමහර වෙනස්කම් පවති.
- නබිවරුන්ගේ සහ රසූල්වරුන්ගේ මගපෙන්වීම නොමැතිව ඍජු මාර්ගයේ ජීවත් විය නොහැකි ය.
- අල්ලාහ් සියලු සමාජයකටම රසූල්වරයකු හෝ නබිවරයකු යවා ඇත.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරිමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරික්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරි පත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද, අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- මිනිසාට ආදර්ශමත්ව සිට මිනිසා යහමග යැවීමට වඩාත් සුදුසු මිනිසාම නිසා අල්ලාහ් නබිවරු මිනිසුන් අතරින් තෝරා ගත්තේ ය.
- නබිවරු වශයෙන් මිනිසා සිටීම අවතක්සේරු කළ අයට අල්ලාහ්ගේ පිළිතුර මෙසේ වූයේ ය. නබිතුමනි, පවසන්න මහපොළවේ සන්සුන්ව ඇවිදින මලාඉකාවරු ජීවත්වන්නේ නම් අප ඔවුනට මග පෙන්වීම සඳහා අහසින් මලාඉකා වරයකු රසූල්වරයකු ලෙස පහළ කර ඇත්තෙමු (17:95).
- රසූල්වරු යනු නබිවරු අතරින් තෝරා ගනු ලැබ විශේෂ වගකීම් පවරනු ලැබූ අය වෙති.
- සියලු රසූල්වරුන්ම නබිවරු වුවත් සියලු නබිවරුන්ම රසූල්වරු නොවෙති.
- අල්ලාහ් ලොවට නබිවරු එක්ලක්ෂ විසිහතර දහසක් පහළ කර ඇත. ඔවුනතරින් තුන්සිය දහතුන් දෙනකු රසූල්වරු ය.
- අල්කුර්ආනයේ නබිවරු විසිපස්දෙනකුගේ නම් සඳහන් වන්නේ ය. තවද සමහරුන්ගේ නම් හදීස්වල සඳහන් වේ. උදා:- යූෂඃ බින් නූන් (අලයි), ෂම්වේල් (අලයි), ඉර්මියා (අලයි)
- නබිවරු සහ රසූල්වරු විශ්වාස කිරීම ඊමානයේ ප්‍රධාන අංගයකි.
- නබිවරු මිනිසුන් වූ නිසා මිනිසුනට අදාළ සියලු අවශ්‍යතා ඔවුනට ද වූයේය.
- එය අල්කුර්ආනයේ මෙසේ පැවසේ.
- ඔබට කලින් ද වක්තෘවරු බෙහෝ දෙනකු අප පහළ කර ඇත්තෙමු. ඔවුනට අප භාර්යාවරුන් සහ දරුවන් ඇති කර සිටියෙමු. (13:38)

- තවද නබිවරයාණෙනි ඔබට කලින් අප පහළ කළ නබිවරු සියලු දෙනාම කෑම කන අයද කඩවීදියේ ගමන් කරන අය ද වූහ. (25:20)

- මම මට කිසිදු යහපතක් හෝ හානියක් කිරීමට හැකියාව ලබා නැත්තෙමි. අල්ලාහ් කුමක් පතන්නේ ද එයම සිදුවන්නේ ය. සැඟවුණු දේ පිළිබඳ මම දන්නා අයකු වුවා නම් මම බොහෝ වාසි ලබන අයකු වන්නට ඉඩ තිබුණි. තවද කිසිදු අන්තරාවක් මට සිදු නොවී තිබෙනු ඇත. (7:110)

- නබිතුමණි පවසනු මැන මම ද ඔබ මෙන්ම මිනිසකු වෙමි. මට ද ඔබගේ දෙවියා එක් අයකු බව, වහී පැමිණෙන්නේ ය. (19:110)

- නබිවරු මලාඉකාවරු වූවා නම් ඔවුන්ට මිනිසුන්ගේ අවශ්‍යතා සහ ගැටලු වටහා නොගෙන ක්‍රියා කරන්නට ඉඩ තිබුණි.

- රසූල්වරුන්ගේ මගපෙන්වීම නොමැතිව මිනිසුන්ට ස්වයංව ඍජු මාර්ගයේ යා නොහැකි ය.

- අල්ලාහ්, කියාමාව, කද්ර් වැනි සැඟවුණු කරුණු වහීවල ආධාරයක් නොමැතිව මිනිස් දැනුමින් පමණක් නිවැරදිව වටහා ගත නොහැකි ය.

- මිනිසා මානසික ආශාවන්ට යටත් වන නිසා සියලු මිනිසුන්ට පොදු වූ හෝ සාධාරණ වූ නීතියක් දෙවියන්ගේ මගපෙන්වීමකින් තොරව මිනිසා විසින් ඇති කළ නොහැකි ය.

- මිනිසා නොඉවසිලිවන්ත අයකු නිසා කෙටි කාලින පහසුකම් ගැන පමණක් සලකා ක්‍රියාත්මක වන්නේ ය. දිර්ඝ කාලීනව ඇතිවන හානි ගැන ඔහු සිතා කටයුතු කරන්නේ නැත.

- නබිවරු සහ රසූල්වරු අල්ලාහ්ගේ මගපෙන්වීම ඍජුව ලැබ ක්‍රියාත්මක වන නිසා ඔවුන් ට පමණි මුළු මිනිස් සමාජයටම මගපෙන්වීම කළ හැකි වන්නේය.

- එම නිසා අල්ලාහ් සියලු සමාජයටම නබිවරු යැව්වේ ය.

- තවද, අනතුරු දක්වන්නන් නොමැතිව කිසිම සමාජයක් පැවැතුනේ නැත. (35:24)

- එක් එක් සමාජයට එක් වක්තෘවරයකු සිටින්නේ ය(10:47)

- අල්කුර්ආනය පවසන අන්දමේ සමහර සමාජ සහ ඒවාට යවනු ලැබූ නබිවරු පහතින් දැක්වේ

- ආද් සමාජය -හූද් (අලයි)

- සමූද් සමාජය - සාලිහ් (අලයි)

- මද්යන් වාසින් - ෂුඅයිබ් (අලයි)

- බනූ ඉස්රාඊල්වරු - මූසා (අලයි)

- මුළු ලෝකයටම පොදුවේ - මුහම්මද් (සල්)

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: මිනිසුන් අතර වඩාත් ශ්‍රේෂ්ඨ අය නබිවරු යන අයුරින් නබිවරුන් අතර දක්නට ලැබෙන මිනිස් ගුණාංගයන් ද වක්තෘත්වයේ සුවිශේෂ ලක්ෂණ ද සඳහන් කර එයට සාධකවන අල්කුර්ආන් වචන ද සටහන් කරන්න.**

**කණ්ඩායම 2: අල්ලාහ් සෑම සමාජයකටම නබිවරු පහළ කර ඇත යන්නට සාධක වශයෙන් අල්කුර්ආනීය වාක්‍ය පහක් සහ ඒවාට යවනු ලැබූ නබිවරු ද උදාහරණ වශයෙන් ඉදිරිපත් කරන්න.**

**කණ්ඩායම 3: මෙලොව සහ පරලොව ජීවිතය යහපතක් විය යුතු නම් නබිවරුන්ගේ මගපෙන්වීම අත්‍යවශ්‍ය යන්නට හේතු පහක් සඳහන් කරන්න.**

**කණ්ඩායම 4 : අල්කුර්ආනයේ නම් සඳහන් නබිවරු 25 දෙනා ගැන ලැයිස්තුවක් සකස් කරන්න.**

**නිවසේ පරිසරයෙන්: අල්කුර්ආනයේ නම් සඳහන් නබිවරු විසිපස් දෙනා ද, ඔවුන් ජීවත් වූ කාලය, පරම්පරාව යන්න ද පැහැදිලි කරන අයුරින් ''ෂජරතුල් අන්බියාව'' දෙමව්පියන්ගේ සහාය ඇතිව ඇඳ දැක්වීමට මගපෙන්වන්න.**

**නිපුණතාව** 2.0 : **ඉස්ලාමයේ මූලික යුතුකම් සුවිශේෂ ලක්ෂණ ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධකරගෙන ක්‍රියාත්මක කරයි.**

**නිපුණතා මට්ටම** 2.1 : **ෆර්ල් වූ හා සුන්නත් වූ උසුරුම් දැන ඒවා සලාතයේ පරායනය කරයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- **සලාතයේ ෆර්ල්වූ ද සුන්නත් වූ උසුරුම් කෙරෙන බව පෙන්වා දෙයි.**
- **සලාතයේ සුන්නත් වූ උසුරුම් ලැයිස්තු ගත කරයි.**
- **සුන්නත් වු උසුරුම්වල තේරුම වනපොත් කර කියයි.**
- **සලාතයේ දී ඒවා අඛණ්ඩව උසුරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- දුආඋල් ඉෆ්තිතාහ් වජ්ජහත් උසුරා එහි පරිවර්තනය කියවා පෙන්වීමෙන් පාඩම් ප්‍රවේශය සිදුකරන්න.
- මෙම දුආඅල අදහස සලාතය සමග සහ ජීවිතය සමග සම්බන්ධ කර පහදන්න
- පහත කරුණු මතුවනසේ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සලාතය යනු ෆර්ල්වූ ද සුන්නත් වූ ද උසුරුම් හා ෆර්ල් වූ ද සුන්නත් වූ ද ක්‍රියාවලින් සමන්විත සලාමය සමග අවසන් වන එක් නැමදුමකි.
- සලාතයේ සිදුවෙන ක්‍රියා අතර ෆර්ල් වූ ද සුන්නත් වූද උසුරුම් උසුරනු ලබන්නේ ය.
- සලාතය ඉටුකරන අය දෙවියන් මතක් කරනු ලබයි.
- සලාතයේ උසුරනු ලබන උසුරුම් එය ඉටුකරන අයගේ ජීවිතයට උපදේශයන් ද වන්නේ ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

පියවර 3 :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න
- සලාතයේ දී උසුරිය යුතු ෆර්ල් වූ උසුරුම් නබි සල්ලල්ලාහු අලයිහිව සල්ලම් උසුරා පෙන්වා ඇත.
- තක්බීර් තහ්රිමා
- සූරතුල් ෆාතිහා
- අත්තහියියාත් උසුරිම
- අත්තහියියාත් හි සලවාත් උසුරිම
- පළමු සලාම් කීම
- සලාතයේ දී ඒ ඒ අවස්ථාවල එන සුන්නත් වූ උසුරුම් නබි සල්ලල්ලාහු අලයිහිව සල්ලම් තුමා පැහැදිලිව උසුරා පෙන්වා ඇත්තාහ.
- මෙම ෆර්ල්වූ ද සුන්නත් වූ ද උසුරුම් මුස්ලිම් තම සලාත ඉටුකරන අවස්ථාවල දී උසුරයි.
- සලාතයේ උසුරන මෙම උසුරුම් මුස්ලිම්ට හොඳ ඔවදනක් වන්නේ ය.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි අදාළ ඒවා යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණයක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1 : ඔබට සපයා ඇති වගුවේ දක්නට ලැබෙන සලාතයෙ උසුරුම් අතරින් ෆර්ල් වූ උසුරුම් පමණක් වෙන් කොට ලැයිස්තුවක් සාදන්න**


**කණ්ඩායම 2: ඔබට දෙන ලද වගුවේ දක්නට ලැබෙන සලාතයේ උසුරුම් අතරින් සුන්නත් වූ උසුරුම් පමණක් වෙන් කොට ලැයිස්තුවක් සකස් කරන්න**

**කණ්ඩායම 3 : ඔබට දෙන ලද වගුවේ දක්වා ඇති උසුරුම් අතරින් කුමන අවස්ථාවේ උසුරනු ලබන්නේ ද යන්න ඒවාට ඉදිරියේ ඇති කොටුවල ලියන්න**

**නිවසේ පරිසරයෙන්: සලාතයේ ෆර්ල් වූ ද සුන්නත් වූ ද උසුරුම් තම දෙමව්පියනට වනපොත් කර පෙන්වා සසඳා බැලීමට යොමු කරන්න**

**වගුව 1**

**ෆර්ල් වූ උසුරුම් සුන්නත් වූ උසුරුම්**



**නිපුණතාව 2.0 : ඉස්ලාමයේ මූලික යුතුකම්, සුවිශේෂ ලක්ෂණ, ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධකරගෙන ක්‍රියාත්මක කරයි.**

**නිපුණතා මට්ටම 2.2 : ෆර්ල් වූ හා සුන්නත් වූ සලාත හඳුනාගෙන ඒවා අනුගමනය කර හැසිරෙයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **සලාතයේ ෆර්ල්වූ ද සුන්නත් වූ සලාත් කොටස් දෙකක් ඇති බව උදාහරණ මගින් පෙන්වා දෙයි.**
- **ෆර්ල් වූ සලාත වගුවක වෙනම දක්වයි.**
- **ෆර්ල් වූ සලාතය මෙන්ම සුන්නත් වූ සලාතය අඛණ්ඩව ඉටුකර දක්වයි.**
- **සලාතය අල්ලාහ් වෙත ළඟාවීමට ඇති මාර්ගයක් යන්න ගෙන හැර දක්වයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- සිසුන් දිනපතා ඉටුකරන සලාත ගැන අසා දැන ගන්න. ඒවායින් පුද්ගලයන් කෙරෙහි හා සමාජය කෙරෙහි වගකීමක් වන සලාත ගැන අහන්න.
- ඒවායින් ෆර්ල් වූ ද, සුන්නත් වූ ද, සලාත ගැන මතක් කර පාඩම් ප්‍රවේශය සිදුකරන්න.
- සලාතයට අදාළ පහත සඳහන් කරුණු කේන්ද්‍ර කොට ගෙන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සුන්නත් වූ ද ෆර්ල් වූ ද සලාත වශයෙන් සලාත ආකාර දෙකකි.
- ෆර්ල් වූ සලාත ෆර්ල් අයින් හා ෆර්ල් කිෆායා යැය ආකාර දෙකකි.
- සුන්නත් වූ සලාත ඉටුකිරීමට අදාළ හේතු, කාලය, වෙලාව අනුව ද සුන්නත් වූ සලාත වර්ග කරනු ලබන්නේ ය.
- මේවාට අමතරව තවත් සමහර සුන්නත් වූ සලාත ද නබි මාර්ගයෙන් ලැබී ඇත.
- ෆර්ල් වූ ද සුන්නත් වූ ද සලාත ඉටුකිරීමෙන් මෙලොව හා පරලොව අපරිමිත කුසල් හිමිවන්නේ ය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරිමට යොමු කරන්න.

- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.

- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.

- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.

- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.

- ෆර්ල් අයින් යනු තනිපුද්ගලයන් කෙරෙහි අනිවාර්ය වන යුතුකම් දැක්වේ. මේවා ඉටු කිරීමෙන් කුසල් ද ඉටු නොකිරීමෙන් අකුසල් හා දඬුවම් ද ලැබෙන්නේය.

- ෆර්ල් කිෆායා යනු සමාජයට නියම වන යුතුකම් වන්නේය. ඒවා සමාජයේ සාමාජිකයන් කිහිප දෙනකු ඉටු කළේ නම් සියලු අයගේ යුතුකම් ඉටුවන්නේය. කිසිවකු ඉටු නොකළේ නම් සමාජයේ සිටින සියල්ලන්ටම පව් සිදුවන්නේ ය. සියල්ලන්ම වරදකරුවන් වෙති.

- ෆර්ල් කිෆායා සහ ෆර්ල් අයින් අමතර ක්‍රියාකාරකම් සුන්නත් වූ ක්‍රියා ලෙස සැළකෙන්නේ ය. මේවා ඉටු කළහොත් කුසලත් ඉටු නොකළහොත් අකුසලයක් වන්නේ නැත. එහෙත් කියාමාවේ දී ෆර්ල් වූ ක්‍රියාකාරකම්වල අඩුපාඩුකම් සපුරා ලීමට ඒවා යොදා ගැනේ.

- සලාතයේ ද ෆර්ල්වූ ද සුන්නත් වූ ද කොටස් ඇති ඒවා පහත සඳහන් වගුවෙන් බලා ගත හැකි ය.

- කවුරුන් තමාට අනිවාර්ය වූ සලාතයන්ට අමතරව රාත්‍රියේ හා දහවල්හි සුන්නත් වූ සලාත රක්අත් දොළහක් ඉටුකරන්නේ ද ඔහුට අල්ලාහ් ස්වර්ගයේ නිවසක් තනන්නේ ය.

- සලාතය අනිවාර්යයෙන්ම නින්දාකාරී හා නරක ක්‍රියාවන්ගෙන් වළක්වන්නේය (29:41).

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: සලාතයේ ෆර්ල් අයින් හා ෆර්ල් කිෆායා යන දෙක වෙන් වෙන්ව බ්‍රිස්ටල් බෝඩ්වල ලියා ප්‍රදර්ශණය කරන්න**

**කණ්ඩායම 2: මුස්ලිම් දිනකට ඉටුකළ හැකි සුන්නත් වූ සලාත වගු ගත කර දක්වන්න**

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: ඔබට සපයා ඇති වගුවේ දක්නට ලැබෙන සලාතයේ උසුරුම් අතරින් ෆර්ල් වූ උසුරුම් පමණක් වෙන් කොට ලැයිස්තුවක් සාදන්න**

**කණ්ඩායම 2: ඔබට දෙන ලද වගුවේ දක්නට ලැබෙන සලාතයේ උසුරුම් අතරින් සුන්නත් වූ උසුරුම් පමණක් වෙන් කොට ලැයිස්තුවක් සකස් කරන්න.**

**කණ්ඩායම 3: ඔබට දෙන ලද වගුවේ දක්වා ඇති උසුරුම් කුමන අවස්ථාවේ උසුරනු ලබන්නේ ද යන්න ඒවාට ඉදිරියේ ඇති කොටුවල ලියන්න.**

**ඇගයිම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: ඔබට සපයා ඇති වගුවේ දක්නට ලැබෙන සලාතයෙ උසුරුම් අතරින් ෆර්ල් වූ උසුරුම් පමණක් වෙන් කොට ලැයිස්තුවක් සාදන්න.**

**කණ්ඩායම 2: ඔබට දෙන ලද වගුවේ දක්නට ලැබෙන සලාතයේ උසුරුම් උසුරා අතරින් සුන්නත් වූ උසුරුම් පමණක් වෙන් කොට ලැයිස්තුවක් සකස් කරන්න.**

**කණ්ඩායම 3: ඔබට දෙන ලද වගුවේ දක්වා ඇති උසුරුම් අතරින් කුමන අවස්ථාවේ උසුරනු ලබන්නේ ද යන්න ඒවාට ඉදිරියේ ඇති කොටුවල ලියන්න.**

**කණ්ඩායම 4: ෆර්ල් වූ හා සුන්නත් වූ සලාත ඉටුකිරිමෙන් ඔබට ලබා ගත හැකි අධ්‍යාත්මක හා ලෞකික ආනිසංස ලැයිස්තු ගත කර දක්වන්න.**

**නිවසේ පරිසරයෙන් : නිවසේ දී දිනපතාම ඉටු කළ හැකි සුන්නත් වූ සලාතයන් දෙමව්පියන් සමග එක්ව ඉටු කරන්න යොමුවන්න.**

**නිපුණතාව 2.0 : ඉස්ලාමයේ මූලික යුතුකම් සුවිශේෂ ලක්ෂණ, ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධ කරගෙන ක්‍රියාත්මක කරයි**

**නිපුණතා මට්ටම 2.3 : සලාතයේ ලෞකික හා අධ්‍යාත්මක ප්‍රයෝජන වටහා ගෙන ක්‍රමවත්ව ඉටු කරයි**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **සලාතයෙන් අධ්‍යාත්මක ප්‍රයෝජන අත්වන බව ගෙන හැර දක්වයි.**
- **සලාතයෙන් ලැබෙන මෙලොව ප්‍රයෝජන ගැන ලැයිස්තු ගත කරයි.**
- **සලාතය ක්‍රමවත්ව ඉටු කරයි.**
- **සලාතයේ ප්‍රයෝජන ගෙන හැර දක්වා කතාවක් පවත්වයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- සැබැවින් සලාත අවනම්බුව ගෙන දෙන හා පිළිකුල් කරන කාර්යයන්ගෙන් මිනිසා වළක්වා ගනියි. (29:41)
- යන අල්කුර්ආන් වාක්‍යය ලියා ප්‍රදර්ශණය කර සිසුන්ගේ ආකර්ශණය කරන්න.
- පහත සඳහන් කරුණු කේන්ද්‍ර කොට ගෙන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සලාතය මිනිසාගේ සිරුර අධ්‍යාත්මය හා දැනුම යනාදි තුනටම ප්‍රයෝජනවත් ඉබාදතයකි.
- මෙම අවයට තුන සමතුලිකව තබා ගැනීම සම්බන්ධයෙන් සලාතය වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.
- සලාතය පිළිවෙළට ඉටු කිරීමෙන් මුස්ලිම් ලෞකික හා අධ්‍යාත්මක ප්‍රයෝජන ලබන්නේ ය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරිමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යොදා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිර් පත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- සලාතය මගින් අල්ලාහ් හා මිනිසා අතර අන්තර් සම්බන්ධතාව අලුත් කෙරෙන්නේ ය.
- සලාතය මගින් ස්ථානය සිරුර, ඇඳුම ආදිය පිරිසිදු කෙරෙන්නේ ය.
- මිනිසා අල්ලාහ්ගේ අණට කීකරුව සිටීමේ පුරුද්ද ඇති කරයි.
- සිත එකලස් කරන පුරුද්දක් සලාතය ඇති කරයි.
- සලාතය මගින් නින්දාකාරා ක්‍රියාවලින් වැරදි ක්‍රියාවලින් ආරක්ෂා කරයි.
- සලාතයේ උසුරුම් වැදගත් උපදේශයන් වන්නේ ය.
- අමාරුකම් ඉවත් කිරීම, කබ්රයේ වදවේදනා අඩුකිරීම, සිරාත් පාලම ඉක්මනින් පසු කිරීම, ප්‍රශ්න කිරීමකින් තොරව ස්වර්ගයට පිවිසීම වැනි කුසලයන් සලාතය නිසා අත්වේ.
- සමූහ සලාතය හා ජුම්ආ සලාතය යනාදිය මගින් විවිධ ප්‍රයෝජන රැසක් ද අත්වන්නේ ය.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: සලාතය මගින් අත්වන ප්‍රයෝජන සඳහන් කුර්ආන් වාක්‍ය දෙකක් ලියා ඒවායේ අර්ථය දෙබසක ආකාරයෙන් ලියන්න.**

**කණ්ඩායම 2: සලාතය අත් හැරීම නිසා සිදුවන විපාක කුර්ආන හා හදීස ආධාරයෙන් විස්තර කර ලියන්න.**

**කණ්ඩායම 3: සලාතයේ ලෞකික හා අධ්‍යාත්මක ප්‍රයෝජන විස්තර දේශනයක් අයුරින් ගොනු කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: සලාතය නිසා අත් වන ප්‍රයෝජන සම්බන්ධයෙන් දෙමව්පියන්ට සාකච්ඡා කර ලියා ගැනීමට යොමු කරන්න.**

**නිපුණතාව 2.0 : ඉස්ලාමයේ මූලික යුතුකම් සුවිශේෂ ලක්ෂණ, ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධකරගෙන ක්‍රියාත්මක කරයි.**

**නිපුණතා මට්ටම 2.4 : සජදාගැන දැන අදාළ අවස්ථාවල ඉටු කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **සලාතයෙහි ෆර්ල් වූ සජදා තිබෙන්නාක් මෙන් සලාතය තුළ හා සලාතයේ පිටත ද සුන්නත් වූ සජදා ද ඇති බව පෙන්වා දෙයි.**
- **සුන්නත් වූ සජදා නම්කර විස්තර කරයි.**
- **සුන්නත් වූ සජදා ඉටුකරන අවස්ථා ගෙන හැර දක්වයි.**
- **අදාළ අවස්ථාවල සුන්නත් වූ සජදා ඉටු කරන ආකාරය ආදර්ශණය කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- ෆර්ල් වූ සලාත හැර වෙනත් වෙලාවල සජදා ඉටු කළ අත්දැකීම් තිබේ ද? නැතහොත් අන් අය සජදා කරනු දැක තිබේ දැයි සිසුන්ගෙන් අසා පාඩම් ප්‍රවේශය සිදු කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරන ආකාරයෙන් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සුජූද් යන්න අල්ලාහ් වෙනුවෙන් යන නිය්‍යතය සමග හිස පහත් කිරීම වන්නේය.
- ෆර්ල් වූ සලාතයේ ඉටුකරන සජදා හැර වෙනත් ආකාරයේ සජදා දක්නට ලැබෙන්නේ ය.
- සජදා තිලාවත්, සජදා ෂුක්ර්, සාජදා සහ්ව් යන ඒවා වැදගත් සජදා වන්නේ ය.
- එක් එක් සජදාව ඉටු කිරීම සඳහා අවස්ථා සහ ක්‍රම ඇති බව පවසයි.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම් හි යොදා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න

- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න

- සජදා තිලාවත් යනු අල්කුර්ආනයේ ඇති සජදා සහිත ආයතයක් උසුරන අවස්ථාවේ හෝ එයට සවන්දුනහොත් සජදා ඉටුකළ යුතුය.

- අල්කුර්ආනයේ ස්ථාන පහළවක සජදා සඳහන් වන්නේ ය. අඃරාෆ් 206, අර්රඃද් 15, අන්නහ්ල්, 49 අල් ඉස්රා 107, මර්යම් 57, අල්හජ් 77, අල් ෆුර්කාන් 60, අන්නම්ල් 25, සජදා 15, සාද් 24, ෆුස්සිලාත් 37, අන්නජ්ම් 62, අල්ඉන්සිකාක් 21, අල්අලක් 19 ආදිය ඒවාවේ.

- මිනිසෙක් අල්කුර්ආනයේ සජදා කළ යුතු ආයතයක් උසුරා සජදා කළහොත් ෂයිතාන් අහක්වී අඬමින් ''අභාග්‍යයන් මටයි සුජූද් කරන ලෙස මිනිසාට අණ කරනු ලැබූ විට ඔහු එයට අවනතව සුජූද් කර ස්වර්ගය තමා සතු කරගත්තේ යි මම සුජූද් කරන ලෙස අණකරනු ලැබූ විට එයට අවනත නොවී ඉවත් වූයෙමි. එහෙයින් මට නිරය ස්ථිර කරනු ලැබ ඇත'' යැයි උඩුබුරුලමින් පසුවන්නේ ය. යැයි නබි සල් තුමා කීහ. (මුස්ලිම්, අහමද් )

- සාමාන්‍යයෙන් අල්කුර්ආනය පාරායනය කරන අවස්ථාවේ දී සජදා කළ යුතු ආයතයක් පැමිණියේ නම් සජදා කිරීම සජදා තිලාවතය වන්නේ ය. මෙය සුන්නතයකි. සජදාවකට අදාළ ආයතයක් සලාතයේ දී උසුරනු ලැබූ විට එසේ සජදා කිරීම සුන්නත් වන්නේ ය.

- සජදා තිලාවතයේදී සුබුහාන රබ්බියල් අඃලා යැයි ඉසිරිය හැකිය. තවද එම අවස්ථාවේ ඉසිරිය හැකි තවත් දුආවක් නබිසල් තුමා උගන්වා දී ඇත.

- සජදා ෂුක්ර් යනු අල්ලාහ් කිසියම් හදිසි දායාදයක් ලබා දුන් අවස්ථාවේ දී නැතහොත් අපට ලැබීමට තිබුණු අනතුරක් වැළක්වනු ලැබූ විට එයට අල්ලාහ්ට ස්තුති කිරීමේ සුන්නත් වූ සුජූදය මෙයින් අදහස් කෙරෙන්නේ ය.

- මෙම සජදාව තමා වෙනුවෙන් හෝ තම අය වෙනුවෙන් හෝ මුස්ලිම් සමාජය වෙනුවෙන් හෝ සිදුවීමට තිබූ අනතුරක් වැළක්වීම වෙනුවෙන් හෝ ඇතිවන්නා වූ සතුට වෙනුවෙන් හෝ කරනු ලබන්නකි.

- අල්ලාහ් වෙනුවෙන් සජදා ෂුක්ර් කරමි යන නියය්‍යතය සමග තක්බීර් කියා සුජූදයෙන් නැගිට සලාම් කීමත් සමග එය අවසන් වන්නේ ය.

- සජදා සහ්ව් යනු සලාතයේ ඇති වූ අමතක වීමක් වෙනුවෙන් ඉටුකරනු ලබන සුජූද දෙක වන්නේ ය.

- ඔබගෙන් අයකුට තම සලාත අවස්ථාවේ දී තමා ඉටුකළේ රකඅත් දෙකක් ද තුනක් ද යන සැකයක් ඇති වූ විට සැකය අතහැර දමන්න. වඩා ස්ථිර වශයෙන් සංඛ්‍යාව ඉටුකළ බව ගෙන පසුව සලාම් දීමට පෙර සුජූද දෙකක් ඉටුකරන්න. (මුස්ලිම්)
- සජදා සහ්වු සඳහා ෆර්ල් හතරකි.
- සජදා සහ්වු ඉටුකරන්නයි සිතෙහි නියයතය තැබීම.
- සුජූද දෙකක් ඉටු කිරීම.
- සුජූද දෙක අතර ඉඳගැනීම.
- සුජූද දෙක අතර මැද ඉඳුමෙහි ප්‍රමාද වීම.
- සජදා සහ්වු ඉටු කරනු ලබන අවස්ථාවන්,
- අමතකවීමකින් රකඅත පහක් ඉටුකිරීම, අමතකවීමකින් එක් රකා අතයක් වැඩිපුරව ඉටු කිරීම, ෆර්ල්වලින් එකක් අමතකවීමකින් අතහැර මතක් වූවිට එය ඉටුකර සජදා සහ්වු කිරීම.
- ප්‍රධාන උසුරුම් ස්ථාන වෙනස් කොට උසුරීම.
- අබ්ආල් වන සුන්නතයක අමතක වූවා දැයි සැක පහළවීම.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: සජදා ආකාර අර්ථකථනය කර දක්වන්න.**

**කණ්ඩායම 2: සජදා ෂුක්ර් ඉටුකළ හැකි අවස්ථා ලැයිස්තු ගත කර දක්වන්න.**

**කණ්ඩායම 3: අල්කුර්ආනයෙ සජදා තිලාවත් ඇති ආයත තර්ජමතුල් කුර්ආනය ආධාරයෙන් සොයා ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 4: සජදා සහ්වු ඉටුකිරිමට අදාළ අවස්ථා අත්දැකීම තුළින් සාකච්ඡා කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: තම දෙමව්පියන් සජදා සහ්වු ඉටුකළ අවස්ථා ගැන ඔවුන් සමග සාකච්ඡා කර අනාගතයේ දී ඒවා ඉටුකිරීමට අදාළව සැලස්මක් සකස් කර ගන්න.**

**නිපුණතාව** 2.0 : **ඉස්ලාමයේ මූලික යුතුකම්, සුවිශේෂ ලක්ෂණ හා ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධකරගෙන ක්‍රියාත්මක කරයි.**

**නිපුණතා මට්ටම** 2.5 : **රමළාන් මාසයේ සුවිශේෂතා ගැන දැන අනුගමනය කරයි**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- **අනික් මාසවලට වඩා රමළාන් මාසය වැදගත් වීමට හේතු ගෙනහැර දක්වයි.**
- **හදීස් ඉදිරිපත් කර රමළානයේ සුවිශේෂතා ගෙන හැර දක්වයි.**
- **රමළානයේ ගෞරවය රැකෙන සේ කටයුතු කරයි.**
- **රමළානයේ සුවිශේෂ ක්‍රියා කැමැත්තෙන් ඉටු කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- රමළාන් මාසය පැමිණි විට ස්වර්ගයේ දොරටු ඇරෙන අතර නිරයේ දොරටු වැසෙන්නේය. ෂයිතාන්වරු දම්වැල් ලා බඳිනු ලබත් (බුහාරි මුස්ලිම්) යන හදීසය ඇතුළත් කර සිසුන් සමග සාකච්ඡාව මෙහෙය වීමෙන් පාඩම් ප්‍රවේශය සිදුකරන්න.
- පහත කරුණු මතු කරන අයුරින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- රමළාන් මාසය අන් මාසවලට වඩා විවිධ සුවිශේෂතා සහිතය.
- රමළානයේ සුවිශේෂතා විවිධ හදීස් මගින් අවධාරණය කෙරෙන්නේ ය.
- ගෞරවනීය රමළානයේ අප ඉටු කළ යුතු විවිධ වගකීම් ඇත. ඒවා කැමැත්තෙන් ඉටු කිරීම ගැන හදීස මගින් අවධාරණය කෙරෙන්නේ ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව සෙසු කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න

- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න

- රමළාන් මාසය අනිකුත් මාසවලට වඩා සුවිශේෂතා රැසක් සහිත ය.
- දහසක් රාත්‍රීන්ට වඩා උතුම් වූ ලයිලතුල් කද්ර් රාත්‍රිය රමළාන් මාසයේ තිබීම.
- බඩගින්න, පිපාසය හා ඉන්ද්‍රියමය හැඟීම් පාලනය කරන මාසය වීම.
- පව් සමාවත් සහ නිරයෙන් නිදහසත් තිබෙන මාසය වීම.
- මු:මින් වරයකුගේ තක්වාව පරීක්ෂා කරන මාසය වීම.
- අල්ලාහ්ගේ තෘප්තිය ලබන මාසය වීම.
- ස්වර්ගයේ දොරටු විවෘත කර නිරයේ දොරටු වසා තබන මාසය වීම.
- යහ ක්‍රියාවන් කෙරෙහි පොළඹවන සහ ෂයිතාන් බැඳ තබන මාසය වීම.
- මෙම නිසා මෙම මාසයට ගෞරව කර දේව තෘප්තිය ලබා ගැනීම සඳහා අප විවිධ විශේෂ කර්තර්ව්‍යයන් කැමැත්තෙන් ඉටු කර ගත යුතුය යන්න හදීස් මගින් වටහා දී ඇත.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: රමළානයේ සුවිශේෂතා සාකච්ඡා කර ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 2: රමළානයේ සුවිශේෂතා දක්වන හදීස ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 3: රමළාන් මාසයේ විශේෂයෙන් සැළකිළිමත් විය යුතු යහක්‍රියා සම්බන්ධ ලැයිස්තුව හදිස්වල ආධාරයෙන් එක්රැස් කරන්න.**

**රමළානය ඉතා වැදගත් ආකාරයට ගත කිරිමට අදාළ යෝජනා ගැන ඔබගේ යහළුවකුට ලිපියක් ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: රමළාන් මාසයේ ගෞරවය රැකෙන පරිදි නිවෙස් පරිසරයේ ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් ලැයිස්තුවක් සකස් කිරීමට යොමු වන්න.**

**නිපුණතාව 2.0 : ඉස්ලාමයේ මූලික යුතුකම්, සුවිශේෂ ලක්ෂණ, ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධකරගෙන ක්‍රියාතමක කරයි**

**නිපුණතා මට්ටම 2.6: සකාත් සදකා පිළිබඳ අවබෝධය ලැබ අනුගමනය කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **සකාත් සහ සදකා අතර වෙනස්කම් ගෙන හැර දක්වයි.**
- **සකාතයේ සුවිශේෂ ලක්ෂණ ගෙන හැර දක්වයි.**
- **සකාතයේ සුවිශේෂතා වටහා දෙයි.**
- **සකාත් යුතුකමක් නොවන විට සදකාව ඉටු කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- සකාත් හා සදකා යන වචන දෙක සිසුනට ඉදිරිපත් කර ඒ ගැන ඔවුන් වටහා ගෙන ඇති කරුණු පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ෆර්ල් වූ සලාත හැර වෙනත් වෙලාවල සජදා ඉටු කර අත්දැකීම් තිබේ ද ? නැතහොත් අන් අය සජදා කරනු දැක තිබේ දැයි සිසුන්ගෙන් අසා පාඩම් ප්‍රවේශය සිදු කරන්න.
- පහත සඳහන් කරුණු මතුවන ආකාරයෙන් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සකාතය ඉස්ලාමයේ පස් මහ යුතුකම් වලින් එකකි.
- ධනවත් අය යම් යම් නියම වලට යටත් ව ඉටු කරන යුතුකමක් සකාත් වන්නේය.
- සදකා යනු සාමාන්‍යයෙන් ඉටු කරන්නා වූ දන් පින් වන්නේ ය.
- සකාතයට හා සදකාවලට විවිධ විශේෂතා ඇත.
- සකාත් වගකීමට විවිධ කොන්දේසි තිබෙන නිසා එය සදකාවයට වඩා සුවිශේෂ වන්නේය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡාකර අදහස් මතුකිරීමට යොමු කරන්න
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදා මග පෙන්වන්න
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න
- අනෙක් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ද අසා ලබා ගන්න
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න
- සකාත්, සදකා යන දෙක අතර වෙනස්කම් දක්නට ඇත. උදාහරණ වශයෙන් සකාත් වාජිබ් වූවකි. අදාළ කිසියම් දේවල් කෙරෙහි පමණක් නියම වූවකි. කිසියම් අය කෙරෙහි පමණක් නියම වූවකී කිසියම් ප්‍රමාණයක් සඳහන් පිරිස් අටට පමණක් දිය යුතුය යන කොන්දේසි සහිතයි. සදකා එසේ නොවේ.
- නබි තුමණි ඔවුන්ගේ දේපළවලින් අනිවාර්ය කරන ලද සකාතය ගැනීමෙන් ඔවුන් අභ්‍යන්තරව හා බාහිරව පාරිශුද්ධ කරනු මැන. එමගින් ඔවුන් පාරිශුද්ධ කර ඔවුන් ට ආශිර්වාද කරනු මැනැවි. (9:103)
- සකාත් නොදී සිටින සමාජ අල්ලාහ් දුර්භික්ෂ මගින් පරීක්ෂාවට ලක්කරන්නේය.
- විශ්වාසවන්තයෙන් කවුරුන් තම දේපළ අන් අයට උදව් කිරීම පිණිස රාත්‍රියේ සහ දහවල් කාලයේ රහසින් හා එළිපිට වියදම් කරන්නේ ද ඔවුනට අදාළ කුලිය ඔවුන්ගේ දෙවියන් වෙත ඇත. තවද, කියාමාවේ දී කිසිඳු බියක් ද නොමැතී ඔවුන් දුක්වන්නේ ද නැත(2:274)
- දන් පින් කරන්නන් දෙවියනට ආසන්නයේ සිටිති ; ඔවුන් මිනිසුනට ආසන්නයේ සිටිති; ඔවුන් ස්වර්ගයට ආසන්නව සිටිති ; නිරයට බොහො දුරින් සිටියි.(තිර්මිදි)
- සකාත් නියම වන්නන් ගැන ද, නියම වන දේ පිළිබඳව ද, සකාත් ලැබීමට සුදුස්සන් ගැන ද ඉස්ලාමීය නීතිය පහදා දෙන්නේ ය.
- සදකා ද්‍රව්‍යවලට පමණක් නොව ක්‍රියාවනට ද අදාළ වන්නේ ය.(මවගේ මුහුණ දෙස බලා මදහස පෑම)

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් එල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණයක සකස් කර ගන්න

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:

කණ්ඩායම 1: සකාතයේ වැදගත්කම ගැන අල්කුර්ආනයේ සඳහන් වන වචන පහක් සොයා අදහස සමග ලියා ඒවායින් ඔබ වටහා ගෙන ඇති අදහස් ලියන්න.

කණ්ඩායම 2: සදකාවෙහි වැදගත්කම ගැන හදීස් පහක් ඒවායේ තේරුම සමග ලියා කෙටි පහදා දීමක් සමග ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3: සකාත් නියමවන භාණ්ඩ, සකාත් ලැබීමට සුදුසුකම් ඇති පුද්ගලයන්, ආදිය ඇතුළත් ලැයිස්තුවක් සකස් කරන්න.

කණ්ඩායම 4: සදකාවෙහි වැදගත්කම සහ සුවිශේෂත්වය ගැන ඓතිහාසික සිද්ධියක් සඳහන් කර එයින් ලබන ඉගෙනුම ලියා දක්වන්න.

නිවසේ පරිසරයෙන්: දිනපතාම උදයෙහි මලාඉකාවරු දෙදෙනකු පැමිණ'' දෙවියනි දන් පින් කරන්නාට ඔබ තවතවත් දෙනු මැනැවි. කවරකු දන් පින් නොකර සිටින්නේ ද ඔහුට විනාශය දෙනු මැනවියි'' ප්‍රාර්ථනා කරන බව නබිසල්ලල්ලාහු අලයිහිව සල්ලම් පවසා ඇත.

මෙම හදීසය නිවසේ අය සමග සාකච්ඡාකර දිනපතාම උයද කාලයේ සහ හවස් කාලයේ දන් පින් කිරිම සඳහා කැටයක් සූදානම් කර මුදල් රැස්කර නැති බැරි අයකුට දීමට මග පෙන්වන්න.

**නිපුණතාව 2.0 : ඉස්ලාමයේ මූලික යුතුකම්, සුවිශේෂ ලක්ෂණ, ඒවා ඉටුකරන ආකාර ගැන අවබෝධකරගෙන ක්‍රියාතමක කරයි**

**නිපුණතා මට්ටම 2.7 : දුආ යැදීමෙහි වැදගත්කම දැන එය අනුගමනය කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **දුආ යන්න අර්ථකථනය කර දක්වයි.**
- **දුආ යැදිමේ සුවිශේෂතා ඉදිරිපත් කරයි.**
- **දුආ යදින ආකාරය කීමෙන් ද කිරිමෙන් ද ආදර්ශණය කරයි.**
- **දුආ යැදීමේ ප්‍රයෝජන දැන සුවිශේෂ හා පොදු දුආ වනපොත් කර තම ප්‍රාර්ථනාවල එකකු කර ගනියි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- මිතුරන් තිදෙනකු රාත්‍රියකදී ගුහාවක රැදුනහ. හදිස්සියේ පෙරළි ගෙන ආ ගලක් ගුහාවේ දොරකඩ නැවතිණි. එයින් ගුහාවේ දොරකඩ වැසුණි. කරකියාගත නොහැකි ව පසුතැවිලි වූ ඔවුන් තමන් කළ යහක්‍රියා මතක් කර දෙවියන්ගෙන් දුආ ප්‍රාර්ථනා කර මෙම අකරතැබ්බයෙන් ගැලවීමට ඉටා ගත්හ. ඔවුන් එසේ ප්‍රාර්ථනා කළ අවස්ථාවේ ගල ක්‍රමයෙන් ඉවත් ව ගිය අතර ඔවුන් දුකෙන් මිදුනහ. හදීසයේ සඳහන් මෙම සිද්ධිය කතාවක් ලෙස සිසුනට ඉදිරිපත් කරන්න. එමගින් ප්‍රාර්ථනාවේ ප්‍රබලතාව ය, ප්‍රයෝජන ආදිය ගැන බුද්ධිකලම්භනයක් ඇති කර සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරන ආකාරයෙන් සිසුන් සමග සාකච්ඡා කරන්න
- දුආ යන පදයෙන් අර්ථවත් වන්නේ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීමයි.
- දුආහි වැදගත්කම ගැන අල්කුර්ආනය සහ හදීසය පැහැදිලි කරන්නේ ය.
- අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන අකාර කිහිපයකි.
- නබි (සල්) තුමා අපට විවිධ දුආ උගන්වා දී ඇත්තාහ.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකකට බෙදා සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡා කර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම් හි යොදා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව සෙසු කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් ද අසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- දුආ ප්‍රාර්ථනාව නැමදුම් හා වත් පිළිවත් හා හරය වන්නේ නැමදුමට සුදුස්සා අල්ලාහ් පැමිණි නැමදිය යුත්තා ඔහු පමණි. (අල්කුර්ආන් අර්රඅත් 14)
- මුස්ලිම්වරුන්ගේ ආයුදය ප්‍රාර්ථනාවයි. (හාකිම්)
- අල්ලාහ්ට වඩාත් කැමැති ක්‍රියාව ඔහුගෙන් ප්‍රාර්ථනා කිරීමයි. (අහමද්)
- දෙවියන්ගෙන් සැළකිල්ලත් ගෞරවයත් ලබා දෙන්නේ ප්‍රාර්ථනා කිරීම හැර අන් කිසිවක් නොවේ. (තිර්මිදි)
- ප්‍රාර්ථනා කිරීමට නොහැකිව සිටින්නාය වඩාත් නොහැකිවන්නා (තබරානි)
- කවුරු අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකළේ ද ඔහු කෙරෙහි අල්ලාහ් අමනාප වන්නේය. (ඉබ්නු මාජා)
- ප්‍රාර්ථනා කරන ක්‍රම කිහිපයකි.
- දත් මැද වූලූඃ ඉටු කර කිබ්ලාව වෙත මුහුණ ලා දෑත් ඔසවා සන්සුන්ව හා යටහත් පහත්ව ප්‍රාර්ථනා කළ යුතුය
- ප්‍රාර්ථනාවට පෙර අල්ලාහ්ට ප්‍රශංසා කිරිම සහ නබි සල් තුමා කෙරෙහි සලවාත් කීම.
- කැමැත්තෙන්, පරිපූර්ණ විශ්වාසයෙන් යුක්තව, යාඥාවෙන් යුක්තව සහ ඉහ්සාන් සහිතව අල්ලාහ් කෙරෙහි පමණක් යැදීම ප්‍රාර්ථනා කිරීම වේ.
- යටහත් පහත්ව සහ බිය වූ සිතින් යුක්තව යටහත් පහත් සිතින් දිව වෙවුලන ලෙසින් ප්‍රාර්ථනා කිරීම කළ යුතුයි.
- සාලිහුවු යහක්‍රියා ඉදිරිපත් කර ප්‍රාර්ථනා කිරීම සහ ප්‍රාර්ථනා කිරීමට පෙර යහපත් ක්‍රියාවක් කර ප්‍රාර්ථනා කිරීම.
- ප්‍රාර්ථනාව දිගින් දිගටම පවත්වා ගැනීම.
- අන් අයගේ අවශ්‍යතා සඳහා ප්‍රාර්ථනා කිරිම.
- දුආ යැදීමෙන් ප්‍රයෝජන රැසක් ලැබෙන්නේ ය.
- අල්ලාහ්ගේ කරුණාව ලැබීම.

- සිත සැනසීම
- අවශ්‍යතා ඉටුවීම
- අල්ලාහ් සමග ඇති සමීප බව වැඩිවීම
- පැමිණීමට තිබෙන අනතුර වැළක්වීම
- කියාමාවෙහි ඉතිරියක් ලෙස ලැබීම
- සුවිශේෂ දුආ කිහිපයක් පහත දැක්වේ
- අල්කුර්ආනයේ දැක්වෙන දුආ කිහිපයක්

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි යොදා ගත හැකි යි

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: දුආ ප්‍රාර්ථනාවේ වැදගත් කම් ගැන රියාලුස්සාලිහීන් ග්‍රන්ථය ආධාරයෙන් හදීස් හතරක් ගොනු කර ලියන්න**

**කණ්ඩායම 2: මුහම්මද් (සල්) තුමා උසුරා දැක්වූ සමහර ප්‍රාර්ථනා ගොනුකර ලියන්න**

**කණ්ඩායම 3: අල්කුර්ආනයෙ සඳහන් දුආ කිහිපයක් ගොනු කර ලියන්න**

**කණ්ඩායම 4: අපගේ ප්‍රාර්ථනාවන් අල්ලාහ් ළඟ අනුමත විය යුතු නම් අප අනුගමනය කළ යුතු ක්‍රමවේදය ගැන සාකච්ඡා කර ලියන්න**

**නිවසේ පරිසරයෙන්: මේ දක්වා ඇති දුආවන් නිවසේ ඇති අය සමග එක්ව වනපෙත් කර එකිනෙකා නිවැරදි කර ගන්නා අතර දිගින් දිගට ම උසුරා එන ලෙස යොමු කරන්න**

**නිපුණතාව** 3.0 :ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන, ඒවයේ වැදගත්කම වටහාගෙන පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද, අනුගමනය කර ආදර්ශමත් ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි.

**නිපුණතා මට්ටම** 3.1 : ආගමික විද්වතුන්ට ගෞරව දක්වයි

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් ප්‍රතිඵල** :

- ආගමික විද්වතුන් සුවිශේෂව හඳුන්වයි.
- ආගමික උගතුන්ගේ වැදගත්කම ගෙන හැර දක්වයි.
- ආගමික විද්වතුන්ට ගෞරවාන්තිකව සලකයි.
- ආගමික විද්වතුන්ගේ සමාජීය වැදගත්කම පහදා දෙයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- කලීෆා හාරූන් අල් රෂීඩ් තම පුතුන් වන අමීන්, මඃමුන් යන දෙදෙනා ගුරුභවතෙකු ළඟ ඉගෙන ගැනීම සඳහා යවා තබා තිබුණි. දිනක් ගුරුතුමා කලීෆාවරයා බැහැ දැකීමට පැමිණෙමින් සිටියේ ය. මෙය දුටු යුවරජවරු දෙදෙනා තම ගුරුතුමා වූ එම විද්වතාගේ පාවහන් දෙක ඔසවාගෙන එතුමා පසුපසින් පැමිණියහ. එම අවස්ථාවේ එතැනට කලීෆාවරයා පැමිණියේ ය. යුවරජුන් ලවා තම පාවහන් ඔසවා ගෙන ඒමට සැළස්වීම ගැන කලීෆා වරයා තමනට දොස් නගයි කියා විද්වතා පසුතැවිලි වූයේ ය. එහෙත් සිදු වූයේ අනිකකි. කලීෆාතුමා සිනාමුසු මුහුණුන් යුක්තව අදයි මා මගේ ජීවිතයේ ඉතාමත් සතුටුදායක සිද්ධියක් දකින්නේ යැයි කියමින් තමගුරුතුමාගේ පාවහන් ඔසවාගෙන ආ යුව රජුන් දිරි ගැන්වූයේ ය.
- මෙම සිද්ධිය කතාවක් වශයෙන් පන්තියට කියා එයින් ලැබෙන ආදර්ශයන් එකක් හෝ දෙකක් සිසුන් ලවා කියවන්නට සලැස්වූ පසු පාඩම අරඹන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න
- අධ්‍යාපනයට වැදගත්කමක් හිමිකර දී ඇති ඉස්ලාම් එය ගෙන යන විද්වතුන්ගේ ගෞරවයට ද නියමිත තැනක් ලබා දෙන්නේ ය.
- ආගමික විද්වතුන් ඉස්ලාමීය සමාජයේ සැම දා ගෞරවයට පාත්‍ර කරනු ලැබූහ.
- සමාජය ස්වර්ගය වෙත කැඳවා ගෙන යෑම සම්බන්ධයෙන් උගතුන්ගේ දායකත්වය ඉමහත් ය.
- උගතුන් නබිවරුන්ගෙන් පැවත එන්නන් ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සූදානම් වන ලෙස දන්වන්න

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- මෙලොව හා පරලොව ජීවිතය සඳහා වැදගත්වන අධ්‍යාපනයක් ලැබූ අය උගතුන් ය.
- ඔබ අතර සිටින විශ්වාසවන්තයින්ගේ සහ අධ්‍යාපන දැනුම ඇති අයගේ තත්ත්වය අල්ලාහ් උසස් කරන්නේ ය. (58:11)
- අල්ලාහ්ගේ ගැත්තන් අතරින් ඔහුට බිය වන්නන් විද්‍වතුන් ය(35:28)
- නබි තුමණි පවසන්න උගතුන් හා නූගතුන් සමාන වෙනවා ද(39:9)
- මුහුදේ සහ පොළවේ සිටින සියලුම මැවුම් සියලුම උගතුන් වෙනුවෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේ ය. (තිර්මිදි)
- උගතුන්ගේ අයිතිවාසිකම් නොදන්නා අය මගේ උම්මතයට අයත් අයකු නොවේ. (අහ්මද්)
- මගේ පිටුපසින් ඔබ අතර ඇති යහපත් අය සහ උගතුන් සිටිත් වා (මුස්ලිම්)
- මට දැනුම ලබා දුන් අයකුට මම වහළකු වන්නෙමි. (අලි රළි)
- ඉමාම්වරුන්ගෙන් හදීස් ඉගෙන ගන්නට යන සිසුන් ඉතා කීකරුව හා යටහත් පහත්ව තම කටහඬ පවා පහත් කොට කිසිවක් සම්බන්ධයෙන් ඔවුන් පසුනොකර ක්‍රියා කළ යුතු ය.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: ආගමික උගතුන්ට ගෞරව දක්වන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කර ලියන්න.**

**කණ්ඩායම 2: ආගමික උගතුන්ගේ වැදගත්කම, ගෞරවය, ගැන පවසන අල්කුර්ආන් වාක්‍ය ගොනු කර ලියන්න.**

**කණ්ඩායම 3: ආගමික උගතුන්ගේ වැදගත්කම, ගෞරවය, ගැන පවසන නබි වදන් ගොනු කර ලියන්න.**

**කණ්ඩායම 4: ආගමික උගතුන්ගේ සමාජ තත්ත්වයේ වැදගත්කම ගැන සාකච්ඡා කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: අතීතයේ දී උගතුන් ගෞරව කරනු ලැබූ ආකාරය ගැන දෙමව්පියන් සමග සාකච්ඡා කර ඒවා ක්‍රියාත්මක කිරීමට යොමුවන්න.**

**නිපුණතාව 3.0 : ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන ඒවයේ වැදගත්කම වටහාගෙන පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර ආදර්ශමත්ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි.**

**නිපුණතා මට්ටම 3.2 : දුර්ගුණවලින් වැළකී කටයුතු කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- දුර්ගුණ යන්න අර්ථකථනය කරයි.
- දුර්ගුණ ලැයිස්තු ගත කර දක්වයි.
- දුර්ගුණවලින් වැළකී කටයුතු කරයි.
- දුර්ගුණ නිසා පුද්ගලික ජීවිතයේ හා පොදු ජීවිතයේ ඇතිවන බලපෑම් ලියා දක්වයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- සූරතුල් හුජ්රාතයේ 11වන වාක්‍යයේ පරිවර්තනය සමග ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ සිසුන්ගේ අදහස් අසා දැන පාඩම් ප්‍රවේශය කරන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- ඉස්ලාම් යහගුණයන් අවධාරණය කරන අතර දුර්ගුණවලින් වැළකී සිටින ලෙස දේශනා කරයි.
- දුර්ගුණය මිනිසාගේ ලක්ෂණය නොවන අතර කිසිවක් එයට කැමැති වන්නේ ද නැත.
- අල්කුර්ආනය සහ සුන්නාහ්ව දුර්ගුණයන්ගෙන් වැළකී සිටින ලෙස අවධාරණය කරයි.
- දුර්ගුණයන් පුද්ගකලික ජීවිතය හා පොදු ජීවිතය කෙරෙහි බලපෑම් ඇති කරයි.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර ස්ථිර කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- අල්ලාහ් සහ නබි සල් තුමා වැළැක්වූ හා ජනතාව විසින් පිළිකුළ කළ අන් අයට හිත් වේදනාව ගෙන දෙන ගතිගුණ දුර්ගුණ නම් වන්නේ ය.
- යහගුණ පරිපූර්ණ කිරීම සඳහා මම දූතයකු කොට යවනු ලැබුවෙමි. (මාලික්)
- බොරුව, කේලම, තරහව, ඕපාදූප, නම් පටබැඳීම, සමච්චල් කිරීම, සැකය, හදිසි කෝපය, ඊර්ෂ්‍යාව, ආඩම්බරකම, අපහාස කිරීම අපවාද නැගීම, පොරොන්දු කඩකිරීම, දොස් කීම, දබර කර ගැනීම, තර්ක විතර්ක කිරීම, ආධිය දුර්ගුණයන්ට උදාහරණ වන්නේ ය.
- ඊමාන්ධාරිනි, වැරැදි සිතුවිලිවලින් වැළකී සිටින්න. සමහර සිතුවිලි පාපි ඒවා ය. (49:1)
- සත්‍යය කතා කරන්න. එහි ඔබගේ විනාශය ඇති බව දැන ගත්ත ද සත්‍යම කතා කරන්න. මක් නිසා ද යත් අවසානයේ ඔබගේ ජයග්‍රහණය ඇත්තේ එහිය. (ඉබ්නු අබිද් දුන්යා)
- කේලම් කියන්නා ස්වර්ගයට පිවිසෙන්නේ නැත.(බුහාරි, මුස්ලිම්)
- කෝපය ෂයිතාන්ගේ බලපෑමේ ප්‍රතිඵලයකි.
- කවරකුගේ හිතෙහි අංශු ප්‍රමාණයක හෝ උඩංගුකමක් වේ ද ඔහු ස්වර්ගයට පිවිසෙන්නේ නැත. (මුස්ලිම්)
- ඔබගේ සොයුරාගේ දුක දැක සතුට ප්‍රකාශ නොකරන්න. අල්ලාහ් ඔහුට කරුණාව දක්වා ඔබට දුක් වේදනාව ලබාදිය හැකිය. (තිර්මිදි)
- කතා ගොතා පතුරවන කිසිවකු ස්වර්ගයට පිවිසෙන්නේ නැත.(බුහාරි)
- තම දිවෙන් නරක කරුණු කතා කරන්නා සහ නරක වචන කියන්නා අල්ලාහ් පිළිකුල් කරයි.
- අල්ලාහ් විසින් ඉතාමත් පිළිකුලට පාත්‍රවන්නන් තර්ක විතර්ක කරන්නන් ය(බුහාරි)
- ඔබගේ සොයුරා සමග තර්ක විතර්කවල නොයෙදෙන්න. ඔවුන්ට සමච්චල් නොකරන්න. පොරොන්දුවක් වූයේ නම් කඩ නොකරන්න. (තිර්මිදි)
- ගින්න දර අළු බවට පත්කරන්නාක් මෙන් ඊර්ෂ්‍යාව යහක්‍රියා අළු බවට පත් කරන්නේ ය.

- මුස්ලිම්වරයකුට බැණීම නරක ක්‍රියාවකි. ඔහු මරා දැමීම දෙවියන් ප්‍රතික්ෂේප කිරීම වන්නේ ය. (මුස්ලිම්)
- දුර්ගුණය නිසා ඇතිවන බලපෑම්
- සිතේ සැනසුම නැති කරයි.
- සිත අඳුරුවන්නේ ය.
- කුසල් කෙරෙහි පිළිකුළක් ඇති වේ.
- පාපි ක්‍රියා කෙරෙහි කැමැත්තක් ඇති වන්නේ ය.
- මතභේද හි බෙදීම් ඇති වන්නේ ය.
- දෙවියන්ගේ දඬුවම් ඇති වන්නේ ය.
- මිනිස් සම්බන්ධතා අයහපත් වන්නේ ය.
- සමාජ සම්බන්ධතා ඉවත්වන්නේ ය.
- යහගැත්තන් සමග ඇති සම්බන්ධතා නැති වන්නේ ය.
- අනවශ්‍ය ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවන්නේ ය.
- සමාජ විරෝධි අයකු බව හඳුනා ගන්නා අවස්ථාවක් ඇති වන්නේ ය.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් පරිධි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණයක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: පාසල් පරිසරයේ දී ඔබ වළක්වා ගත යුතු දුර්ගුණ හඳුනාගෙන ඒවා වළක්වා ගන්නා ආකාරය හා විධික්‍රම සාකච්ඡා කර ලියන්න.**

**කණ්ඩායම 2: දුර්ගුණ පුද්ගලික ජීවිතය කෙරෙහි ද සමාජ ජීවිතය කෙරෙහි ද ඇති කරන බලපෑම ලියන්න.**

**කණ්ඩායම 3: දුර්ගුණ වළක්වා ගැනීම අවධාරණය කරන අල්කුර්ආන් වාක්‍ය හා අල්හදීස් වාක්‍ය පහක් සොයා ලියන්න.**

**කණ්ඩායම 4: දුර්ගුණ වැළක්වීම අවධාරණය කර අත්පත්‍රිකාවක් සකස් කරන්න.**

**නිවසේ පරිසරයෙන්: නිවසේ ඇතිවන්නාවූ දුර්ගුණ දෙමව්පියන් සමග එක්ව ලැයිස්තු ගත කරන්න. ඒවා වළක්වා ගැනීමේ ක්‍රම හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට යොමුවන්න.**

**නිපුණතාව** 3.0 **:ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන ඒවයේ වැදගත්කම වටහාගෙන පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර ආදර්ශමත්ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි.**

**නිපුණතා මට්ටම** 3.3 **: දරුවන් සමග සුහදව හැසිරෙයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- දරුවන්ගේ ගුණාංග ලැයිස්තු ගත කරයි.
- දරුවන් සමග කරුණාවෙන් හැසිරෙන ආකාරය කියා දෙයි.
- නබි සල් තුමා දරුවන් සමග හැසිරුණු ආකාරය ගෙන හැර දක්වයි.
- දරුවන්ට කරුණාව දැක්වීමට අදාළ හේතු විස්තර කර දක්වයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- නබි (සල්) තුමා අබ්බාස් (රළි) තුමාගේ දරුවන් වන අබ්දුල්ලාහ්, උබයිදුල්ලාහ් සහ කුසයියි රළි යන තිදෙනා පෙළට සිටවා කවරකු මා වෙත පළමුව පැමිණෙනවාද ඔහුට මේ මේ දේවල් ලැබෙන්නේ ය යැයි කියන්නාහ. දරුවන් නබි සල් තුමා වෙත දුවමින් එතුමන්ගේ පපුවේ සහ පිටෙහි වැටෙති. එවිට නබි සල් තුමා එම දරුවන් සිප ගනිති. (මුස්නත් අහමද්) මෙම සිද්ධිය කතාවක් ලෙස සිසුන්ට කියා බුද්ධි කලම්පනයක් ඇති කරන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- දරුවන් විවිධ වූ බලාපොරොතු සහ අවශ්‍යතා ඇති අය වෙති.
- ඔවුන් සතුව විවිධ ශක්තීන් ඇතිවාක් මෙන් දුබලතා ද ඇත.
- දරුවන්ගේ සිතුවිලි සහ හැඟීම් වටහාගෙන කටයුතු කිරීම වැදගත් ය.
- නබි සල් තුමා දරුවන් සමග හැසිරුණු ආකාරය සැම දාට ම සුදුසු පූර්වාදර්ශ වූ ක්‍රමයකි.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න
- දරුවන් ශාරීරිකව හා මානසිකව වැඩිහිටියන්ට වඩා දුර්වල අය වෙති.
- දරුවන්ට තමන් ය යමක් කළ යුතු ය යන දැඩි හැගීම් ඇති අය වෙති.
- දරුවන් ආදරය, ආරක්ෂාව, ඇගයීම යන මානසික අවශ්‍යතා වැඩි වශයෙන් ඇති අය වෙති.
- මුරණ්ඩුකම, අඬා තම අවශ්‍යතාවය ඉටු කර ගැනීම, වළක්වන දේ කිරීමට කැමැත්තක් දැක්වීම, අන්අයගේ දේවල් කෙරෙහි බලවත් කැමැත්තක් දැක්වීම, හදිසි කෝපය වැනි ලක්ෂණ දරුවන්ගේ ලක්ෂණ වන්නේ ය.
- දරුවන්ට කරුණාව දැක්වීම ඉස්ලාම් ඊමානයේ ලක්ෂණයක් වශයෙන් හඳුන්වන්නේය.
- කුඩා අය කෙරෙහි ආදරය නොදක්වන අය අප අතරින් කෙනෙක් නොවේ.(බුහාරි)
- තමා කෙතරම් ඉහළ තත්වයක් ඇති අයකු වුව ද ගරුසරු ඇතිව සිටිය ද එය කුඩා අය කෙරෙහි ආදරය දැක්වීමට බාධාවක් නොවිය යුතු ය.
- නබි තුමා කුඩා දරුවකු දුටු විට තම සෙනෙහස දක්වා සලාම් පවසන්නාහ.(බුහාරි)
- තම දරුවන්ට මෙන් ම සෑම දරුවන් කෙරෙහිම ආදරයෙන් හා කරුණාවෙන් හැසිරිය යුතු ය. ඔවුනට හොඳ දේ ම කියාදිය යුතු ය.
- අබ්දුල් රහ්මාන් බින් සහල් (රළි) තුමා නබිතුමාගේ සභාවේ වැඩිහිටියන් ඉදිරියෙන් කතා කිරීමට පටන් ගත් අවස්ථාවේදි වැඩිහිටියන්ට ගෞරව දක්වන්න යැයි නබි සල් තුමා ආදරයෙන් කියා දුන්හ.
- දරුවන්ගේ කැමැත්ත අකැමත්ත දැන ගත යුතු ය. නබි තුමා හසන් (රළි) හා හුසයින් (රළි) දෙදෙනාගේ අත් අල්ලා ඔවුන්ගේ පාද තම පාද මත තබා ඔබ උඩ නගින්න යැයි කියති.
- නබි තුමා දීර්ඝ වේලාවක් සුජූදයේ සිටීම ගැන නබි සල් තුමාගෙන් සහබාවරු විමසූ විට මුණුබුරා පුතා මා මත නැග සිටියේ ය යැයි කීහ.
- දරුවන් සමග වෙනසක් නොමැතිව සෙනෙහසින් හා සුහදභාවයෙන් යුක්තව හැසිරිය යුතුය.

- නබි තුමා යුදෙව් දරුවකු රෝගී වූ අවස්ථාවේ ඔහුගේ සුවදුක් විමසන්නට ගොස් හිස අසල වාඩි වී ඉස්ලාමය වැළඳ ගන්න යැයි කීහ. දරුවා ඉස්ලාමය වැළඳ ගත්තේ ය. දරුවා නිරයේ ගින්නෙන් ආරක්ෂා කළ අල්ලාහ් ට සියලු ප්‍රශංසා ඇති වේවා යැයි නබි තුමා කීවා හ.

- දරුවන්ගේ නරක චර්යා, වැරදි කතා, නරක සිතුවිලි, සාහසික ක්‍රියා ආදිය නැති කර ගැනීමට දායකත්වය සැපයිය යුතුයි

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් අනුව සුදුසු ඒවා යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: ළමා දිනයක දී ඉදිරිපත් කිරීම සඳහා ළමුන් කෙරෙහි ආදරය දක්වමු. යන මාතෘකාව යටතේ මිනිත්තු 3 කට නො අඩු කාලයක් සඳහා කතාවක් සකස් කරන්න.**

**කණ්ඩායම 2: ඔබට වඩා වයස අඩු අය සමග ආදරයෙන් හැසිරීම සඳහා සුදුසු ක්‍රම පහක් ලියන්න.**

**කණ්ඩායම 3: නබි (සල්) තුමා ළමුන් සමග ආදරයෙන් හැසිරුණු අවස්ථා දෙකක් සිද්ධි ගොනු කර ලියන්න.**

**කණ්ඩායම 4: ළමුන් සමග ආදරයෙන් නොහැසිරුණු අයකුට උපදෙස් දී ලිපියක් ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: ළමුන් සමග ආදරය දැක්වීමේ අවශ්‍යතාවය ගෙන හැර දක්වන ආකාරයේ ආදර්ශමත් සිද්ධීන් දෙමව්පියන් සමග සාකච්ඡා කර ලිවීමට මග පෙන්වන්න.**

**නිපුණතාව 3.0 : ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන ඒවයේ වැදගත්කම වටහාගෙන පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර ආදර්ශමත්ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි.**

**නිපුණතා මට්ටම 3.4 : අනාථයන් හා වැන්දඹුවන්ට උදව් කරයි**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- සමාජයේ දක්නට ලැබෙන දුබලයන් හඳුනා ගනියි.
- අනාථයන් වැන්දඹුවන් යන අය අර්ථකථනය කරයි.
- අනාථයන් හා වැන්දඹුවන්ගේ දුර්වලතා සොයා බලා අවශ්‍යතා ඉටු කරයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- මම සහ අනාථයන්ට උදව් උපකාර කළ අය ස්වර්ගයේ දී මෙසේ සිටිමු යැයි නබි සල් තුමා පවසා තම දබර ඇඟිල්ල සහ මැදි ඇඟිල්ල තරමක් ඈත් කර පෙන්වූහ. (බුහාරි) යන හදිසය කැමැත්තෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයකු ලවා කියවීමට සලස්වන්න.
- කියවූ හදීසයේ තේරුම අසා ඒ ගැන සිසුන්ගේ අදහස් විමසන්න.
- පහත කරුණු එළිදක්වන අයුරින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අනාථයන්, වැන්දඹුවන්, දුප්පතුන්, ශාරීරික ඌනතා ඇති අය, ස්ථිර රෝගීන් යන අය සමාජයේ දක්නය ලැබෙන දුබලයන් වෙති.
- මෙවැනි අයට උදව් කිරීම ආගමික යුතුකමකි.
- මෙමගින් මතු දිවියේ දී අල්ලාහ් ඉතා ඉහළ යහඵල ලබා දෙන්නේ ය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සුදානම් වන ලෙස දන්වන්න.

පියවර 3 :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- පියා නැති කෙනෙකුට අනාථ යැයි කියන්නෙමු. අරාබියෙන් ''මොවුනය'' යතීම් යැයි කියන්නෙමු.
- නබි සල් තුමා වැන්දඹුවන් විවාහ කරගෙන නව ජීවිතයක් ලබා දුන්හ.
- වැන්දඹුවන් සඳහා සහ අනාථයන් සඳහා සටන් කරන අය අල්ලාහ් ගේ මාර්ගයේ යුක්තිය පතා සටන් කරන්නන් ය. (බුහාරි)
- කුසගින්නේ සිටින්නන්ට කෑම දෙන්න. රෝගීන් ගෙන් සුව දුක් විමසන්න. අත්අඩංගුවට පත් අය නිදහස් කරන්න.
- දුබලයන්ට උදව් කරන අවස්ථාවේ අල්ලාහ් අපට දයාව දක්වයි.අපට සෞභාග්‍යයන් ලබා දෙයි.
- මා වෙනුවෙන් දුබලයන් සොයා බලන්න. මක් නිසා ද ඔබ උදව් කරනු ලබන්නේත් ඔබට ආහාර ලබා දෙන්නේත් ඔබ අතර සිටින දුබලයන් නිසා ය. (අබූ දාවූද්)
- ගැත්තෙක් තම සොයුරාට උදව් කරන තාක් කල් අල්ලාහ් එම ගැත්තාට උදව් කරන්නේ ය. (මුස්ලිම්)

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: පහත සඳහන් අල්කුර්ආන් වචනවල පරිවර්තනය කියවා හොඳින් සාකච්ඡා කර ඒවායින් අපගේ ජීවිතයට ලබා ගත හැකි ඉගෙනුම් ලියන්න.**

**සූරතුල් ලුහා - 9 සූරතුල් මාඌන් - 1-3**

**කණ්ඩායම 2: අනාථවූ අයට සහාය වීම පිළිබඳ ව ඇති හදීස් තුනක් සොයා ලියන්න.**

**කණ්ඩායම 3: පහත සඳහන් අල්කුර්ආන් වචනවල පර්වර්තනය ලියා එහි අදහස් සාකච්ඡාකර යාචකයන් සමග අප කටයුතු කළ යුත්තේ කෙසේද යන්න ලියන්න.**

**සූරතුල් ලුහා 10**

**කණ්ඩායම 4: ආබාධිතයන්ට උදව් කළ හැක්කේ කෙසේ ද යන්න සාකච්ඡා කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: පවුලේ සාමාජිකයන් සමග එක්ව අන් අයට උදව් කිරීම සම්බන්ධ සාකච්ඡා කර දුබලයන්ට උදව් කිරීමට යොමු කරවන්න.**

**නිපුණතාවය** **3.0 :ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන ඒවයේ වැදගත්කම වටහාගෙන පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර ආදර්ශමත් ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි.**

**නිපුණතා මට්ටම** **3.5 : පාපයන්ගෙන් වැළකී කටයුතු කරයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- පව හෝ අකුසල යන්න අර්ථකථනය කරයි.
- පව් ලැයිස්තුවක් සකස් කරයි.
- පව් පිළිබඳ ඉස්ලාමීය අදහස ඉදිරිපත් කරයි.
- පාපි ක්‍රියා නිසා පවුල්වල ඇති වන බලපෑම් ලියා දක්වයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- සූරතුල් හුජ්රාත් හි 11,12 යන වචන සිසුවකු ලවා පාරායනය කිරීමටත් එහි පරිවර්තනය කියවීමටත් සළස්වන්න.
- පහත කරුණු මතුවන අයුරින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඉස්ලාම් පාපි ක්‍රියාවලින් වැළකී සිටින ලෙස අණකරයි.
- පාපි ක්‍රියා මිනිසාගේ අධ්‍යාත්මික හා ලෞකික ජීවිතය කෙරෙහි බලපායි.
- පව් ගැන ද ඒවායින් ඇති වන බලපෑම් ගැනද අල්කුර්ආනය සහ සුන්නාහ් පවසන්නේ ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.

- පහත කරුණු  අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- අල්ලාහ් සහ ඔහුගේ වක්තෘන් වූ මුහම්මද් සල්ලල්ලාහු අලයිහිවසල්ලම් නොකරන්නයි වැළකූ සියල්ල පාපි ක්‍රියා ය.
- නබි සල්ලල්ලාහු අලයිහිව සල්ලම් තුමා ක්‍රියාවන් පහක් දැඩි අපරාධ වශයෙන් හඳුන්වා ඇත.

  1. අල්ලාහ් ට යමක් සම කිරීම.
  2. හූනියම් කිරීම.
  3. මිනීමැරුම.
  4. පොලියෙන් ජීවත්වීම.
  5. අනාථයන්ගේ දේපළ තමන් භාවිත කිරීම
  6. ජිහාදයේ දී පලා යෑම
  7. පතිවත් කාන්තාවකට අපවාද කිරීම

- මේවාට අමතරව තවත් සමහර පාපි ක්‍රියා ගැන ද අල්කුර්ආන් හා සුන්නාහ් පවසයි යන ඒවා
- දෙමව්පියන්ට හිංසාකිරීම, නම් පටබැඳීම, සමච්චල් කිරීම, පුරසාරම් දෙඩීම, කේළාම් කීම, ඕපාදූප කතා කිරීම, බොරු කීම,සියදිවි හානි කර ගැනීම වැනි ඒවාය.
- පාපී ක්‍රියා හේතුවෙන් සිත අඳුරු වන්නේ ය.
- පාපී ක්‍රියා හේතුවෙන් තනි පුද්ගලයා මෙන්ම සමාජය ද බලපෑමට ලක් වන්නේය.
- දේවබිය, හොඳ පරිසරය, හොඳ මිතුරුකම, මිනිසා පාපයෙන් මුදා ගත්තේය. (උදාඃ මිනිසුන් සියදෙනකු ඝාතනය කළ මිනිසාගේ කතාව)
- පව් ගැන ද ඒවායේ ප්‍රතිඵල ගැන ද අල්කුර්ආන් හා සුන්නාහ් සඳහන් කරයි

  ''ඔබට වළක්වන ලද මහා පාපයන්ගෙන් වැළකී සිටියේ නම් ඔබගේ වෙනත් සුළු පාපවලට සිය අප ප්‍රතිකර්මය කර ඔබ ඉතා ම ගෞරවනීය ස්ථානවලට ඇතුළත් කරවන්නමු.(4:31)

යහපත් චර්යාව යහපතකි පව් යන්න එය කරනවිට ඔබගේ ඇතුළු මනස අවධාරණය කිරීමත් එය අන් අයට එළිකිරීමත් ය. විට ඔබ පිළිකුල් කිරීමත් ය. (මුස්ලිම්)

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: පව් නිසා ඇති වන සමාජමය බලපෑම් ගැන සාකච්ඡා කර ලැයිස්තුවක් සකස් කරන්න.**

**කණ්ඩායම 2: පව් පුද්ගලයකුගේ ජීවිතයේ ඇති කරන බලපෑම් ගැන සාකච්ඡා කර ලියන්න.**

**කණ්ඩායම 3: පව් කිරීමෙන් වැළකී සිටීමට හැකි පිළිවෙත් සාකච්ඡා කර ලියන්න.**

**කණ්ඩායම 4: තර්ජමාවෙහි උදව්වෙන් සූරතුල් හූජ්රාත්හි 11,12 වචනවලින් සඳහන් පව් ලැයිස්තු ගත කරන්න.**

**නිවසේ පරිසරයෙන් : පව් කිරීම හේතුවෙන් විවිධ සමාජ අල්ලාහ් විනාශ කළ බව අල්කුර්ආනය පවසන්නේ ය. එසේ නැතිවූ සමාජ ගැනද ඒ සඳහා වන හේතු ද සාකච්ඡා කර ලියාගෙන එන ලෙස දන්වන්න.**

**නිපුණතාව** **3.0 :ඉස්ලාම් පවසන යහ ලක්ෂණ දැන ඒවයේ වැදගත්කම වටහාගෙන, පෞද්ගලික ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර ආදර්ශමත්ව ජීවත්වන අතර අන් අයට ද මග පෙන්වයි.**

**නිපුණතා මට්ටම** **3.6 : සියල්ලන්ම විශ්වාසයෙන් හා අවංකත්වයෙන් යුක්තව ක්‍රියා කරයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- අවංකත්වය සහ විශ්වාසය යන්න අර්ථකථනය කරයි.
- පවුල් හා සමාජ ජීවිතයේ දී අවංකත්වය සහ විශ්වාසිභාවයේ වැදගත්කම ගෙන හැර දක්වයි.
- අවංකත්වයෙන් හා විශ්වාසයෙන් යුක්තව ජීවත් විය යුතුය යන්නට සාධක ඉදිරිපත් කරයි.
- විශ්වාසය හා අවංකත්වය අඩුවන විට සමාජයේ ඇතිවන බලපෑම පැහැදිලි කරයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- නබි සල් තුමා අල්අමීන් යැයි සුවිශේෂ නමින් හඳුන්වනු ලැබීමට හේතු කුමක් දැයි සිසුන්ගෙන් අසන්න. ඔවුන් ඉදිරිපත් කරන හේතු සාකච්ඡා කර පාඩමට ප්‍රවේශ වන්න.
- පහත කරුණු මතුවන අයුරින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- විශ්වාසය සහ අවංකත්වය යනු ඍජුබව සහ පොරොන්දු කඩ කිරිම යන අදහස් ලබා දෙන්නේ ය.
- ජිවිතයේ සියලු අවස්ථාවල ම විශ්වාසයෙන් හා අවංක ව හැසිරිය යුතු ය.
- නබි සල් තුමා කුඩා කාලයේ පටන් ම අවංක ව හා විශ්වාසවන්ත ව ජීවත් වූ නිසා එතුමාට අල්අමීන් යැයි හඳුන්වනු ලැබූ හ.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරික්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- විශ්වාසය හා අවංකත්වය යනු නබිවරුන්ගේ සහ සාලිහීන් වරුන්ගේ ලක්ෂණය වන්නේ ය. ඔවුන් ගැන පවසන අල්කුර්ආනය (ශක්ති වන්තයන්, විශ්වාසවන්තයින් යැයි පවසයි.) (28:26)
- අවංකකම හා විශ්වාස වන්තකම නිසා කියාමාවේදි නබිවරු සමග එකට සිටීමේ වාසනාව ලබා දෙන්නේ ය.
- අවංකකම හා විශ්වාසවන්තකමින් යුක්තවූ වෙළෙන්දා නබිවරු සිද්දිබ්කීන්වරු (සත්‍යවාධීන්) ෂුහදාවරු (අල්ලාහ්ගේ මාර්ගයේ)සමග සිටිති. (ඉබ්නු මාජා)
- පොරොන්දු ආරක්ෂා කිරීම ද, පොරොන්දු ඉටුකිරීම ද, අවංකත්වයේ ලක්ෂණයකි.
- විශ්වාසවන්තයිනි ඔබ පොරොන්දු සම්පුර්ණයෙන්ම ඉටුකරන්න.(5:1)
- ඔබගේ පොරොන්දු ඔබ පූර්ණ වශයෙන් ම ඉටුකරන්න. මක්නිසාදයත් (කියාමාවේදී) පොරොන්දු ගැන අනිවාර්යයෙන්ම අසනු ලබන්නේ ය.(17:34)
- අවංකකම සහ විශ්වාසවන්තයින් (අමානත්)විශ්වාසය නිසා පවරන ලද්දක් ආරක්ෂා කරයි. දිවුරූ දේ ඉටුකරයි.
- මිනිසකු තවත් මිනිසකු වෙත කිසියම් කරුණක් කියා එය රහසින් තබා ගත යුතු යැයි ඉල්ලුවිට එය ඔහුට පවරන ලද එක් භාරදෙන්නක් (අමානතය) වන්නේ ය.
- විශ්වාස කඩකිරීම මුනාෆික් වරුන්ගේ ලක්ෂණයකි.
- මිනුම් හා කිරුම්වල වංචා කිරීම, මුස්ලිම්වරයකුගේ ලක්ෂණය නොවේ. කවරකු අපට විරුද්ධව කඩුව ඔසවන්නේ ද, ඔහු අපගෙන් කෙනෙකු නොවේ. කවරකු අපට වංචා කරන්නේ ද ඔහුද අපගෙන් කෙනෙකු වීම. (මුස්ලිම්)
- දෙමව්පියන් - දරුවන්, දරුවන්-දෙමව්පියන්, සැමියා - බිරිඳ, බිරිඳ- සැමියා, ගුරුවරු -සිසුන්, සිසුන්-ගුරුවරුන්, සේවකයන්-ස්වාමීන්, ස්වාමීන්-සේවකයන් වැනි අය එකිනෙකාට විශ්වාසවන්තව සහ අවංකව කටයුතු කළ යුතු ය.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි යි

**ඇගයීම් හා තක්සේරුකරනය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: විශ්වාසය සහ අවංකකම පවත්වා ගැනීම නිසා පාසලේ සහ සමාජ ජීවිතයේ ඇති විය හැකි කුසලයන් ලැයිස්තුවක් දක්වන්න.**

**කණ්ඩායම 2: විශ්වාසය සහ අවංකකම සුරැකීම නිසා පාසල් ජීවිතයේ සහ සමාජ ජීවිතයේ ඇතිවිය හැකි බලපෑම් ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 3: විශ්වාසය හා අවංකකම ගැන ඔබ අසා ඇති සිද්ධියක් විස්තරාත්මකව ලියන්න.**

**කණ්ඩායම 4: විශ්වාසය සහ අවංකකම අවධාරණය කර උදේ රැස්වීමක දී පවත්වන මිනිත්තු තුනකට නො අඩු කතාවක් සකස් කරන්න.**

**නිවසේ පරිසරයෙන්: විශ්වාසවන්තව හා අවංකව කටයුතු කළ අවස්ථා ගැන දෙමව්පියන්ගෙන් අසා එය පන්තියේ අනික් සිසුන් සමග බෙදා ගැනීමට මග පෙන්වන්න.**

**නිපුණතාව** 4.0 : **ඉස්ලාමයේ මූලාශ්‍ර ගැන පැහැදිලි අවබෝධයක් ලැබ ඒ අනුව තම ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම** 4.1 : **අල්කුර්ආනය පාරායනය කිරීමේ වැදගත්කම ගැන දැන දිනපතා එය නිවැරදිව පාරායනය කරයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- තිලාවතුල් කුර්ආන් යන්න පැහැදිලි කරයි.
- තිලාවතුල් කුර්ආනයේ පිළවෙළ දැන පාරායනය කරයි.
- තිලාවතුල්කුර්ආන්හි අධ්‍යාත්මක හා ලෞකික ප්‍රයෝජන ලැයිස්තු ගත කරයි.
- අල්කුර් ආනයේ තමා දන්නා කොටස් අන් අයට උගන්වයි.

**පාඩමසැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- අල්කුර්ආනය අලංකාර ලෙස පාරායනය කළ හැකි සිසුන් දෙදෙනකු ලවා සූරාහ් අල් කහ්ෆ් හි 32 සිට 44 තෙක් ඇති වාක්‍යවල සඳහන්වන යහළුවන් දෙදෙනකුගේ සිද්ධිය කතාවක් වශයෙන් කියා එයින් ලැබෙන ආදර්ශයන් එකක් හෝ දෙකක් සිසුන් ලවා කියන්න සලැස්වූ පසු පාඩම අරඹන්න.
- අල්කුර්ආනය පාරායනය කිරීමේ වැදගත්කම ගැන සිසුන්ගෙන් අසා දැන ගන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- තිලාවතුර් කුර්ආන් යනු අල්කුර්ආනය පරායනය කිරීම යන්නයි.
- අල්කුර්ආනය පාරායනය කිරීමේ ක්‍රමයක් ඇත. පරායනය කළ යුත්තේ එම ක්‍රමය අනුගමනය කිරීමෙන්ය.
- අල්කුර්ආනය පාරායනය කිරීම මෙලොවෙහි හා පරලොවෙහි ආනිශංස ගෙන දෙන්නකි.
- අල්කුර්ආනය ඉගෙනීම හෝ ඉගැන්වීම ඉබාදතයකි.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ක්‍රියාකාරකම් පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක් ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- අල්කුර්ආනය ඔබට හැකි පමණින් පාරායනය කරන්න. 73:20

  අල්කුර්ආනය නිවැරදි උච්චාරණය ඇතිව සහ අර්ථය දැන පාරායනය කිරීම සිතට සතුට ගෙන දෙන්නකි.
- තවද අල්කුර්ආනය හොඳින් නිවැරදිව පාරායනය කරන්න. (73:4)
- කුර්ආනය නිවැරදිව පාරායනය කරන්නන් සමග ඉතා උතුම් කීකරු මලායිකාවරු සිටිති. වාක්‍ය පටලව පටලවා අමාරුවෙන් පාරායනා කරන්නකුට වුව ද දෙගුණයක් කුසලයක් ලැබෙන්නේ ය.(බුහාරි)
- අල්කුර්ආනය පාරායනය කරන්න. එය පාරායනය කළ අයකුට කියාමා දිනයේ දී පක්ෂව කතා කරන්නකි. (මුස්ලිම්)
- කවුරුන් අල්ලාහ්ගේ ආගමේ වචනයන්ට සවන් දෙන්නේ ද ඔහුට කිහිප ගුණයක කුසලයන් හිමි වන්නේ ය. කවුරුන් එය පාරායනය කරන්නේ ද ඒ අයට එය ආලෝකයක් වන්නේ ය. (අහ්මද්)
- කුර්ආනය ඉගෙන අන් අයට ඉගැන්වීමෙන් සිත ප්‍රාණවත් වන්නේ ය.
- කවරකු අල්ලාහ්ගේ (ආගමික) වචනයට සවන් දෙන්නේ ද ඔහුට කිහිප ගුණයකින්ම කුසලයන් හිමි වන්නේ ය. කවරකු එය පාරායනය කරන්නේ ද එය ඔහුට කියාමාවේ දී ආලෝකය වන්නේ ය.(අහමද්)
- ඔබගෙන් යහපත් පුද්ගලයා තමා ද අල්කුර්ආනය ඉගෙන අන් අයට ද උගන්වන්නා ය. (බුහාරි)
- කවරකුගේ සිතෙහි සුළු ප්‍රමාණයක් හෝ කුර්ආනය කටපාඩම්න් නොමැත්තේ ද ඔහුගේ සිත පාළු වූ ගෙයක් වැනි ය. (තිර්මිදි)

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් එල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ක්‍රියාකාරකම්ය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: අල්කුර්ආනය පවසන යහපත් දේ ගැන තක්සේරු කර ගැනීමට අදාළ නිර්ණායක සකස් කරන්න.**

**කණ්ඩායම 2: අල්කුර්ආනය පාරායනය කිරීමේ දී සැලකිල්ලට ගන්නා නීති පහ හා එහි පහදා දීම සඳහන් කරන්න.**

**කණ්ඩායම 3: තිලාවතුල් කුර්ආන් ගැන සඳහන් හදීස් හා අල්කුර්ආනයේ වචන ගොනු කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: අල්කුර්ආනයේ සූරාවන් වටහා ගැනීමට තර්ජමතුල් කුර්ආනය භාවිතයට ගෙන එහි අවසාන සූරා 10 නිවසේ දී සහෝදර සහෝදරියන් සමග එක්ව පාරායනය කර එහි පරිවර්තනය කියවීමට යොමු කරවන්න.**

**නිපුණතාව 4.0 : ඉස්ලාමයේ මූලාශ්‍ර ගැන පැහැදිලි අවබෝධයක් ලැබ ඒ අනුව තම ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 4.2 : අල්කුර්ආනය කුඩා සූරාවන් නිවැරදිව පාරායනය කර තේරුම වටහාගෙන හැසිරෙයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- සූරා අල් මාඌන් හි පද අර්ථය කියවයි.
- ආගම සහ කියාමා දිනය බොරු කරන්නා ගැන දැන අන් අයට ද කියයි.
- මිනිසුන් සමග යහපත් අයුරු කටයුතු කරන ආකාරය ගැන දැන අන් අයට ද ගෙන හැර දක්වයි.
- සූරා මාඌන් හි තේරුම දැන පාරායනය කරයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- අල්කුර්ආනය අලංකාර ලෙස පාරායනය කළ හැකි සිසුවකු ලවා සූරා මාඌනය අලංකාර ලෙස පාරායනය කිරීමට සලස්වන්න. නැතහොත් පටිගත කර සවන්දීමට සළස්වන්න.
- මෙම සූරාව විසින් අවධාරණය කරන කරුණු ගැන අසා අදහස් හුවමාරු කර ගන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- සූරා මාඌන් යනු නබි සල් තුමාගේ මක්කා ජීවිතයේ පහළවූ කුඩා සූරාවකි.
- මෙම සූරාහි ආගම ප්‍රතික්ෂේප කරන්නාගේ ලක්ෂණ දක්වයි.
- මෙම සූරාහි ඇතුළත් ''දීන් '' යන වචනයට ආගම, කියාමා දිනය වැනි අදහස් විසින් ඉදිරිපත් කෙරෙන්නේ ය.
- එය පාරායනය කිරීම, වනපොත් කිරීම, කියාමා දිනය වැනි අදහස් ක්‍රියාත්මක කිරීම විද්වතුන් ඉදිරිපත් කර සිටිති.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ක්‍රියාකාරකම් පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක් ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡා මෙහෙයවන්න.
- ආගම බොරුකරන්නා කවුද යැයි ප්‍රශ්න කර ඔහුගේ ලක්ෂණ වෙනස් කෝණයකින් ඉදිරිපත් කර පහදා දී ඇත.
- සීරා දෘෂ්ටිය අනුව කියාමා දිනය බොරු කරන්නාගේ ලක්ෂණ පහත අයුරින් විස්තර කළ හැකි ය.
  - අනාථයන් එළවා දමයි
  - දුප්පතුන්ට ආහාර නොදෙයි.
  - ඉතා සුළු දෙයක් හෝ අන් අයට අතමාරුවට දීමට අකැමති වෙයි.
  - අන්අයට පෙන්වීම සඳහා සලාතය ඉටු කරයි.
  - සලාතය ගැන අවධානයකින් තොරව පසුවෙයි.
- සූරා මාඌන් ඉදිරිපත් කරන ප්‍රධාන අදහස් මෙසේ ය.
  - නැති බැරි අයට උදව් කිරීම වැදගත් ය.
  - අනාථයන් සහ දුගීන් ට උදව් කිරීම වැදගත් ය.
  - සලාතය ගැන සැළකිල්ලෙන් පසු විය යුතු ය.

ඔබ දුටුවා ද ආගම බොරු කරන්නන්,
අනාථයන් එළවා දමන්නේ ය ; දුප්පතුන්ට ආහාර දීම. පොළඹවන්නේ නැත.
සලාතධාරීන් ට පිරිහීම. සලාතයේ සැලකිලිමත් නොවෙති.
ඉතා සුළු දෙයක් වුවත් දීමෙන් වැළකී සිටිති.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම්ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණයක සකස් කර ගන්න.

**කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1: සූරතුල් මාඋන් ඉගෙනීමෙන් පසුව ඔබගේ සිතෙහි ඇති වූ හැඟීම් සාකච්ඡා කර ලියන්න**

**කණ්ඩායම 2: එදිනෙදා ජීවිතයේ පිළිපැදීම සඳහා ඔබ මෙම සූරාවෙන් උගත් පාඩම් ගැන ලියන්න.**

**කණ්ඩායම 3: සූරතුල් මාඋනය අරාබියෙන් ද එහි තේරුම සිංහලෙන් ද ලියා ප්‍රදර්ශනය කරන්න.**

**නිවසේ පරිසරයෙන්: අනාථයන්ට උදව් පදව්කිරීම නැතහොත් දුප්පතුන්ට ආහාර දීම සම්බන්ධයෙන් ඇති හදීස දෙකක් දෙමව්පියන් සමග සාකච්ඡා කොට ලිවීමට යොමු කරන්න.**

**නිපුණතාව 4.0 : ඉස්ලාමයේ මූලාශ්‍ර ගැන පැහැදිලි අවබෝධයක් ලැබ ඒ අනුව තම ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 4.3 : අල්හදීසුල් කුද්සි, අල් හදීසුල් නබවි යන්නට උදාහරණ ඉදිරිපත් කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- හදීස් වර්ග දෙක වෙන්කොට පැහැදිලි කරයි.
- හදීස් කුද්සි සඳහා උදාහරණ දක්වයි.
- හදීස් නබවි සමහරක් වනපොත් කර අන් අයට ද පවසයි.
- තමන් උගත් හදීස්වල තේරුම දැන ඒවා ක්‍රියාවට නංවයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- තමන් හඳුනන ආකාර දෙකක කුඩා හදීස් දෙකක් කළුලෑල්ලේ ලියා එය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කර පාඩම් ප්‍රවේශය සිදු කරන්න.
- උදාහරණ සව්මය හැර මිනිසාගේ සියලු අමල් ඔහු සතු ඒවා ය. සව්මය මා සතුය. එයට අදාළ කුලිය දෙනුයේ මමය. යැයි අල්ලාහ් පැවැසූ බව නබි සල් තුමා පවසා ඇත.
- සව්මය පළිහකි. එමගින් අයකු නිරයෙන් ආරක්ෂාව ලබන්නේය යැයි නබි සල් අලයිහිවසල්ලම් තුමා පැවැසූහ.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න
- හදීස් ආකාර දෙක අතර වෙනස්කම් ඇත.
- අල්ලාහ්ගේ අදහස නම්, අල් හදීස් කුද්සිය වන්නේ ය.
- නබි සල් තුමා තම අදහස තම භාෂා රටාවෙන් දැක්වීම හදීසුල් නබවි වන්නේය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ක්‍රියාකාරකම් පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- ඉස්ලාමයේ පදනම් මූලාශ්‍රවලින් දෙවන ස්ථානය අයත් වන්නේ සුන්නා ටය.
- නබි සල් තුමාගේ කාලයේ පටන් අද දක්වා සුන්නාහ් විධිමත් ව ආරක්ෂා කර පවති.
- මුස්ලිම්වරු සුන්නා පිළිබඳ මූලික දැනුම ලබා ගැනීම වැදගත් ය.
- සුන්නාහ්වල සහාය නැතිව අල්කුර්ආනය වටහා ගැනීම හෝ එහි අණ ක්‍රියාත්මක කිරීම හෝ කළ හැක්කක් නොවේ.
- අල්කුර්ආනය මෙන් ම රසූල් සල් තුමාගේ සුන්නාහ් අනුමත කිරීම ද, එය අනුගමනය කිරීම ද, මුස්ලිම්වරුන්ගේ යුතුකම වන බව අල්කුර්ආනය විවිධ අවස්ථාවල අවධාරණය කරන්නේ ය.
- අපගේ දූතයාණන් ඔබට හිමිකර දුන් දෙය ඔබ ලබා ගන්න. ඔහු කුමක් වැළක්වූයේ ද එයින් වැළැකී සිටින්න. (59:7)
- නබි තුමනි ඔබ තවදුරටත් පවසන්න. අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන්ට ඔබ අවනත වන්න. එහෙත් ඔබ ප්‍රතික්ෂේප කළේ නම් අල්ලාහ් සැබැවින් ම ප්‍රතික්ෂේප කරන්නන් ට දයාව දක්වන්නේ නැත. (3:32)
- හදීස හදීස් කුද්සි හා හදීස් නබවි යැයි බෙදා දැක්විය හැකි ය.
- හදීස් කුද්සි හා හදීස් නබවි අතර පහත සඳහන් වෙනස්කම් ඇත.

| හදීස් කුද්සි | හදීස් නබවි |
|---|---|
| 1. අල්ලාහ් පැවැසූ බව නබි සල් තුමා පැවසූ කරුණු ඇතුළත් ය. | 1. අල්ලාහ් හා සම්බන්ධ නොකර නබි (සල්) තුමා පැවැසූ කරුණු |
| 2. අන්තර්ගතය අල්ලාහ්ගේය භාෂා රටාව නබි (සල්) තුමාගේ ය. | 2. අන්තර්ගතය අල්ලාහ්ගේ ය. අදහස සහ පහදා දීම සහ භාෂාරටාව නබිතුමාගේ ය. |

දෙකටම අදාළ පොදු ලක්ෂණය වනුයේ දෙකම වහී පදනම් වූ ඒවා වීමය. පහත හදීස හදීස් කුද්සිය සඳහා උදාහරණ වන්නේ ය.

- අල්ලාහ් ගේ දෑත පිරිපුන් ය. රෑ දහවල් දන්පින් කළ ද එය ඉක්මවන්නට හැකි වන්නේ නැත.
- මාගැන සිතන ගැත්තා සමග මම සිටින්නෙමි. ඔහු මා මතක් කරන විට මම ද ඔහු සමග සිටින්නෙමියි. අල්ලාහ් පවසන්නේ ය.

පහත හදීස හදීස් නබවිය සඳහා උදාහරණ වන්නේ ය.

- අල්ලාහ් මත දිවුරා කියමි මම දිනකට හැත්තෑ වතාවක් අල්ලාහ් ගෙන් ඉස්තිග්ෆාර් කරන්නෙමි යැයි නබි සල් තුමා පවසනු මම අසා ඇත්තෙමි.
- කවරකු තම සොයුරාගේ නම්බුව රකින්නේ ද ඔහු අල්ලාහ් කියාමවේ දී නිරයෙන් ගලවා ගන්නේ ය.
- නබි සල් තුමා අබ්දුල් කයිස් යන කණ්ඩායමේ නායකයා වෙත බලා ඔබගෙන් අල්ලාහ් වැඩියෙන් ම කැමැතිවන බුද්ධිමත් හා තැන්පත් යන ලක්ෂණ දෙකක් ඇතැයි කීහ.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයීම් නිර්ණයක සකස් කර ගන්න.

**කණ්ඩායම් ක්‍රියාකාරකම්ය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: හදීස් කුද්සිය සඳහා උදාහරණ දෙකක් හදීස් ග්‍රන්ථවලින් තෝරා ලියන්න.**

**කණ්ඩායම 2: හදීස් කුද්සිය සහ අල්කුර්ආනය අතර වෙනස්කම් හතරක් සාකච්ඡා කර ලියන්න.**

**කණ්ඩායම 3: හදීස් කුද්සිය සඳහා උදාහරණ කිහිපයක් සොයා බලා අදහස සමග ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: හදීස් කුද්සි හා හදීස් නබවි අතර වෙනස්කම් දෙමව්පියන් සමග සාකච්ඡා කර ලියන්න. ඒවායින් එක් හදීසය බැගින් වනපොත් කිරීමට යොමු වන්න.**

**නිපුණතාව 4.0 : ඉස්ලාමයේ මූලාශ්‍ර ගැන පැහැදිලි අවබෝධයක් ලැබ ඒ අනුව තම ජීවිතය සකස් කර ගනියි.**

**නිපුණතා මට්ටම 4.4 : මව්ලූඋ බිහිවීමට අදාළ හේතු දැන ඒවා භාවිතයෙන් වැළකී කටයුතු කරයි.**

**ඉගෙනුම් පල :**

- **මව්ලූඋ යන්නෙහි අදහස ඉදිරිපත් කරයි.**
- **මව්ලූඋ බිහිවීමට හේතු ගෙනහැර දක්වයි.**
- **මව්ලූඋ හදීස් සඳහා උදාහරණ කියා දක්වයි.**
- **ඒවයේ නරක ආනිශංස ගෙනහැර දක්වා ඒවා ගැන සාකච්ඡා කිරීමෙහි හා ඇසීම සම්බන්ධයෙන් පරිස්සමින් කටයුතු කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- කවුරුන් හිතට පටහැනිව මා කෙරෙහි අසත්‍ය කරුණු ගොතා පවසන්නේ ද ඔහුගේ නවාතැන නිරය වන්නේ ය.(මුස්ලිම්)
- අසත්‍ය බව දැන දැන මාගේ නමින් අසත්‍ය ප්‍රවෘත්ති පතුරවන්නා මහා බොරු කාරයා වන්නේ ය.(මුස්ලිම්)
- ඉහත සඳහන් හදීස් දෙක බ්‍රිස්ටල් පුවරුවල ලියා ඒ පිළිබඳව සිසුන්ගේ අදහස විමසා පාඩමට ප්‍රවේශ වන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- හදීස් යන නමින් ගොතන ලද අසත්‍ය හදීස් ද ඇත.
- හදීස් කේෂත්‍රයේ විද්වතුන් හදීස් වෙන්කොට වර්ග කර දක්වා ඇත.
- හදීස් යන නමින් ගොතන ලද හදීස් මව්ලූඋ නමින් හැඳින්වේ.
- හදීස් ගෙතූ අය විවිධ හේතු නිසා විවිධ ක්ෂේත්‍රවලට අදාළව හදීස් මෙසේ ගොතා දක්වා ඇත.
- හදීස් ක්ෂේත්‍රයේ විද්වතුන් මව්ලූඋ තෝරා බේරා හඳුනාගෙන ඒවායේ ලක්ෂණ දක්වා ඇත.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ක්‍රියාකාරකම් පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.

- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.

- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද, අවස්ථාව ලබා දෙන්න.

- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.

- මව්ලූඋ යන අරාබි පදයේ තේරුම ගොතනලද ඒවා යන්නය. නැතහොත් පරිකල්පිත යන්නය. එහි බහුවචනය මව්ලූඋආත් යන්නය.

- නබි සල් තුමාගේ නමින් ගොතා පතුරුවන ලද තොරතුරු මෙමගින් දැක්වෙන්නේය.

- ඉතිහාසයේ මව්ලූඋආත් බිහිවීමට හේතු වූ විවිධ හේතු පාදක විය.

- උදාඃ දේශපාලන, වෙළඳාම්, මද්හබ් මාමකත්වය, සතුරු කුමන්ත්‍රණ, වැරදි දේව භක්තිය, ආත්මාර්ථකාමීත්වය.

- විද්වතුන් විසින් හඳුනා ගන්නා ලද මව්ලූඋාත්

  1. මුආවියා මිම්බරයේ දුටුවේ නම් ඝාතනය කරන්න.

  2. වම්බටු සියලු රෝගවලටම නිවාරණය වන්නේ ය.

  3. මගේ උම්මතයේ ඉද්රිස් යන අයකු බිහිවන්නේ ය. ඔහු ඉබ්ලීසයටත් වඩා නපුරු අයකි.

  4. අල්ලාහ් පැතූ අය හැර මගෙන් පසු වෙනත් නබිවරයෙකු නැත.

  5. මුහම්මද් යන නම ඇති කෙනා නිරයට යන්නේ නැත.

- මවුලූආත් ගැන කීමත් ඒවා පදනම් කරගෙන අමල් කිරීමත් වළක්වන ලද ඒවාය.

- නබි සල් තුමාගේ නමින් ගොතා කීම මහා පාපයකි.

- මව්ලූඋආත් ගෙන හැර දක්වන්නා මහා පාපියෙකි යන අදහස සමහර විද්වතුන් විසින් ද, ඔහු කාෆිර් යැයි තවත් සමහර විද්වතුන් ද, එවැනි අයකුට ස්වර්ගය වළක්වන ලද්දක් යන අදහසත් දක්වා ඇත.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කරගන්න.

**කණ්ඩායම් ක්‍රියාකාරකම්ය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: හදීස් යන පදයත් මව්ලූඋආත් යන පදයත් පැහැදිලි කර ඒවා දෙක අතර පවතින වෙනස්කම් හතරක් සාකච්ඡා කර ලියන්න.**

**කණ්ඩායම 2: අප ලද පෙර දැනුම පදනම් කරගෙන මව්ලූඋ බිහිවීමට හේතු දක්වන්න.**

**කණ්ඩායම 3: අද සමාජයේ හදීස් යන නමින් ඇති ගොතා පතුරවා ඇති මව්ලූඋආත් අතරින් ඔබ අසා ඇති උදාහරණ දෙකක් ලියන්න.**

**කණ්ඩායම 4: මව්ලූඋආත් ගැන පැවසීම නිසා සමාජයේ ඇති වන්නා වූ නරක බලපෑම් සාකච්ඡා කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: හදීස් යන නමින් පතුරවා හැර ඇති ව්‍යාජ හදීස් සමහරකට උදාහරණ දෙමව්පියන් සමග සාකච්ඡා කර ලියන්න.**

**නිපුණතාව** 5.0 : **නබිවරුන්, සහාබාවරුන්, පෙරසිටි යහගැත්තැන් ආදින්ගේ ජීවන ක්‍රමය උගෙන ඔවුන්ගේ ආදර්ශය අනුව ජීවත් වෙති.**

**නිපුණතා මට්ටම** 5.1 : **නබි මුහම්මද් සල් තුමාගේ ජීවිතයේ සිදු වූ සිද්ධීන් සමහරක් ගැන ගෙන දක්වයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- මුහම්මද් සල් තුමාගේ ජීවිතයේ සිදු වූ වැදගත් සිද්ධීන් සමහරක් ගැන ගෙන හැර දක්වයි.
- එතුමන්ට නුබුව්වතය ලැබුණු ආකාරය ගැන පවසයි.
- මිහ්රාජ් සිද්ධිය විස්තර කර කියයි.

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- අලංකාර ලෙස පාරායනය කළ හැකි සිසුන් දෙදෙනකු ලවා පහත සඳහන් ආයත පාරායනය කිරිමට සලස්වා එහි පරිවර්තන ලබා දෙන්න.
- නබිතුමනි සියල්ල මැවූ ඔබගේ හිමියාගේ නාමයෙන් උසුරනු මැනැව. ඔහුය මිනිසා ලේ කැටියෙන් මැව්වේ. නබි තුමනි පසුව උසුරන්න ඔබගේ දෙවියන් අතිමහත් දානපතියාය. ඔහු ය පන්හිඳ භාවිත කර ඔබට (ලිවීමට) ඉගැන්වූයේ. තව ද එමගින් මිනිසා නොදන්නා බොහෝ දේ ඔහුට ඉගෙන්වූයේ ය. (96:1 - 5)
- ඉහත සඳහන් වචනවල තේරුම ගැන සාකච්ඡා කරන්න.
- පහත කරුණු පාදක කොට සාකච්ඡා කරන්න.
- නබිත්වයට පෙරම නබි සල් තුමා හිරාහි නැවතී සිටීම.
- හතලිස්වන වියේ දී ප්‍රථම වහී පහළවීම.
- කදීජා රළි තුමියට කීම සහ පසුව වරකා බින් නව්ෆල් වෙත ගොස් එය සහතික කර ගැනීම.
- රහස් සහ එළිපිට ප්‍රචාරක කටයුතු කිරීම.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

පියවර 3 :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡා ව මෙහෙයවන්න.
- නබි සල් තුමාගේ ජීවිතයේ සමහර වැදගත් සිද්ධින් සිදුව ඇත.
- ඒවායින් සමහරක් වැදගත් හැරවුම් ලක්ෂ වූයේ ය.
- නුබුව්වතය ලැබී එය ප්‍රසිද්ධ කළ විට විවිධ අභියෝගවලට මුහුණ දුන්හ.
- අභියෝගවලට මුහුණ දීම සඳහා විවිධ ක්‍රම යොදා ගත්හ.(ඉවසා සිටීම හෝ ජිහාදය)
- තමා සහ සහබාවරුන් වෙහෙස නොබලා ප්‍රචාරක කටයුතුවල යෙදුණහ.
- මෙම කාල වකවානුවෙහි සිදු වූ මිහ්රාජ් සිද්ධිය නබි සල් ඔවුනට සැනසිලි බස් සහ සහායක් දැක්වූහ.
- මිහ්රාජය මගින් විවිධඅත්දැකීම් ලබා ගත් අතර සතුරන්ගේ කට වැසී යන අයුරින් කටයුතු කළහී
- මිහ්රාජ් අවස්ථාවේ දී පස්වේල් සලාතය අනිවාර්ය යුතුකම කරන ලදි.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයිම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් එල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණයක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: නබි සල් තුමාට නුබුව්වතය ලැබුණු පසුබිම ගෙන හැර දක්වන්න.**

**කණ්ඩායම 2: ප්‍රචාරය කරන අවස්ථාවේ දී නබි සල් තුමා මුහුණ දුන් අභියෝග ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 3: ප්‍රචාරය ඉදිරියට ගෙන යෑමට නබි සල් තුමා අනුගමනය කළ ක්‍රමවේදයන් ගෙන හැර දක්වන්න.**

**කණ්ඩායම 4: මිහ්රාජ් සිද්ධිය කෙටියෙන් ලියා දක්වන්න.**

**කණ්ඩායම 5: මිහ්රාජ්හි වැදගත්කම ගෙන හැර දක්වන්න.**

**නිවසේ පරිසරයෙන්:**

**මිහ්රාජ් සිද්ධිය ගැන අමතර තොරතුරු අසා ලියා ගෙන ඒමට යොමු කරන්න.**

**නිපුණතාව** 5.0 : **නබිවරුනි සහාබාවරුනි පෙරසිටි යහගැත්තැන් ආදීන්ගේ ජීවන ක්‍රමය උගෙන ඔවුන්ගේ ආදර්ශය අනුව ජීවත් වෙති.**

**නිපුණතා මට්ටම** 5.2 : **නබි මුහම්මද් සල් තුමාගේ දඃවා අනුගමනය කිරීම අනුව තම ජීවිතරය දීම ජීවිතයේ සිදූ වූ සිද්ධීන් සමහරක් ගැන ගෙන දක්වයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- **නබි සල් තුමාගේ දඃවා ප්‍රවේශය පහදා දෙයි.**
- **දඃවා හි එතුමා මුහුණ දුන් අභියෝගය ලැයිස්තු ගත කරයි.**
- **නබි සල් තුමා අභියෝග මුහුණ දුන් ආකාරය අවබෝධ කොට ගෙන ඒවා පූර්වාදර්ශය ලෙස ගනියි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- පහත සඳහන් සිද්ධිය කියවීමට සලස්වන්න නැතහොත් කියවා පෙන්වන්න.
- ආයිෂා රළියල්ලාහු තුමා මෙසේ පවසූහ. මගේ මිතුරන් කවරකු හෝ අද රාත්‍රියේ මා හමුවිය යුතු යැයි නබි සල් තුමා පසතැවිලි වෙමින් පසුවූහ. සුළු වේලාවකින් ආයුධ හඬක් ඇසුණි. එවිට එතුමා එය කවුරුන් දැයි ඇසූහ. එවිට තමා මම සඅත් ඉබ්නු අබීවක්කාෆ් යැයි පිළිතුර ලැබුණි. පැමිණි කාරණ අසන ලදි. නබි සල් තුමාට කිසියම් අනතුරක් සිදුවේ යැයි බියක් ඇති වූ නිසා ආරක්ෂාව සැලස්වීමට පැමිණියෙමි. පිළිතුර ලැබුණි. මෙය කන වැටුණු නබි සල් තුමා සඅත් ඉබ්නු (රළි) තුමා වෙනුවෙන් ප්‍රාර්ථනා කළහ.
- ඉහත කරුණු සම්බන්ධ සිසුන්ගේ අදහස් විමසා ලබා ගන්නී
- පහත සඳහන් කරුණු කේන්ද්‍රගත කොට සාකච්ඡා පවත්වන්න
- නබිත්වය ලැබුණු දවසේ පටන් නබි තුමා විවිධ ආකාරයේ අභියෝගවලට මුහුණ දුන්හ.
- එය මක්කා ජීවිත කාලයේ මෙන්ම මදීනා ජීවිත කාලයේ ද සිදුවිය.
- ඒවා ශාරීරික වශයෙන් ද මානසික වශයෙන් ද පවුල ලෙසින් ද සමාජ විද්‍යාත්මක වශයෙන් ද බලපෑම් ඇති කළේ ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡා කර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.

- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡා ව මෙහෙයවන්න
- සියලු නබිවරු දහ්වා ඉදිරි පත් කළ අවස්ථාවේ විවිධ අභියෝගවලට මුහුණ දුන්හ.
- ප්‍රථම ප්‍රචාරය සෆාක් කඳුගැටය මත සිදුවූ අවස්ථාවේ කුරෂිවරුන් අපවාද කීහ.
- අබූ ලහබ් නායකත්වය යටතේ විරුද්ධ ප්‍රතිචාර කණ්ඩායම ක්‍රියාත්මක විය.
- ධනය, බලය හෝ කාන්තාවන් ලබා දීමේ වැයම අසාර්තක විය.
- නබි සල් තුමා ශාරිරික වශයෙන් හිංසා පීඩාවට පත්වූහ.
- බනූ හාෂිම්, බනූ මුත්තලිෆ්වරු සමාජයේ වාරණයට පත් කරනු ලැබූහ.
- මුස්ලිම්වරු විවිධ ආකාරයේ හිංසා පීඩාවට පත්කරනු ලැබූ අතර ඔවුන් තම ගම්බිම් හැර දමා යෑමේ බලපෑමට ද ලක්කරනු ලැබූ හ.
- නබි සල්තුමා ඝාතනය කිරීමේ වැයම් විවිධ ආකාරයෙන් සිදු කරන ලදි.

**ගුණාත්මක යෙදවුම්:** පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයිම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයිම සඳහා සුදුසු ඇගයිම් නිර්ණයක සකස් කර ගන්න

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: පළමු ප්‍රචාරයෙන් පසුව නබි සල් තුමාට විරුද්ධව සිදුවූ අභියෝග කාල වකනවානුවට අනුව ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 2: නබි සල් තුමාගේ තායිෆ් ගමනට හේතු වූ කරුණු ද එහි පරාජයට හේතු වූ කරුණු ද ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 3: නබි සල් තුමා මදීනා හිජ්රත් අවස්ථාවේ මුහුණු දුන් ගැටලු ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 4: නබි සල් තුමාගේ මදීනා ජීවිතයට ඇති වු අභියෝග ලැයිස්තු ගත කරන්න.**

**නිවසේ පරිසරයෙන්: දෙමව්පියන්ගේ මගපෙන්වීම යටතේ දාඊ වරයකු හමුව ඔහු මුහුණ දුන් අභියෝග අසා දැන ලියා දක්වන්න.**

**නිපුණතාව 5.0 : නබිවරුන්, සහාබාවරුන්, පෙරසිටි යහගැත්තන් ආදීන්ගේ ජීවන ක්‍රමය උගෙන ඔවුන්ගේ ආදර්ශය අනුව ජීවත් වෙති.**

**නිපුණතා මට්ටම 5.2.2.: උම්මහාතුල් මු:මිනින්වරුන්ගේ ද සහාබාවරුන්ගේ ද ජීවිත කතාව ඉගෙන පූර්වාදර්ශ වශයෙන් සළකා ක්‍රියා කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **උම්මහාතුල් මු:මිනින්වරුන් වන ෂව්දා රළි, ජුවයිරියා රළි, සෆිය්යා රළි ආදින්ගේ ජීවිත රටාව විස්තර කරයි.**
- **ඔවුන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා ගෙන හැර දක්වයි.**
- **ඔවුන්ගේ පූර්වාදර්ශ අනුගමනය කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- පහත සඳහන් ඡේදය සිසුවකු ලවා කියවීමට සළස්වන්න.

  කාන්තාවක් නිදමින් සිටියාය. හඳ පැමිණ තමන්ගේ උකුලේ නැවතුණ බව සිහිනයකින් දුටුවාය. ඇය මෙය තම සැමියා සෆ්‍රාන් වෙත පැවැසුවා ය. ඔහු මා මළ පසු ඔබ නබි සල් තුමා විවාහ කර ගන්නවා ඇතය. කියා කීවේ ය. මාස කිහිපයකින් පසුව සැමියා මළේ ය. සැමියා මළ දුකෙන් ඇය පසුවූවාය. මෙය ඇගේ මිතුරිය කල්ලා දැන ගත්තාය. කල්ලා තම මිතුරිය සැනසුවා ය. මෙම අවස්ථාවේ නබි (සල්) තුමා තම බිරිද කතීජාගේ වියෝව නිසා දැඩි දුකින් පසුවූහ. එම නිසා ඒ දෙදෙනා විවාහ බන්ධනයෙන් එක් කරන්නට කල්ලා වෑයම් කළා ය. දෙදෙනාම කැමැති වූ හෙයින් නබි (සල්) තුමා සහ එම කාන්තාව අතර විවාහ ගිවුසුම සිදු කෙරිණි.

  එම කාන්තාව සව්දා මව් තුමියයි.

- පහත සඳහන් කරුණු කේන්ද්‍රගත කොට සාකච්ඡා පවත්වන්න.
- නබි සල් තුමාට එකකට වඩා වැඩි බිරින්දෑවරු සිටියහ.
- ඒ සඳහා අල්ලාහ් එතුමන්ට විශේෂ අවසරයක් දී තිබුණි.
- එතුමා මෙම විවාහ සිදු කළේ විවිධ හේතු මුල් කර ගෙනය.
- ඔවුනතරින් ආයිෂා රළි තුමිය හැර අනික් අය වැන්දඹුවන් ය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡා කර අදහස් මතු කිරීමට යොමු කරන්න.

- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද, පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡා ව මෙහෙයවන්න.
- සව්දා රළි තුමිය කුරයිෂිවරුන්ගේ නජ්ජාර් ගොත්‍රයට අයත් කෙනෙකි.
- එතුමියගේ සැමියා මළ පසු ඇගේ මිතුරිය කල්ලා මාර්ගයෙන් නබි සල් තුමා සමග විවාහ කර තබනු ලැබුවා ය.
- ජුවයිරියා උසස් පවුලක උපන් ධනය හා බලය ඇති කාන්තාවකි.
- මෙතුමියගේ පළමු සැමියා සඃෆාන් බින් සෆ්ෆාන් ය.
- ඔහු බනි මුස්තලික් යන සටනේ දි අත්අඩංගුවට ගනු ලැබ තාබිත් බින් කයිස් යන අයගේ වහළියක බවට පත්වූවාය.
- මෙය ගැන නබි සල් තුමා වෙත පැමිණිලි කළ අවස්ථාවේ දී නබි සල් තුමා ඇය නිදහස් කරගෙන ඇගේ කැමැත්ත ඇතිව විවාහ කර ගත්හ.
- සෆිය්යා බනූ කුරයිලා ගෝත්‍රයේ නායකයා වූ හුයයි යන අයගේ දයණියයි.
- ඇයගේ පළමු සැමියා වූ සලාම් බින් මෂ්කම් කයිබර් යුද්ධයේ දී මළේ ය.
- සෆිය්යා සිරකාරියක වශයෙන් අත් අඩංගුවට පත්ව තහිය්යාගේ වහළියක වශයෙන් පත් වූවාය.
- නායකයකුගේ දුවක් වහළියක් වශයෙන් සිටීමට අකැමැති වූ මුස්ලිම්වරුන්ගේ ඉල්ලීම පරිදි නබි සල් තුමා ඇය (සෆිය්යා තුමිය) නිදහස් කරගෙන විවාහ කර ගත්හ.
- මේ සියල්ලන් සතුව කාන්තාවන් සඳහා පූර්වාදර්ශයන් විය.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: සව්දා මව්තුමිය, ජුවයිරියා මව්තුමිය සහ සෆිය්යා මව්තුමිය යනාදින්ගේ ජීවිත කතාව කෙටියෙන් පැහැදිලි කරන්න.**

**කණ්ඩායම 2: සව්දා මව්තුමිය, ජුවයිරියා මව්තුමිය සහ සෆිය්යා මව්තුමිය යනාදීන් විවාහ කරගත්, පසුබිමත්, හේතුත් ගෙනහැර දක්වන්න.**

**කණ්ඩායම 3: තිදෙනා සතුව තිබුණු පූර්වාදර්ශ ලක්ෂණ ගෙන හැර දක්වන්න.**

**නිවසේ පරිසරයෙන්: සව්දා මව්තුමිය, ජුවයිරියා මව්තුමිය සහ සෆිය්යා මව්තුමිය යනාදින්ගේ ජීවිත කතාව පිළිබඳව දෙමව්පියන් සමග සාකච්ඡාකර ඔවුන් විසින් කියනු ලබන කරුණු ගොනුකර ලිවීමට යොමු කරන්න.**

**නිපුණතාව 5.0 : නබිවරුන්, සහාබාවරුන්, පෙරසිටි යහගැත්තන්, ආදීන්ගේ ජීවන ක්‍රමය උගෙන ඔවුන්ගේ ආදර්ශය අනුව ජීවත් වෙති.**

**නිපුණතා මට්ටම 5.2.3.: උම්මහාතුල් මුඃමිනින්වරුන්ගේ ද සහාබාවරුන්ගේ ද ජීවිත කතාව ඉගෙන පූර්වාදර්ශ වශයෙන් සළකා ක්‍රියා කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **උබාදලා යනුවෙන් හඳුන්වනු ලබන ඉබ්නු අබ්බාස් (රළි) ඉබ්නු උමර් (රළි), ඉබ්නු සුබයිර් (රළි), ඉබ්නු මස්උඃත් (රළි) ආදීන්ගේ ජීවිත කතාව ගෙන හැර දක්වයි.**
- **ඔවුන්ගේ සුවිශේෂත්වය පහදා දෙයි.**
- **ඔවුන්ගේ පූර්වාදර්ශ අනුගමනය කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- පහත සඳහන් සිද්ධිය සිසුවකු ලවා කියවීමට සළස්වන්න.

වරක් (නබි) සල්තුමා සහ අබූබක්කර් (රළි) තුමා සමග කාන්තාරයේ යමින් සිටියෝය.

ඔවුනට දැඩි පිපාසාවක් ඇති විය. එම අවස්ථාවේ දී උක්බා බින් මුරාද් යන අයගේ එළු රැළ ළමයකු විසින් දක්කාගෙන එන ලදී. ළමයාට ළංවූ ඔවුන් තමනට කිරි ස්වල්පයක් දී තම පිපාසාව සංසිඳවන ලෙස ඉල්ලා සිටියහ. මේවා මගේ නොවේ. එම නිසා මගේ ස්වාමියාගේ අවසරයක් නොමැති ව කිරි දිය නොහැකි ය. එසේ අන් අයගේ බාරකාරත්වය රකින ළමායගේ යහගුණ ය දැක සතුටුව මම එළු පැටියකුගෙන් කිරි දොවා ගන්න දැයි නබිතුමා ඇසූහ. හැකි නම් දොවා ගන්න යැයි ළමයා පැවැසූ විට එළුවාගේ බුරුළ තම අතින් අත ගෑ නබිතුමා යමක් උසුරමින් බුරුළ සෝදා කිරි දොවා ගෙන බී තම පිපාසය සංසිඳවා ගත්හ. පුදුමයට පත් ළමයා තමාටද ඒ මන්ත්‍රය කියා දෙන මෙන් ඉල්ලා සිටියේ ය. ඔබ ඉගෙන ගන්නවා පමණක් නොව ලෝකයාට ද උගන්වා දෙන බව ඒ ළමයාට ශුභ පැතු හ. ඉස්ලාමය වැළඳ ගෙන නබි තුමාගේ ආසන්න ම මිතුරා බවට පත් ඒ ළමයා අබ්දුල්ලාහ් බින් මස්උඃද් (රළි) වශයෙන් ප්‍රසිද්ධියට පත් වූයේ ය.

- පහත සඳහන් කරුණු කේන්ද්‍රගත කොට සාකච්ඡා පවත්වන්න.
- නබි සහාබාවරු අතර අපාදිල්වරු යැයි හඳුන්වනු ලැබූ හතර දෙනෙකු වූහ.
- මෙම අය සතුව අන් සහාබාවරුනට වඩා වෙනස් ගති ලක්ෂණ දක්නට ලැබුණි. ඔවුන් ඉබ්නු මස්උඃද් (රළි), ඉබ්නු අබ්බාස් (රළි), ඉබ්නු උමර් (රළි), ඉබ්නු සුබයිර් (රළි) වූහ.
- අන් සහාබාවරුනට වඩා සුවිශේෂවූ ගතිගුණ ඔවුන් සතු වූයේ ය.

- ඔවුන් නබි සල් තුමා විසින් ප්‍රශංසා කරනු ලැබ ඇත.
- ඔවුන් ඉස්ලාමයේ වර්ධනයට විවිධ කැප කිරීම් කළහ.
- සුවිශේෂ පූර්වාදර්ශයන් මොවුන් සතු විය.
- **පියවර 2** :
- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡා කර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර් ගත කොට සාකච්ඡා ව මෙහෙයවන්න.
- ඉබ්නු මස්ඌද් (රළි) නුබුව්වතය ලැබුණු අවස්ථාවේ ද, ඉබ්නු උමර් (රළි) හජ්රි වසර 2 හි ද, ඉබ්නු අබ්බාස් රළි හජ්රි 3 හි ද, ඉබ්නු සුබයිර් (රළි) හජ්රි 2 හිද උපත ලදහ.
- ඉබ්නු මස්ඌද් (රළි) හජ්රි 72 හි ද, ඉබ්නු උමර් (රළි) හිජ්රි වසර 72 හි ද, ඉබ්නු අබ්බාස් (රළි) හිජ්රි 68 හි ද, ඉබ්නු සුබයිර් (රළි) හිජ්රි 73 හි ද වෆාත් වූහ.
- ඉබ්නු මස්ඌද් (රළි), උම්මු මස්ඌද් - අබ්ද් යන දෙමව්පියනට ද, ඉබ්නු උමර් (රළි) උමර් - සයිනබ් දෙමව්පියනට ද, ඉබ්නු අබ්බාස් (රළි) උම්මු - ෆල්ල් යන දෙමව්පියනට ද, ඉබ්නු සුබයිර් රළි සුබයිර් - අස්මා දෙමව්පියනට ද දාව උපත ලදහ.
- ඉබ්නු මස්ඌද් (රළි) අල්කුර්ආන් - ෆික්හ් යන ක්ෂේත්‍රවල ද, ඉබ්නු උමර් (රළි) කුර්ආන්, හදීස් සහ තෆ්සීර් යන ක්ෂේත්‍රවල ද, ඉබ්නු අබ්බාස් (රළි) තෆ්සීර් ක්ෂේත්‍රයේ ද, නිපුණයන් වූ අතර හදීස්, ෆික්හ්, ඉතිහාසය සාහිත්‍යය යන ක්ෂේත්‍රවල ද නිපුණයන් වූ හ.
- ඉබ්නු සුබයිර් දේශපාලනය කෙරෙහි වැඩි අවධානය යොමු කළ අයකි. ටික කලක් කලීෆාවරයා ලෙස ද කටයුතු කළේ ය. ඉබ්නු උමර් දේශපාලනයෙන් ඈත් ව සිටි අතර ඉතරි දෙදෙනා සමතත්වය රැක ගත් හ.
- පොදුවේ මේ හතර දෙනාම ආගමික අධ්‍යාපනය කෙරෙහි අධික උවමානවෙන් පසු වූහ.

- මෙම හතර දෙනාම සතුව ඊමානිය ශක්තිය, දැනුම, පරිණතිය, ආගමික බැඳීම, ධෛර්යය. වීරත්වය, සරළ බව, දැඩිව වෙහෙස වීම, දේව භක්තිය සහ චිත්ත පාලනය දක්නට තිබුණි.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: ඉබ්නු අබ්බාස් (රළි) තුමා පිළිබඳ රචනයක් ලියන්න.**

**කණ්ඩායම 2: ඉබ්නු මස්ඌද් (රළි) කේන්ද්‍රකොට දෙබසක් ලියන්න.**

**කණ්ඩායම 3: ඉබ්නු උමර් (රළි) ගැන දේශනයක් සකස් කරන්න.**

**කණ්ඩායම 4: ඉබ්නු සුබයිර් පිළිබඳව ඔබගේ මිතුරකුට ලිපියක් ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: ඉහත සහබා වරයකු ගැන හා එතුමන්ගේ පූර්වාදර්ශ ගැන දෙමව්පියන් සමග සාකච්ඡා කර ලියා ගෙන ඒමට යොමු කරන්න.**

**නිපුණතාව** 5.0 : **නබිවරුන්, සහාබාවරුන්, පෙර සිටි යහගැත්තැන්, ආදීන්ගේ ජීවන ක්‍රමය උගෙන ඔවුන්ගේ ආදර්ශය අනුව ජීවත් වෙති.**

**නිපුණතා මට්ටම** 5.3. : **ඉබ්රාහීම් (අලයි) තුමාගේ ජීවිතය පූර්වාදර්ශය වශයෙන් වටහා ගෙන ජීවිතය සකස් කර ගනියි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් පල** :

- **නබි ඉබ්රාහීම් (අලයි) තුමා හඳුන්වා දෙයි.**
- **එතුමා සතුව පැවැති සුවිශේෂ ගුණාංග පෙන්වා දෙයි.**
- **එතුමාට සහ නබි සල් තුමාට අතර පැවැති සම්බන්ධය මක්කම සමග අතර පැවැති සම්බන්ධය ගෙන හැර දක්වයි.**
- **එතුමන්ගේ දඃවා කටයුතුවල දී විඳි වේදනාව සහ මුහුණ දුන් ප්‍රශ්න ගැන දැන එතුමන්ගේ පූර්වාදර්ශය අනුගමනය කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- දෙවියනි අපගේ නායක මුහම්මද් සල් තුමා කෙරෙහි ද එතුමන්ගේ පවුලේ අය කෙරෙහි ද අපගේ නායක ඉබ්රාහීම් අලයි සහ එතුමන්ගේ පවුලේ අය කෙරෙහි සලවාත් පැවසුවාක් මෙන් සලවාත් පවසනු මැනවි. අපගේ නායකයානන් වූ ඉබ්රාහීම් (අලයි) කෙරෙහි හා එතුමන්ගේ පවුලේ අය කෙරෙහි බරකතය ලබා දුන්නාක් මෙන් අපගේ නායකයානන් වන මුහම්මද් (සල්) අලයි තුමා කෙරෙහි ද, එතුමන්ගේ පවුලේ අය කෙරෙහි ද, බරකතය ලබා දෙනු මැනැවි. යන සලවාත් ඉබ්රාහීම්යියාව ආදර්ශණය කර පැහැදිලිව ආදර්ශණය කළ හැකි සිසුවකු ලවා ඉබ්රාහීම් (අලයි) පහත සඳහන් සිද්ධිය සිසුවකු ලවා කියවීමට සළස්වන්න.
- එය ගැන සිසුන් සමග අදහස් හුවමාරු කරගන්න.
- පහත සඳහන් කරුණු කේන්ද්‍රගත කොට සාකච්ඡා පවත්වන්න.
- ක්‍රි.පූ. 2000 දී පමණ ඉරාකය නම්රූද් යන රජ විසින් පාලනය කෙරුණි. එම රටෙහි අගනුවර උර් නම් වූයේ ය.
- රජතුමා සහ සමාජය ෂිර්ක් හි ගිලී සිටියෝ ය. එරටේ පූසාරිවරු අතර ආසර් යන නමින් යුත් අයකු ද වූයේ ය.
- ඉබ්රාහීම් (අලයි) ඔහුගේ පුතා වූයේ ය. ඔහු එම ප්‍රජාවගේ සිතුවිල්ලට වෙනස් ව කටයුතු කළේ ය.
- එම නිසා ඉබ්රාහීම්ට විවිධ කම්කටොලුවලට මුහුණ දීමට සිදුවූයේ ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න. සාකච්ඡා කර අදහස් මතුකිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරිම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡා ව මෙහෙයවන්න.
- ඉබ්රාහිම් අලයි සතුව සුවිශේෂ වූ ගති ලක්ෂණ විය.
- කුඩා අවධියේ ම බුද්ධිමත් අයකු වූ අතර එදිනෙදා කටයුතු ගැන විවිධ ආකාරයේ ප්‍රශ්න කරන අයකු වූහ.
- පියා කෙරෙහි ලෙන්ගතු කමක් සහිත වුව ද, පියා කරන ෂිර්ක් වූ කටයුතු ගැන ප්‍රශ්න කරන අයකු වූයේ ය.
- එතුමා සතුව මෘදු හිතක් වූයේ ය. (අල්කුර්ආන් 11:75)
- එතුමා ෂිර්කයට විරුද්ධව පියා සමග ද රජතුමා සතුව ද, ජනතාව සමග ද, තර්කානුකුලව වාද කළහ. මෙනිසා ගිනි මැලයකට විසිකරනු ලැබූ හ. එහෙත් අල්ලාහ්ගේ දයාවෙන් එම ගින්නෙන් අනතුරක් සිදු නොවුයේ ය.
- එතුමා සහ මුහම්මද් (සල්) අතර පාරම්පරික සම්බන්ධයක් ද ප්‍රතිපත්තිමය සම්බන්ධයක් ද වූයේ ය.
- නබි (සල්) තුමා සතුව ද නබි ඉබ්රාහිම් (අලයි) සතුව ද අලංකාර පුර්වාදර්ශයන් තිබුණු බව අල්කුර්ආනය පවසන්නේ ය.
- දෙදෙනාම ජනතාව සමග ද, කෑබාව සමග ද, හජ් වන්දනා කටයුතු සමග ද, සම්බන්ධ අය වූ හ.
- දෙදෙනාම තව්හීදය ස්ථාපිත කිරිම සබ්න්ධයෙන් දැඩි ලෙස අවධානය යොමු කළ අතර ඒ නිසාම විවිධ තාඩන පීඩන වලට ලක්කරනු ලැබූ හ.

**ගුණාත්මක යෙදවුම්:**

- පොදු උපදෙස් පරිදි, ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

- ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: නබි ඉබ්රාහිම් (අලයි) ගේ තරුණ කාලයේ ක්‍රියාකාරකම් ගැන සාකච්ඡා කර එහි දක්නට ලැබෙන පූර්වාදර්ශ ගැන ලැයිස්තුවක් සකස් කරන්න. (2:226, 6:76-80, 9:114,11:75)**

**කණ්ඩායම 2: අල්කුර්ආන් (19:42 -48) යන වචනවල දක්නට ඇති අදහස් සහ දෙබස ආකාරයෙන් ලියා දක්වන්න.**

**කණ්ඩායම 3: නබි (සල්) තුමා අතර සහ නබි ඉබ්රාහිම් අතර ඇති පාරම්පරික සම්බන්ධතාවය ගෙන හැර දක්වන්න.**

**කණ්ඩායම 4: නබි ඉබ්රාහිම් (අලයි) හා මක්කාව අතර සම්බන්ධය (2:125 - 129, 14:35) ආදි වචනවල සහායෙන් ගෙන හැර දක්වන්න.**

**කණ්ඩායම 5: දඃවා කටයුතුවල දී නබි ඉබ්රාහිම් (අලයි) මුහුණ දුන් දුක් කරදර ගැන දන්වමින් මිතුරකුට ලියුමක් ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: නබි ඉබ්රාහිම් (අලයි) ගැන සාකච්ඡා කර එහි දක්නට ඇති අමතර තොරතුරු ලියාගෙන ඒමට යොමු කරන්න.**

**නිපුණතාව 6.0 : ඉපැයීම පිළිබඳ ඉස්ලාමීය ඉගැන්වීම් සහ පවුල් ජීවිතය පිළිබඳ ඉස්ලාමීය අදහස අවබෝධ කරගෙන ඒවා තම ජීවිතයේ පිළිවෙළින් අනුගමනය කරයි.**

**නිපුණතාමට්ටම 6.1: අජ්නබි, මහ්රම් පිළිබඳ සීමාවන් අනුගමනය කර කටයුතු කරයි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **අජ්නබි මහ්රම් යන්නෙහි තේරුම පැහැදිලි කරයි.**
- **සමාජයේඅජ්නබි මහ්රම් අතර වෙනස ඇතිවන්නේ කෙසේ ද යන්න පහදාදෙයි.**
- **අජ්නබි හා මහ්රම් යන අයගේ ලැයිස්තුවක් සකස් කරයි.**
- **විවාහ කර ගැනීම වුදූහ් බිදී ම වැනි අවස්ථාවල දී ඉස්ලාමීය සාරධර්ම සාධක සමග පවසයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- ඔබ පවුලේ සාමාජිකයන් ගැන ද ඔවුන් ආශ්‍රය කරන ආකාරය ද සිසුන්ගෙන් විමසන්න. පවුලේ සමාජිකයන් සමග එකම ආකාරයෙන් ඇසුරු කළ නොහැකි බවත් සඳහා වන සීමාවන් ඇති බවද මතු කරන ආකාරයෙන් සාකාච්ඡාවෙහි යෙදෙමින් පාඩමට පිවිසෙන්න.
- පහත සඳහන් කරුණ කේන්ද්‍ර කරගෙන සාකච්ඡාවෙහි යෙදෙන්න.
- ඉස්ලාම් පිරිමි හා කාන්තා ඥාතිත්වය අජ්නබි හා මහ්රම් වශයෙන් වෙන් කොට සලකයි.
- සියලුම අවස්ථාවල අජ්නබි සහ මහ්රම් සීමාවන් සැලැකිල්ලට ගත යුතුය. යන්න ඉස්ලාමීය මුලධර්මය වන්නේ ය.
- පෞද්ගලික හා පවුල් ජීවිතයේදී අජිනබි මහ්රම් සීමාවන් සැලකිල්ලට ගැනීමෙන් අනාචාරවලින් සමාජය බේරාගත හැකිවේ.
- අජ්නබි සහ මහ්රම් සීමාවන් සැලකිල්ලට අයහපත් පුරුදු පුහුණුවලින් පැහැදිලි මගපෙන්වීම් නබි සල් තුමාගේ ජීවිතයේ පැහැදිලි මගපෙන්වීම් ඇත.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සැම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.

- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත්කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබාදෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- අජ්නබි මහ්මරම් වර්ගීකරණය පිරිමින් කේන්ද්‍රකොට කරනු ලබන්නකි. පිරිමියකුට විවාහකර ගැනීම තහනම් අයකු මහ්රමියැයි ද විවාහකර ගැනීමට තහනම් නොවන අය අජ්නබියන්න ද සාමාන්‍ය වර්ගීකරණය වන්නේ ය.
- මහ්රම් යනු වළක්වනු ලැබූ අය හෙවත් ගරු කළ යුතු අය යන අදහස ගෙන දෙන්නේ ය.
- මව, මවගේ මව, පියාගේ මව, දුව, දුවගේ දුව, පුතාගේ දුව, තම සොයුරිය, සොයුරියගේ දුව, පියාගේ සොයුරියන්, මවගේ සොයුරියන් යන අය ස්ථිර මහ්රම්වරු ය.
- අජ්නබි යනු පිට අය යන අදහස ගෙන දෙන්නේ ය. අපගේ ඉතා කිට්ටු නෑයන්ගෙන් පරිබාහිර අයට අජ්නබියැයි හඳුන්වන්නේ ය. පිරිමියකු විවාහකර ගැනීමට සුදුසු අය මෙම වර්ගයට අයත් ය. මහ්රම් නොවන සියල්ලන්ම මෙම වර්ගයට අයත් ය. (විවාහ කර ගැනීමට තහනම් කරනු ලැබූ අය)
- විවාහ කර ගැනීමට තහනම් කරනු ලැබූ අය ස්ථිර වශයෙන් තහනම් කරනු ලැබූ අය, තාවකාලිකව තහනම් කරනු ලැබූ අය යනුවෙන් ආකාර දෙකකි. ලේනෑයන් විවාහක නෑකම් සහ කිරි බීමේ නෑකම වශයෙන් මහ්රම්වරු ඇතිවෙන බව අල්කුර්ආනය පවසන්නේ ය.
- පිරිමි හා කාන්තා සම්බන්ධතාව හැමවිට ම අජ්නබි මහ්රම් සීමාවන් සුරකින එකක් වියයුතු බව අල්කුර්ආනය අවධාරණය කරන්නේ ය. මිනිසාගේ සියලු කටයුතු අජ්නබි මහ්රම් සීමාව සුරකින අයුරින් වන විට විධිමත් සමාජයක් බිහිවන්නේ ය.
- මහ්රම් නොවන පිරිමියකුගේ හෝ කාන්තාවකගේ නෑකම සීමාසහිත වූවකි. එම නිසා එක්කෙනෙකු තව කෙනෙකුව බැලීම, කතාකිරීම එකට සම්බන්ධව සිටීම වැනි කටයුතු වළක්වා ගැනීමට හැකිවිය යුතු ය.

**ගුණාත්මක යෙදවුම්:**

පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: ස්ථිර හා තාවකාලිකමහ්රම්වරුන්ගේ ලැයිස්තුවක් සකස් කරන්න.**

**කණ්ඩායම 2: අජ්නබිවරු සමග සම්බන්ධය කෙසේ විය යුතු දැයි සාකච්ඡා කරන්න.**

**කණ්ඩායම 3: අජ්නබි වෙනස්කම් හා සීමාවන් පිළිපැදීම නිසා ලැබෙන ආනිශංස සාකච්ඡාකර ලැයිස්තු ගත කරන්න.**

**කණ්ඩායම 4: පොදු ජීවිතයේදී අජ්නබි සීමාවන් සළකා කටයුතු කිරීමේ පිළිවෙත් සාකච්ඡා කර ලියන්න.**

**නිවසේ පරිසරයෙන්: එක් එක් ශිෂ්‍යයාගේ පවුලේ සිටින මහ්රම්වරු ගැන තම දෙමව්පියන් සමග සාකච්ඡා කර ලැයිස්තු ගත කිරීමට යොමුවන්න.**

**නිපුණතාව** 7.0 : **එක් එක් කරුණ සම්බන්ධයෙන් ඉස්ලාමයට සුවිශේෂ වූ දෘෂ්ටියක් ඇති බව වටහා ගෙන ඒ අනුව සියල්ල දෙස බලා ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම** 7.1 : **සමාජ සේවා කටයුතුවලට සහභාගි වීමේ වැදගත්කම වටහාගෙන ඒ අනුව ඒවාට දායකවෙයි.**

**කාලච්ඡේද ගණන** : 2

**ඉගෙනුම් ප්‍රතිඵල** :

- **සමාජ සේවා කටයුතු යන්න වටහා දෙයි.**
- **සමාජසේවා කටයුතුවල වැදගත්කම පෙන්වා දෙයි.**
- **සමාජ සේවා කටයුතු සිදුකිරීමේ අවශ්‍යතාව අවධාරණය කර කථා කරයි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1** :

- පහත සිද්ධිය කියවීමට සලස්වන්න. නැතහොත් කියවා පෙන්වන්න.
- නබි (සල්) තුමා හිජ්රත් කර මදීනාවට පැමිණි අවසථාවේ දී මුස්ලිම්වරුන්ට ජල අවශ්‍යතාව වැඩිවිය. එය ඉඩෝර කාලයකි.

  මුස්ලිම්වරු ජලය ලබා ගැනීම සඳහා බෙහෙවින් කරදර වූහ. එම අවස්ථාවේ දී යුදෙව්වෙකුට අයත් ව තිබූ ''බිඃරු රූමා'' යන ළිඳ උස්මාන් රළි තුමා මිලට ගෙන මදිනා නගරයේ සිටි ජනතාව ප්‍රයෝජනයට ගන්නා ආකාරයේ එය කැප කළේ ය. මෙම ඓතිහිසික සිද්ධිය මතක් කර පාඩමට පිවිසෙන්න.

- පහත සඳහන් කරුණු කේන්ද්‍ර කරගෙන සාකච්ඡාවෙහි යෙදෙන්න.
- ප්‍රත්‍යුපාකාරයක් බලාපොරොත්තු නොවී ජනතාවගේ යහපතට තනිව හෝ ආයතනික වශයෙන් හෝ ඉටුකරනු ලබන සමාජ සුබසාධන වැඩ සටහන් සමාජ සේවාවන් ලෙස සළකනු ලබන්නේ ය.
- මුස්ලිම් ඉබාදතයන් සමග පමණක් තම කටයුතු සීමා කරගන්නේ නැතිව පුද්ගලික හා සමාජ යහපත උදෙසා ඒවා වැඩිදියුණු කරන සංවර්ධනය කරන කාර්යයන්හි යෙදීම වැදගත් වන්නේය. එම නිසා ලොව වැඩි දියුණු කරන (ඉමාරා) යන්න එක් මුස්ලිම්වරයකුගේ යුතුකමක් ලෙස ඉස්ලාම් සළකන්නේ ය.
- අයකුට අල්ලාහ් විසින් දායාද කරන ලද වස්තු දේපළ මුදල් කාලය දැනුම හැකියාව වැනි දායාදයන් භාවිත කර හෝ නැතහොත් මේවායින් යම් දායාදයක් වැය කර හෝ සමාජ සේවා කටයුතුවල යෙදිය හැකි ය.
- ඉස්ලාමීය දෘෂ්ටිය අනුව අයකු සතුව තිබිය යුතු උසස් ගුණාංගයක් වශයෙන් නාහිඋන් ලිකයිරිහි (අන් අයට ප්‍රයෝජනවත් ව ජීවත් වීම යන්න ය) සමාජ සේවා කටයුතුවල යෙදීම මගින් මෙවැනි ගුණාංගය වර්ධනය කර ගත හැකි ය.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- අන් අයට උදව් කිරීම, ඉගැන්වීම පස සරු කිරීම, පොදු දේපළ ආරක්ෂා කිරීම, ශ්‍රමදාන කටයුතුවල යෙදීම, පරිසර සංරක්ෂණය, පානීය ජල වැඩසටහන් ආදිය පොදු කටයුතු වන්නේ ය.
- අපට ලබා දී ඇති සියලුම දායාදයන් ගැන අල්ලාහ් කියාමාවේ දී අපගෙන් ප්‍රශ්න කරන්නේ ය. ඒ සමග මෙවැනි සේවාවන් මෙලොවෙහි සහ මතු කියාමාවෙහි ඉතා හොඳ කුසලයන් අපට ලබා දෙන්නේ ය. මෙය සදකතුල් ජාරියා නම් වන්නේ ය.
- අන් අයට උදව් කරන්න යහපත ඉටු කරන්න. සැබැවින් ම අන් අයට උදව් කරන්නන්ට අල්ලාහ් කැමැත්තේ ය. (3: 195)
- ඊමාන් ධාරීනි, ඔබ රුකූඋ කරන්න; සුජූද් කරන්න; ඔබගේ රක්ෂිතයාට ඉබාදත් කරන්න. යහපත් කාර්යයන්හි යෙදෙන්න. ඔබ ජය ලබන්නේ ය. (22:77)
- ඔබගෙන් කවරකුට තම සහෝදරයාට ප්‍රයෝජනවත් යමක් කළ හැකි වන්නේ ද ඔහු එය කරත්වා (මුස්ලිම්) යැයි නබි තුමා තවත් වරෙක කීහ. අන් අයට ප්‍රයෝජනවත් මිනිසා අල්ලාහ්ට ඉතාමත් කැමැති මිනිසා වන්නේ ය. (සහීහුල් ජාමිඉ)
- දෙදෙනකු අතර සාමය ඇති කිරීමත් ඉර නගින ඕනෑම දිනයක කුසලයකි. අයකුට වාහනයට නැගීමට උදව් කිරීමත්, ඔහුගේ බඩු බාහිරාදිය වාහනයට පටවා ගැනීමට උදව් කිරීමත් කුසලයකි. හොඳ වචන කතා කිරීමත් කුසලයකි. සලාතයට යෑම සඳහා ගන්නා වූ සෑම පියවරක්ම සදකාවකි. බාධාකාරී යමක් මාර්ගයෙන් ඉවත් කිරීමත් කුසලයකි. (මුස්ලිම්)

- මස්ජිදයේ මාසයක් ඉහ්තිකාෆ් සිටිනවාට වඩා සහෝදර මුස්ලිම්වරයකු වෙනුවෙන් ඔහුගේ කටයුත්තක් කර දීම සඳහා ගමනක් යෑම කුසලයක් වන්නේ ය. (මුස්ලිම්)

- අඩුම වශයෙන් මහ මාර්ගයේ ඇති ගල් මුල් ඉවත් කිරිමත් ඉස්ලාමීය දෘෂ්ටිය අනුව සමාජ සේවාවක් වන්නේ ය.

- සමාජ සේවාවන්හි යෙදෙන විට පාරිශුද්ධ වූ සිතකින් දේව බැති බියෙන් යුක්තව දෙවියන්ගේ තෘප්තිය, අවංකත්වය ආදිය සදාචාරාත්මක අගයයන් සළකමින් ක්‍රියා කිරීම වැදගත් වන්නේ ය.

**ගුණාත්මක යෙදවුම්:**

පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:**

**කණ්ඩායම 1: සාකච්ඡා කර සමාජ සේවාවල ලැයිස්තුවක් සකස් කරන්න.**

**කණ්ඩායම 2: සමාජ සේවාවන් මගින් ඇතිවන කුසලයන් කිහිපයක් ගොනු කර ලියන්න.**

**කණ්ඩායම 3: සමාජ සේවාවන්හි යෙදීම උනන්දු කරවන ඓතිහාසික සාධක හතරක් ගොනු කර ලියන්න.**

**කණ්ඩායම 4: සමාජ සේවා කටයුතුවල යෙදීම පොළඹවන ආකාරයේ ''බැනර'' හතරක් සකස් කරන්න.**

**නිවසේ පරිසරයෙන්: තම ප්‍රදේශයේ සමාජ සේවා කටයුතුවල යෙදෙන සංවිධාන කිහිපයක නම් හා ඒවයේ සේවාවන් ගැන දෙමව්පියන් සමග සාකච්ඡා කර ලියාගෙන ඒමට යොමු කරන්න.**

**නිපුණතාව 7.0 : එක් එක් කරුණ සම්බන්ධයෙන් ඉස්ලාමයට සුවිශේෂ වූ දෘෂ්ටියක් ඇති බව වටහා ගෙන ඒ අනුව සියල්ල දෙස බලා ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 7.2 : පොදු දේපළ සුරක්ෂිතව රකියි.**

**කාලච්ඡේද ගණන : 2**

**ඉගෙනුම් පල :**

- **පොදු දේපළක් යන්න අර්ථකථනය කරයි.**
- **පොදු දේපළ වර්ග කර දක්වයි.**
- **පොදු දේපළ සුරැකීම සැමගේම යුතුකමක් බව පිළිගනියි.**

**පාඩම සැලැසුම් සඳහා උපදෙස්**

**පියවර 1 :**

- පහත සිද්ධිය කියවීමට සලස්වන්න. නැතහොත් කියවා පෙන්වන්න.
- වරක් දෙවන කලීෆා වූ උමර් (රළි) තුමා රෝගිව සිටියහී එතුමාට බෙහෙත් සකස් කරගැනීම සඳහා මී පැණි අවශ්‍ය වූයේ ය. නොයෙක් තැන්වල සොයා බැලුව ද මී පැණි ලබා ගත නොහැකි විය. නගරයෙන් මිල දී ගැනීමට ද අවශ්‍ය තරම් සල්ලි තිබුණේ නැත. කලීෆා වරයා සලාත ඉටු කිරීමෙන් අනතුරුව තම අවශ්‍යතාව ජනතාවට දැනුම් දුන්නේ ය. බෛතුල් මාල්වලින් තම අවශ්‍යතාව උදෙසා මී පැණි ස්වල්පයක් ලබා ගැනීමට අවසර ඉල්ලා සිටියහ.
- මෙයට සවන් දුන් ජනයා තිගැස්සුණ හ. ඔවුන්ගේ සිත් උණු වී ගියේ ය.
- ඉහත සඳහන් කරුණු කේන්ද්‍ර කරගෙන සාකච්ඡාවෙහි යෙදෙන්න.
- ලෝකයේ මිනිසා සඳහා අල්ලාහ් ලබා දී ඇති දායාදයන් අතරින් පොදු දේපළ ද එකකි.
- සාමාන්‍යයෙන් දේපළ පොදු දේපළ සහ පෞද්ගලික දේපළ වශයෙන් වෙන් කොට දැක්විය හැකි ය. පොදු දේපළ යනු පොදු මහ ජනතාවගේ යහපත උදෙසා රජය හෝ ආයතන මගින් ඉදිකරන නැතහොත් ලැබෙන ජලය, ගංගා, වනාන්තර වැනි ඒවා ලෙස සඳහන් කළ හැකි ය.
- පොදු දේපළ භාවිතය සම්බන්ධ පිළිවෙළ ඉස්ලාම් පෙන්වා දී ඇත.
- පොදු දේපළ ආරක්ෂා කිරීම යහපත් කාර්යයකි. ඒ සමගම එය අපහරණය කිරීම පාපි ක්‍රියාවකි. එවැනි පාපි ක්‍රියාවල යෙදීම පොදු ජීවිතයේ හා සමාජ ජීවිතයේ බාධාකාරි ප්‍රතිඵල ගෙන දෙන්නේ ය.

**පියවර 2 :**

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදා සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකාවක් බැගින් ලබා දෙන්න.

- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර ස්ථිර කරන්න.
- සෑම කණ්ඩායක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවා මග පෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරිමට සුදානම් වන ලෙස දන්වන්න.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර කරුණු සහ පෝෂණය කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර විස්තරාත්මකව දැක්වීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට ද පසුව අනික් කණ්ඩායම්වලට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සාකච්ඡාව මෙහෙයවන්න.
- පුද්ගලයන් විසින් සහ කණ්ඩායම්වි සින් වක්ෆ් කරනු ලබන දේපළවල් සහ රජයට අයත් දේපළ පොදු දේපළ සනයේ ලා සැලකේ.
- පාසල්, මස්ජිද, රෝහල්, පොදු ළිං, පොදු යාන වාහන, මගතොට, පුස්තකාල, පොදු වැසිකිළි කැසිකිළි ආදිය, බස් නැවැතුම්පළවල්, පොදු සූසාන භූමි, උද්‍යාන, මුහුදු වෙරළ, වැව්, කැලෑ, ගංගා වැනි ඒවා අපගේ පරිසරයේ දක්නට ලැබෙන සමහර පොදු දේපළ වන්නේ ය.
- ජනතාවට අවශ්‍ය පොදු දේපළ පිහිටවීම ''සදකතුල් ජාරියාවට'' අයිති වන්නේ ය.
- ඔබ යහපත් කටයුතුවල දී එක් අයකු තවත් අයකුට අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර වන්න. (5:2)
- ''කවුරුන් රූමා'' ළිඳ මිලදී ගෙන පොදු අයිතියට දෙන්නේ ද ඔහුට ස්වර්ගය හිමි වන්නේ ය. රූමාවේ ළිඳ හාරා පිරිසිදු කරන්නාට ද ස්වර්ගය හිමිවන්නේ යැයි නබි තුමා පවසා ඇත.
- පොදු දේපළ යන්න එක් පරම්පරාවට පමණක් නොව අනිකුත් පරම්පරාවලට ද අයත්වන නිසා ඒවා සම්බන්ධයෙන් ජනතාව අවදි කිරීම යුතුකමකි.
- පොදු දේපළ පිහිටවීම, ඒවා සුරැකීම යනාදිය අතිමහත් සමාජ සේවාවක් යන්න. ඒවාට අල්ලාහ්ගේ තෘප්තිය සහ යහඵල ද අයත් වන්නේ ය. ජනතාවගේ ප්‍රාර්ථනාව ද හිමි වන්නේ ය. පොදු දේපළ අපහරණය කිරීම පාපි ක්‍රියාවකි.

**ගුණාත්මක යෙදවුම්:**

පොදු උපදෙස් පරිදි ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

ඉගෙනුම් ඵල ඇගැයීම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කර ගන්න.

කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස් පත්‍රිකාව:

කණ්ඩායම 1: පොදු දේපළ සුරැකීම හා සම්බන්ධව ඉස්ලාමීය ඉතිහාසයේ දක්නට ලැබෙන සිද්ධීන් දෙකක් ගොනු කර ලියන්න.

කණ්ඩායම 2: පොදු දේපළ සුරැකීමට අදාළ අවදි කරන ආකාරයේ අත් පත්‍රිකාවක් සකස් කරන්න.

කණ්ඩායම 3: ඔබගේ ප්‍රදේශයේ දක්නට ලැබෙන පොදු දේපළ ගැන ලැයිස්තු ගත කර ඒවා අපයෝජනයට ලක්වන ආකාරය සාකච්ඡා කර ලියන්න.

කණ්ඩායම 4: පාසල්වල දක්නට ලැබෙන පොදු දේපළ කිහිපයක් සඳහන් කර ඒවා වීධිමත්ව භාවිත කරන ආකාරය පිළිබඳව සිසුන් අවදි කිරීමට ''බැනර'' හතරක් සකස් කරන්න.

නිවසේ පරිසරයෙන්:

පොදු දේපළ අපහරණය කරනු ලැබෙන්නේ කෙසේ ද යන්න මතු කරන ඡායාරූප රැස්කිරීමට යොමු කරන්න.